# රේරුකානේ චන්දවිමල මහා නාහිමි

(චරිත කථාව)

සම්පාදක
ඉත්තෑපාන ධම්මාලංකාර හිමි

# රේරුකානේ චන්දවිමල මහා නාහිමි

## (චරිත කථාව)

සම්පාදක

ඉත්තෑපාන ධම්මාලංකාර අනුනාහිමි

දර්ශනවිශාරද (PhD)

# සම්පාදකගෙන් . . .



ප්‍රවචන විශාරද අතිගරු **රේරුකානේ චන්දවිමල** මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සියවෙනි ජන්ම දිනය 1996 ජුලි මස 19 වනදාට යෙදී ඇත. බොහෝ ඉන්ද්‍රියයන් දුර්වලව, අඩපණව එක්තැන්ව වැඩ සිටියද උන්වහන්සේට සියවෙනි ජන්ම දිනය ලැබීම ශ්‍රී ලංකාවාසී ගිහි පැවිදි හැම දෙනාගේම භාග්‍යයක් සේ මම සළකමි. **සම්මා සම්බුද්ධ සාසනයටත්, භාෂා ශාස්ත්‍රාදියටත්, රටටත්, ජාතියටත් අනුපමේය සේවාවක් කළ උතුමෙකුගේ ඉන්ද්‍රියයන් කෙතරම් දුර්වලව අඩපණව තිබුණද ශේෂ වී පවත්නා ප්‍රාණ වායුව පවා අමුතු ජීවයක් අපට ලබා දෙන්නේය.**

**"පැවිදි පඩි මිණි පහන්"** නමින් 1990 දී ම විසින් ලියා පළකරන ලද චරිත කථා එකතුවේ දී මුල් පරිච්ජේදය අතිගරු රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චරිත විස්තරයට වෙන් කරන ලදි. එසේ තිබියදී මෙසේ වෙනමම චරිත කථා ග්‍රන්ථයක් ලියා පළ කිරීමට හේතුවද මෙහිදී පැහැදිලි කිරීම අවශ්‍යය.

1990 දී "පැවිදි පඩිමිණි පහන්" ග්‍රන්ථය පළවීමෙන් පසුව 1993 දී අතිගරු බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමියන්ගේ චරිත කතාව වෙනමම ග්‍රන්ථයක් වශයෙන් ලියා පළ කළෙමි. එය අද මේ රටේ ජනප්‍රියම පොත් වලින් එකක් බවට පත් වී තිබේ. අතිගරු රේරුකානේ චන්දවිමල මහානායක මා හිමියන් වහන්සේගේ චරිතය ඒ හා සමාන වෙනමම පොතක් වශයෙන් මා ලවා ලියවා පළකරවා ගැනීමේ බලවත් උවමනාව තිබුනේ අතිගරු චන්දවිමල මහානායක මා හිමියන්ගේ දයාබර ශිෂ්‍ය මගේ කල්‍යාණ මිත්‍ර හේන්ගොඩ කල්‍යාණ ධම්ම හාමුදුරුවන්ටයි. වසර 3 කටත් ඉහත දී මෙම ඉල්ලීම කළද කල්‍යාණධම්ම හාමුදුරුවන් අපවත්වන තෙක්ම එය ලියා මුද්‍රණයෙන් පළකරන්නට නොලැබීම ගැන නම් ඇතිවන්නේ මහත්ම වේදනාවකි. කෙසේ වුවත් අතිගරු මහානායක මා හිමියන් වහන්සේගේ සියවෙනි ජන්ම දිනය උදාවන දා හේන්ගොඩ කල්‍යාණ

ධම්ම හාමුදුරුවන්ගේ තුන්මාසේ පින්කම සිදු කරන දා, එම චරිත කථාව මෙසේ පළ කරන්නට ලැබීම සැනසීමට හේතුවකි.

1994 පෙබරවාරි මාසයේ ආරම්භ කරන ලද මේ චරිත කථාව සම්පූර්ණයෙන් ලියා අවසන් කරන ලද්දේ 1996 පෙබරවාරි මාසයේදීය. විවිධ හේතුන් නිසා වසර දෙකකට අධික කාලයක් මේ සඳහා ගත විය.

මේ චරිත කථාව මේ මොහොතේදී හෝ පළ කිරීමට ලැබෙන්නේ මාස 3 කට පෙර අපවත් වී වදාළ හේන්ගොඩ කල්‍යාණ ධම්ම හාමුදුරුවන් දැක් වූ උනන්දුව නිසා බව නො කියාම නොහැකිය. 1996 මාර්තු මාසයේ මෙම චරිත කථාව ලියා අවසන් කොට තවත් මොනවා හෝ අඩුපාඩුවක් ඇද්දැයි කියවා බලන්නට මුල් පිටපත අපේ කල්‍යාණධම්ම හාමුදුරුවන්ට භාරදී මම විදේශ ගත වීමි. ඒ සමගම මේ ග්‍රන්ථය කියවා බලා පූංචි පෙරවදනක් ලිවීමේ කාර්‍ය්‍ය සඳහා සිංහල ශබ්ද කෝෂයේ සම්මාන කර්තෘ **රාජකීය පණ්ඩිත ආචාර්‍ය්‍ය හොරණ වජිරඥාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට** ආරාධනා කරන ලෙසටද මතක් කළෙමි. ඒ අනුව උන්වහන්සේ ලියූ පෙරවදනත් සකස් කරන ලද අත් පිටපතත් සති 3 ක් ඇතුලත මගේ පංසලට ලැබෙන්නට සලස්වා තිබුණි. එයින් පැහැදිලිව පෙනුනේ කල්‍යාණධම්ම හාමුදුරුවන් අවසාන මොහොතේදී මෙම කාර්‍ය්‍ය සඳහා වහ වහා ක්‍රියාත්මක වූ බවයි.

මේ චරිත කථාව සඳහා මට නන් අයුරින් සහාය වූ කීප දෙනෙක් වෙති. වසර 2 ක් වැනි කාලයක් අතිගරු මහානායක මා හිමියන් වහන්සේ හමු වී කථා බහ කිරීමට මට ඉඩකඩ ලැබුණි. එහිදී අපේ **හේන්ගොඩ කල්‍යාණධම්ම** හාමුදුරුවන්ගෙන් සහ අග්‍ර උපස්ථායක **කිරිඔරුවේ ධම්මානන්ද** ආයුෂ්මතුන්ගෙන් ද වෛද්‍යාචාර්‍ය්‍ය බී. ප්‍රේමරත්න මහතාගෙන් ද ලැබුණු සහාය ඉතා විශාලය. එම නිසා මුලින්ම මෙම චරිත කථාව ලිවීමෙන් අත්වන මහාකුසලය තෙමසකට පෙර අපවත් වී වදාළ හේන්ගොඩ කල්‍යාණධම්ම හාමුදුරුවන් වහන්සේට අනුමෝදන් කරවමින් කිරිඔරුවේ ධම්මානන්ද ආයුෂ්මතුන් පුරන පාරමිතාවද කවදා හෝ සමෘද්ධ වේවායි ද ප්‍රාර්ථනා කරමි.

මගේ ගෞරවණීය ඉල්ලීම පරිදි හේන්ගොඩ කල්‍යාණධම්ම හාමුදුරුවන්ගේ මතක් කිරීම අනුව මෙම චරිත කථාව සම්පූර්ණයෙන් කියවා බලා අගනා පෙරවදනක් ලිවීම පිළිබඳව ආචාර්ය ගරු හොරණ වජිරඥාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට මගේ ගෞරව පූර්වක ස්තුතිය මුලින්ම හිමි කරමි.

පිටපත් කිරීමේදී සහාය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය **අපරැක්කේ පුණ්‍යසිරි** හා **ඉඟුරුගමුවේ සීලාලංකාර** යන දෙනමටත් රුක්මලේ පදිංචි සුමිත්‍රා මල්ලිකා මෙනෙවියටත් මගේ විශේෂ ස්තුතිය හිමි වේ.

මෙම චරිත කතාව යතුරු ලියනය කිරීමේ සම්පූර්ණ කාර්යය මහත් උනන්දුවෙන් කර දුන් මහරගම පදිංචි **ස්වර්ණා කරුණාරත්න** මහත්මියට මගේ කෘතඥතාවය හිමිවන අතර වෙහෙස නොබලා ඉක්මනින් මෙම කාර්යය ඉටු නොකළේ නම් චරිත කථාව මුද්‍රණයෙන් එළිදැක්වීම නවත් ප්‍රමාද වන්නට ඉඩ තිබුණි.

ශාස්ත්‍රීය කටයුතු වලදී මෙන්ම අනිකුත් සියලු කටයුතු වලදීත් විවිධාකාරයෙන් මා උනන්දු කරවන මගේ කල්‍යාණ මිත්‍ර **මහාචාර්ය ගරු බෙල්ලන්විල විමලරතන ස්ථවිරයන්** වහන්සේට ද මගේ ස්තුතිය හිමි වේ.


මෙවැනි කාර්යයන් සඳහා කායික හා මානසික විවේකය හැමවිටම ලබා දෙන මගේ ප්‍රිය ශිෂ්‍ය මහරගම මධ්‍ය මහා විද්‍යාලයේ ආචාර්ය **පැලවත්තේ පුඤ්ඤරතන** නමටත් ආශිර්වාද කරමි.

අවසාන වශයෙන් මා දිවයිනෙන් බැහැරව සිටියදී ඉතා කෙටි කලක් තුළ මනහර ලෙස මුද්‍රණ කටයුතු අවසන් කළ **නැදිමාලේ ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් අධිපති මහේන්ද්‍ර සේනානායක** මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටද අවශ්‍ය ඡායාරූප සපයා ගැනීමේදී සහාය වූ ප්‍රකට පුවත් පත් කලාවේදියකු සහ ලේඛකයකු වූ **ගුණදාස ලියනගේ** මහතාටද **දෙහිවල ට්‍රාන්ස්වීව් අධිපති ෂ්‍යාම් සෙයිනුඩීන්** මහතාටද මගේ කෘතඥතාව හිමි කරමි.

***ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිර***

රුක්මලේ විහාරය
පන්නිපිටිය
1996.06.14

# ප්‍රස්තාවනා



ත්‍රිපිටක බුද්ධ ධර්මයට අර්ථකථා, ටීකා, ගණ්ඨිපද, සන්න, සංග්‍රහ, විවරණ ආදි විවිධ ග්‍රන්ථ සම්පාදනයෙන් ශ්‍රී ලංකාවේ ථෙරවාද බුද්ධ ධර්මය ආරක්ෂා කළ, පෝෂණය කළ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘවරයන් වහන්සේලාගේ ශ්‍රී නාමයන් සාසන ඉතිහාසයෙහි අමරණීයත්වයෙන් සටහන් වී තිබේ. අර්ථකථාචාර්ය **බුද්ධඝෝෂ, බුද්ධදත්ත, වනරතන, ධර්මකීර්ති, සංඝරක්ඛිත** ආදී මාහිමිවරු අතීත යුගයට අයත් වෙති. **වැලිවිට සරණංකර සංඝරාජ** මාහිමියන්ගෙන් ආරම්භ වූ මධ්‍යතන අවධියෙහි **යාත්‍රාමුල්ලේ ධම්මාරාම, ගිතිගත්පිටියේ සංඝරක්ඛිත, කරතොට ධර්මාරාම, අඹගහපිටියේ ඥාණවිමලතිස්ස, ලංකාගොඩ ධීරානන්ද** ආදී මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ නාමයන් සිහිපත් කළ හැකිය. **වලානේ ශ්‍රී සිද්ධාර්ථ** මාහිමියන්ගෙන් ආරම්භ වූ නූතන අවධියෙහි **රත්මලානේ ශ්‍රී ධර්මාලෝක, හික්කඩුවේ ශ්‍රී සුමංගල, වැලිගම ශ්‍රී සුමංගල, වස්කඩුවේ ශ්‍රී සුභූති, රත්මලානේ ශ්‍රී ධර්මාරාම, බැදිගම රතනපාල** ආදී සාසන භාරධාරි මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා සම්ප්‍රදායානුකූලව තමන් වහන්සේලා වෙත පැවැරුණ ඒ යුග මෙහෙවර නිසි පරිදි ඉටු කළහ.

මහාචාර්ය, සාහිත්‍ය චක්‍රවර්ති පණ්ඩිත අතිපූජ්‍ය **රේරුකානේ චන්දවිමල** මහා නායක මාහිමියන් වහන්සේ ඉහත නම් සඳහන් කළ ථෙරවාද මහා සංඝ පරම්පරාවට අයත් වන අද ජීවතුන් අතර වැඩ සිටින මහ තෙරුන් වහන්සේලා දෙතුන් නමගෙන් එක් හිමි නමකි. දහනව වෙනි ශත වර්ෂයේ අවසාන දශකයේ රයිගම් කෝරළයේ කුඩා ගම්මානයෙක උපත ලබා මේ විසිවන ශත වර්ෂයේ අවසාන දශකයේ බෙලහීන වූ කායෙන්ද්‍රියයෙන් යුක්ත වුවද හද තුළ දැල්වෙන දහම් පහන් එළියෙන් ආලෝකවත්ව වැඩ සිටින රේරුකානේ චන්දවිමල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ පැවිදි පඩි මිණි පහන් වැටට එක් කිරීම **රාජකීය පණ්ඩිත ඉත්තෑපාන ධම්මාලංකාර** හිමියන්ගෙන් ඉටුවුණු මහඟු ශාසනික සේවාවක් ලෙස අගය කළ හැකිය.

"**දුල්ලභෝ පුරිසාජඤ්ඤෝ න සො සබ්බත්ථ ජායති**" යනුවෙන් බුදුරාජාණන් වහන්සේ "ආජානීය පුද්ගලයන් ලෝකයේ දුර්ලභය. ඔවුහු හැම තැන්හි හැම කල්හි පහළ නොවෙති" යැයි වදාළ දේශනාවෙහි සත්‍යතාවය මානව ඉතිහාසය විමසා බලන කල පැහැදිලිව දක්නට ලැබේ. ලොව වරින් වර පහළ වන ශ්‍රේෂ්ඨ පුද්ගලයන් අතර ආගමික, සාමාජික, ජාතික, සංස්කෘතික, ධර්මශාස්ත්‍රීය ආදි විවිධ අංශයන්ට අයත් වන්නෝ වෙති. ඔවුන්ගේ ජීවන චරිත ග්‍රන්ථාරූඪ කොට තැබීම අනාගතයෙහි එබඳු ශ්‍රේෂ්ඨ පුරුෂයන් පහළ වීමට උපකාරවත් වනු පමණක් නොව ආදර්ශවත් උසස් සමාජයක් ඇති වීමට ද ඉවහල් වේ. පුද්ගල චරිත නිසි ලෙස හඳුනා ගැනුම පහසු කාර්යයක් නොවන බවත් දිගු කලක් ඇසුරු කිරීමෙන්, කතාබහ කිරීමෙන්, සාකච්ඡා පැවැත්වීමෙන් නුවණැතියන් විසින් ම එය කළ හැකි බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.

ගරු ඉත්තෑපාන හිමියන් සම්පාදනය කරනු ලබන ජීවන චරිත කථා ග්‍රන්ථ සාර්ථකත්වයට පත්ව ඇත්තේ ඉහත කී බුදු වදනට අනුරූප ක්‍රියා මාර්ගයක් ඉවහල් කරගෙන ඇති නිසා බව කිව හැකිය. "රේරුකානේ චන්දවිමල මහ නාහිමි" නමැති මෙම චරිත කථා ග්‍රන්ථය පරිච්ඡේද දොළොසෙකින් යුක්තය. ඉන් පරිච්ඡේද පහක් ම ළමා අවධිය පටන් මහ නාහිමි පදවිය දක්වා ස්වකීය ජීවිත මන්දිරය ගොඩනැගුණු පරිදි තමන් වහන්සේගේ මුවින්ම පවසන අයුරු ලියා තිබේ. පැවිදි දිවි මගේ එක් එක් සැතපුම් කණු පසු කරමින් අනු නව වන සැතපුම් කණුව දක්වා පැමිණි මං තොරතුරු මෙහි දැක්වෙනුයේ රසවත් කථා කාව්‍යයෙක ස්වරූපයෙනි. පාඨකයා වෙහෙසට පත් නොවන පරිදි කරුණු එකිනෙක සසඳා ඉදිරිපත් කරන අයුරු මැනවි. සරල බස් වහර හා තිරවුල් වැකි යෙදුම එහිලා වෙසෙසින් අගය කළ හැකිය.

" **විනයාලංකාර** හාමුදුරුවන් කැඩිච්ච සිංහලෙන් එන යන අයට නිතර නිතර බණ කිව්ව බව මං කලින් කිව්වා . . . අපේ තාත්තත් නිතර නිතර යනවා ඔය බණ අහන්න . . . හොහොම උණත් අපේ තාත්තත් නිතර මේ බණ අහලා ගෙදර ඇවිදිල්ලා අපටත් ඒ ගැන කියනවා. දවසක් තාත්තා මගෙන් ඇහැව්වා පුතේ උඹටත් මහණ වුණොත් නරකද ? කියලා. එතකොට මගේ වයස අවුරුදු නවයක් විතර ඇති. මාත් ඉතින් කැමති උණා මහණ වෙන්න". (3-4 පි.)

සිත සන්සුන් කර ගත් නිරවුල් කර ගත් කෙනෙකුට නිරවුල්ව කියන්න පුළුවනි, ලියන්න පුළුවනි. **රේරුකානේ චන්දවිමල මහ නා හිමිපාණන්ගේ** දහම් පොත් කියවන බොහෝ දෙනාට ඉතා පහසුවෙන් ධර්මඥානය ලබා ගත හැකි වී ඇත්තේ එම පොත් ලියා ඇති සරල බස් වහර හා අදහස් නිරවුල්ව ඉදිරිපත් කිරීම නිසාය. එම සජීවි ලක්ෂණය උන් වහන්සේගේ කථාවෙහිද ගැබ්ව ඇති ආකාරය මෙම පාඨයෙන් ප්‍රකට වේ. අව්‍යාජ ප්‍රකාශනය හා ලේඛනයද මෙම චරිත කථාවේ සාර්ථකත්වයට බෙහෙවින් උපකාර වී ඇත. "මං පොත් ලිව්වේ" යන සතර වෙනි පරිච්ඡේදය පොත්පත් ලියන අයට ඉතා ප්‍රයෝජනවත් උපදෙස් මාලාවන් ඇතුළත් කොටසක් ලෙස හැඳින්විය හැකිය. "පටිච්ච සමුප්පාද විවරණය, පාරමිතා ප්‍රකරණය, විනය කර්ම පොත, සූවිසි මහා ගුණය" ආදී එක් එක් පොත ලිවීමට මුල් වූ කරුණු මෙහි සඳහන් වී තිබේ. මේ හැම පොතක් ම කාලීන අවශ්‍යතා ගැන සලකා බලා සම්පාදනය කළ බව උන්වහන්සේ පවසති. කාලීන සමාජ අවශ්‍යතා සලකා බැලීම ග්‍රන්ථ සම්පාදනයෙහි දී මූලික කාරණය ලෙස එම ප්‍රකාශයන්ගෙන් අනාවරණය වේ. එමෙන්ම තමන් ලියන කරුණු පිළිබඳව තමන් විසින්ම මනාව අවබෝධ කරගෙන ලිවීම සාර්ථක ග්‍රන්ථ කර්තෲවරයකු කෙරෙහි පිහිටිය යුතු ලක්ෂණයක් බවද මෙයින් පැහැදිලි වේ.

"මං ධර්මය ඉගෙන ගත්තේ හරි අමාරුවෙන්. ඒ නිසා මට හිතුණා මේ ධර්මය මාත් හොඳට තේරුම් අරගෙන අනෙක් අයටත් කියා දෙන්න ඕනෑ කියලා . . . බුද්ධ හාමුදුරුවන්ගේ ධර්මය ගැඹුරුයි. මේ ගැඹුරු ධර්මය පැහැදිලි අවබෝධයකින් තොරව ලියන්නට කියන්නට යාම හරිම නිෂ්ඵල වැඩක් කියලා මට හිතුණා. . . සමහර ධර්ම කාරණා තේරුම් ගන්නට මං සති ගණන් මාස ගණන් කල්පනා කළා. ඒ අනුව මං හරියට තේරුම් නොගත්ත කිසිම කාරණයක් මගේ පොත්වල ලිව්වේ නැහැ." (21-22 පි.)

ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදනයෙහි යෙදෙන කවර තරාතිරමේ පුද්ගලයකුට වුවද ආදර්ශයට ගත හැකි ඉතා අගනා උපදෙස් රේරුකානේ මා හිමියෝ මෙසේ පවසති :

"හිරු එළියෙන් දවාලට ලිවීම තමයි හොඳ. ඇස්වලට ඒක හොඳයි. මට නම් ලියන්න ඕනෑ කළේ පෑනක්, කඩදාසියක්, ලෑලි

කැල්ලක් විතරයි. වෙන වෙන දේවල් ඒකට එකතු කර ගත්තේ නැහැ. හුඟක් දේවල් ඕකට එක්කාසු කරගන්න ගියාම හරි කරදරයි. ලියන්න පුංචි කර්මාන්ත ශාලාවක් ඕනෑ නැනේ. (22 පි.)

මේ අන්දමට මහ නාහිමිපාණන්ගේ මුවින් පැවසෙන වදන් තුලින් අල්පේච්ඡතා ගුණයෙන් හෙබි උදාර පුද්ගල චරිත ලක්ෂණ පමණක් නොව වර්තමාන සමාජයට අතිශයින් වැඩදායක උපදෙස් සමූහයක් ද ඉදිරිපත් වී ඇත. ධම්මාලංකාර හිමියන් චරිත කථා ග්‍රන්ථ සම්පාදනයෙහි දක්වන සුවිශේෂ කුශලතාව මෙයින් වටහා ගත හැකිවේ.

වර්තමාන භික්ෂු අධ්‍යාපනය පිළිබඳ රේරුකානේ මහා නායක මාහිමියන් පවසන අදහස් අධ්‍යාපන විශේෂඥයන්ගේ අවධානය යොමු විය යුත්තකි. මෙම ග්‍රන්ථයේ 5 වෙනි පරිච්ඡේදයෙන් උන්වහන්සේ ඉදිරිපත් කරන අදහස් අනුව අද භික්ෂු අධ්‍යාපනය කිසිසේත් සුදුසු නැති පරිහානි තත්ත්වයකට පත්ව ඇති බව පැවසේ. පැරණි ආරාමික අධ්‍යාපනයේ වැදගත් අංග ගැන විස්තර කරන මහනායක මාහිමියන් වහන්සේ ලංකාවේ සියලුම සංඝයාට බලපාන ක්‍රමවත් භික්ෂු සංවිධානයක අවශ්‍යකත්වයද පෙන්වා දී ඇත.

පුද්ගල චරිතය විග්‍රහ කිරීමේදී එම පුද්ගලයා විවිධ අංශයන් පිළිබඳ දරන අදහස් ඉදිරිපත් කිරීමෙන් ද එම චරිතය පිළිබඳ පාඨකයාට ගැඹුරින් හඳුනා ගැනුමට අවස්ථාවක් ලබා දීමෙන් ග්‍රන්ථ කර්තෘවරයා චරිත කථා සම්පාදනයෙහි විශේෂ කුශලතාවක් දක්වා ඇත. මෙම ග්‍රන්ථයෙහි හත්වන පරිච්ඡේදය විශේෂ අවධානය යොමු විය යුතු ඉතා අගනා කරුණු සමූහයකින් යුක්ත වූවකි. "ධර්ම සාකච්ඡාවක්" යන මැයෙන් ඉදිරිපත් කර ඇති මෙම පරිච්ඡේදයෙහි නිරෝධය, සංසාර චක්‍රය, වේදයිත හා විමුක්ති සුඛ, අනුත්පාද නිරෝධය, සක්කාය දෘෂ්ටිය, නිවන ආදී වැදගත් ධර්ම කාරණා ගැන ධර්ම ග්‍රන්ථ සමූහයක් කියවා උගත හැකි කරුණු ඉතා පැහැදිලිව විග්‍රහ කොට තිබේ.

9, 10, 11 පරිච්ඡේද වෙන් වී ඇත්තේ මහා නායක මාහිමියන්ගේ සොහොයුරිය සහ උපස්ථායක **කිරිඔරුවේ ධම්මානන්ද හිමි**, ශිෂ්‍ය **හේන්ගොඩ කල්‍යාණධම්ම** හිමිවරුන් දෙනම මහා නායක

මාහිමියන් සම්පාශ්‍රයෙන් හඳුනා ගත් අයුරු විස්තර කිරීමටය. මෙම පරිච්ඡේද තුන මහා නායක මාහිමියන්ගේ ගිහි ජීවිතයත් පැවිදි ජීවිතයත් සම්බුද්ධ ශාසනයට නැඹුරුව පවත්නා ආකාරය සජීවී ස්වරූපයෙන් විස්තර කර ඇති බව කිව හැකිය.

**ඉත්තෑපාන ධම්මාලංකාර** හිමියන් චරිත කථා සම්පාදනයෙහිදී බොහෝ චරිත කථා සම්පාදකයන් අනුගමනය නොකරන නව මං ඔස්සේ යමින් සාර්ථක අන්දමින් තම කාර්යය ඉටු කරන අයුරු මෙම විශේෂ පරිච්ඡේදයන්ගෙන් ප්‍රකට වේ.

"මහා නායක මාහිමියන් අපවත් වීමෙන් පසු අවසන් කටයුතු කළයුතු ආකාරය" ගැන උන් වහන්සේගේ අදහස් දැක්වෙන අවසාන පරිච්ඡේදය චරිත කථා ග්‍රන්ථයකට ඇතුළත් නොවන සුවිශේෂ අදහස් සමූහයකින් යුක්ත වූවකි. අති මහත් ධනස්කන්ධයක් වියදම් කරමින් පුහු ආටෝපයට ආදාහන කටයුතු කිරීමට මහත් උනන්දුවක් දක්වන ගිහි පැවිදි සාහටත් උතුම් ආදර්ශයක් දෙන මෙහි එන කරුණු නුවණින් විමසා බලන කවරකුට වුවද රේරුකානේ චන්දවිමල මහා නායක මා හිමියන් වහන්සේ සංසාර චක්‍රය සිඳ බිඳ දමා විමුක්ති සුඛය ළඟා කර ගැනීම පිණිස අවශ්‍ය ධර්ම මාර්ගයෙහි කෙළවරට ළං වූ පැවිදි උතුමකු බව නිසැකව ම අවබෝධ කර ගත හැකිය.

**හොරණ වජිරඤාණ නායක ස්ථවිර**

## කර්තෘගේ වෙනත් කෘති

මාතා පිතු උපට්ඨානං 1987
පැවිදි පඩි මිණිපහන් 1990
බුදුබව පතන බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමි 1991
මල්පැලේ උපන් පන්සලේ පියතුමා 1995

**'මේ මම, (මාපලගම විපුලසාර නා හිමි චරිත කථාව) 2000**

**සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ බෞද්ධ සාරධර්ම 2000**

**බෙල්ලන ඥාණවිමල මහනාහිමි (චරිතකථාව) - 2005**

**බුදු දහමෙහි දාර්ශනික ප්‍රස්තුත**

- උපහාරය -

තෙමසකට පෙර අපවත්වී වදාළ
පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමාධිවාසීව වැඩ සිටි
ශාස්ත්‍රපති පණ්ඩිත ගරු හේන්ගොඩ කල්‍යාණධම්ම
මහාස්ථවිර පාදයන් වහන්සේගේ
උදාර ගුණ සමුදායට

**මහාචාර්ය**
**සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද**
**රේරුකානේ චන්දවිමල මහා නායක ස්වාමිපාදයන් වහන්සේ**
**විසින් සම්පාදිත**


## දහම් පොත්

චතුරාර්‍ය්‍ය සත්‍යය
විදර්ශනා භාවනා ක්‍රමය
බෞද්ධයාගේ අත්පොත
චෛතසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
මංගල ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
විනය කර්ම පොත
පට්ඨාන මහාපකරණ සන්නය
අභිධර්ම මාර්ගය
බුද්ධ නීති සංග්‍රහය
අභිධර්මයේ මූලික කරුණු
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
සතිපට්ඨාන භාවනා විවේචනය
ධර්ම විනිශ්චය (ප්‍රථම භාගය)
ශාසනාවතරණය
පුණ්‍යෝපදේශය
සූවිසි මහ ගුණය
පොහොය දිනය
චත්තාළීසාකාර මහා විපස්සනා භාවනා
උපසම්පදා ශීලය
කෙලෙස් එක්දහස් පන්සියය
බෝධි පූජාව
අනුවාද සහිත උභය ප්‍රාතිමෝක්ෂය
නිර්වාණ විනිශ්චය හා පුනරුත්පත්ති ක්‍රමය

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 01. | මගේ පුංචි කාලය - (පැවිද්ද හා බුරුමයට යාම) | 1 |
| 02. | බුරුමයේ සිට ලංකාවට | 7 |
| 03. | මේක බුරුම පන්සල - (ශ්වේජින් නිකායේ මූලස්ථානය) | 10 |
| 04. | මං පොත් ලිව්වේ . . . | 17 |
| 05. | වර්තමාන භික්ෂු අධ්‍යාපනය කොහෙත්ම සුදුසු නෑ | 26 |
| 06. | අභිධර්මය බුද්ධ දේශනාවක්මයි. | 30 |
| 07. | ධර්ම සාකච්ඡාවක් | 39 |
| 08. | ජීවිතයේ රසවත් සිදුවීම් ටිකක් . . . | 51 |
| 09. | ජීවත්ව සිටින එකම සොහොයුරිය ගෙන් | 60 |
| 10. | ශිෂ්‍ය හේන්ගොඩ කල්‍යාණධම්ම හිමියන් ගෙන් | 63 |
| 11. | අග්‍ර උපස්ථායක ධම්මානන්ද හිමියන් ගෙන් | 72 |
| 12. | අවසන් කටයුතු . . . . . | 100 |



රේරුකානේ චන්දවිමල මහා නාහිමියන්ගේ
අත්අකුරු

# මගේ පුංචි කාලය
## (පැවිද්ද හා බුරුමයට යාම)

1

"මා උපන්නේ "රේරුකාන" ගමේ. "**රේරුකාන, රයිගම් කෝරළයේ" අදිකාරි පත්තුවේ, බණ්ඩාරගම ආසනයේ පිහිටා තිබෙන පුංචි ගමක්.** විශාල වෙල්යායවලින් වට වෙච්ච ගමක්. ඒ වගේම ගොඩ ඉඩම් ද සෑහෙන තරම් තියෙනවා. අද නම් අපේ ගමේ ගෙවල් හුඟක් තියෙනවා. ජනගහනයත් හුඟක් ඉන්නවා. ඒ කාලේ තිබුණේ ගෙවල් දහයක් පහළොවක් විතරයි. අපේ ගේ තවමත් තියෙනවා. ගියොත් බලා ගන්නත් පුළුවන්. ඒක මුලදී වහලට පරාල දාලා පොල් අතු සෙවිලි කරලයි තිබුණේ. නමුත් දැන් පොල් පරාල දාල රට උළු සෙවිලි කරලා තියෙනවා. අපේ ගෙදරට මට වඩා සෑහෙන වයසක් ඇතියි කියලයි මං හිතන්නේ. 1897 ජූලි මාසේ 19 දා තමයි මගේ උපන් දිනය. ඒක සඳුදා දවසක් කියලයි මට මතක තියෙන්නේ. මගේ පියා **දොන් බස්තියන් ද පවුලිස් ගුණවර්ධන**. මව **මූණසිංහගේ පොඩි නෝනා**. මගේ මවු පිය දෙපළම ගුණ යහපත් සැදැහවත් අය.

අපේ පවුලේ මා ඇතුළු සහෝදර සහෝදරියන් හය දෙනෙක් හිටියා. මං තමයි වැඩිමලා. දැන් මේ වන කොට ඉතිරි වෙලා ඉන්නේ නංගි කෙනෙකුයි, මායි විතරයි. ඒ නංගිගේ නම **සෙලෝහාමි**. එයා පවුලේ දෙවෙනියා. **තීලිස් ගුණවර්ධන, එඩ්මන් ගුණවර්ධන, ඇක්මන් ගුණවර්ධන, ජ්ඩින් ගුණවර්ධන**, තමයි අනෙක් සහෝදරයන් හතර දෙනා. දැන් ඒ හතර දෙනාම මැරිලා.

මා ඉස්කෝලේ ගියේ දෙවෙනි පන්තියට විතරයි. පළමුවෙනි පන්තියේදී ඉගෙන ගත්ත කථාවක් 'මෝරුන් සහ තල්මසුන්ගේ සටනක්' නාමත් මට මතකයි. දෙවෙනි පන්තියේදී ඉගෙන ගත්ත දේවල්



**මහා නාහිමියන් උපන් නිවස**

මට මතක නෑ. නමුත් පළමුවෙනි පන්තියෙන් දෙවෙනි පන්තියට පාස් වුණු හැටි නම් මතකයි. විභාග දවසේ ළමයි වාඩි කෙරෙව්වේ මූණට මූණ ලා හිටින විදියට. ගුරුතුමා ශබ්ද නගා කිව්වා, 'තේ වතුර බීම ගුණයි' කියලා. ඒ වාක්‍යය ලස්සනට අපේ ගල්ලෑලි වල ලියන්න කිව්වා. මට ඉතින් ඒක ලියන්න බැහැ. ඉස්සරහ බංකුවේ වාඩි වෙලා හිටිය ළමයා හොඳට ලියලා තිබුණා. මං එයාගේ ගල්ලෑල්ල දිහා බලාගෙන ලිව්වා. එහෙම තමයි මං දෙවෙනි පන්තියට පාස් වුණේ. එතකොට මං දෙවෙනි පන්තියට පාස් වුණේ කොපි කරලා.

## පැවිද්ද

"මේ ශත වර්ෂය මුලදී, ඒ කියන්නේ 1906 දී **බුරුම ජාතික විනයාලංකාර** කියන හාමුදුරු නමක් ලංකාවට වැඩියා. උන් වහන්සේ ඉපැරණි පූජනීය ස්ථාන දැක ගැනීමටත්, වැඳ පුදා ගැනීමටත් එක්ක ලංකාවේ බොහෝ ප්‍රදේශවල සංචාරය කළා. එහෙම සංචාරය කරන අතර උන් වහන්සේ මේ අපේ ප්‍රදේශයටත් වැඩියා. වැඩලා මේ ළඟම

තියෙන 'කුළුපන' කියන කන්දේ ගල් ගුහාවක දින කීපයක් නතර වෙලා විවේකයෙන් හිටියා. මේ පළාතේ අය මේ බුරුම ජාතික හාමුදුරුවන් ගැන පුදුම විදියට පැහැදිලා දානමාන ආදියෙන් සලකන්න පටන් ගත්තා. මේ හාමුදුරුවන්ට හොඳට සිංහලත් බැහැ. ඒ වුණත් එන යන අයත් සමග කැඩිච්ච සිංහලෙන් කථා බහ කරනවා. ඒ විතරක් නෙවෙයි, ඒ හාමුදුරුවන් කැඩිච්ච සිංහලෙන් එන යන අයට බණත් කියනවා. මේ හාමුදුරුවන් ගැන ඇති වෙච්ච මහත් ප්‍රසාදය නිසා මේ පළාතේ සැදැහැවත් උදවිය උන් වහන්සේට සිවුරු, අට පිරිකර ආදිය හරියට පූජා කරන්නට පටන් ගත්තා. ටික දවසක් යන කොට උන් වහන්සේ කල්පනා කළා තමන්ට ලැබුණු පුද පරිස්කාර ඔක්කොම පූජා කරන්නටත් එක්ක, සියක් නමකට දානයක් දෙන්නට ඕනෑ කියලා. දානය සඳහා වටපිට පන්සල්වල වැඩ ඉන්න හාමුදුරුවරුන්ට ආරාධනා කළත් ඒ ඇත්තන් ඒ ආරාධනාව පිළිගත්තේ නැහැ. මේක මේ පළාතේ ඉන්න සැදැහැවත් බෞද්ධ පිරිසට ලොකුම ප්‍රශ්නයක් වුණා. ඒ වෙලාවේ **වස්කඩුවේ සුභූති** කියන හාමුදුරුවන් මේ කාරණය දැනගෙන දානෙත් බාර ගෙන, දානෙට අවශ්‍ය සියලුම සංඝයාත් වැඩමවලා දුන්නා. වස්කඩුවේ සුභූති හාමුදුරුවන් ඒ කාලේ ප්‍රසිද්ධ හාමුදුරු නමක්. ඒ වගේම එඩිතර බලවත් හාමුදුරු නමක්. දාන පිංකම ඉතාම හොඳින් කෙරුණා. පිංකම අවසන් වුණාම මේ පළාතේ ඉන්න සැදැහැවත් දායක පිරිස එකතු වෙලා සාකච්ඡා කළා, අපේ දාන පිංකමට වට පිටාවේ පන්සල්වල හාමුදුරුවරුන් නොවැඩිය නිසා අළුතින් පන්සලක් හදන්න ඕනෑයි කියලා. ඔන්න ඔය දායක පිරිස එකතු වෙලා තමයි මේ ඉඩම අරගෙන මේ පන්සල හැදුවේ. මේ ඉඩමට ඉස්සර කිව්වේ "**ඉදිකැටි දෙනිය**" කියලා. ඔහේ නිකම් තිබුණ කැලෑ ඉඩමක්. ඒ කාලේ හොර හරක් ගෙනත් බැදලා තියෙන්නෙත් මේ ඉඩමේ. ඔය නයි පොළොන්ගු වගේ දරුණු සර්පයන් අල්ලගෙන ගෙනත් දාල තියෙන්නෙත් මේ ඉඩමට. මේ ඉඩමට අයිතිකාරයන් හුඟක් ඉඳලා තියෙනවා. ඒ කවුරුත් වගේ එකතු වෙලා තමයි මේක පූජා කරලා තියෙන්නේ. ඒ පූජාව කළේ බුරුම ජාතික විනයාලංකාර කියන හාමුදුරුවන්ටයි. මේ පන්සලට විනයාලංකාරාරාමය කියන්නේ ඒ නිසයි.

විනයාලංකාර හාමුදුරුවන් කැඩිච්ච සිංහලෙන් එන යන අයට නිතර නිතර බණ කිව්ව බව මං කලින් කිව්වා. බොහෝ විට උන් වහන්සේ පැවිදි වීමේ වටිනාකම, එහි ආනිසංස ප්‍රකාශ කළා. අපේ

තාත්තත් නිතර නිතර යනවා ඔය බණ අහන්න. මට අද නම් හිතෙනවා විනයාලංකාර හාමුදුරුවන් පැවිදි වීමේ අගය ඒ තරමට ම වර්ණනා කළේ බුරුම රට ගැන කල්පනා කරලයි කියලා. බුරුම රටේ වැඩි දෙනෙක් මහණ වෙනවා. කොහොම වුණත් අපේ තාත්තත් නිතර මේ බණ අහලා ගෙදර ඇවිල්ලා අපටත් ඒ ගැන කියනවා. 'දවසක් තාත්තා මගෙන් ඇහැව්වා පුතේ, උඹටත් මහණ වුණොත් නරකද ? කියලා'. එතකොට මගෙ වයස අවුරුදු නමයක් විතර ඇති. මාත් ඉතින් කැමති වුණා මහණ වෙන්න. කුමක් නිසා මහණ වෙන්න කැමති වුණාද කියලා කියන්න බැහැ. කොහොම වුණත් අදට වඩා ඒ කාලයේ ළමයි කැමතියි මහණ වෙන්න. මවුපියන් කැමතියි දරුවන් මහණ කරන්න. මං විතරක් නෙමෙයි, ඔය වෙන කොට මහණ වෙන්න කැමැත්තෙන් හිටියේ. තවත් ළමයින් විසි හය දෙනෙක් විතර මහණ වෙන්න කැමැත්තෙන් සූදානම් වෙලා හිටියා. 1906 ජනවාරි මාසයේ 08 වෙනිදා මා ඇතුළු තවත් ළමයි විසිහය දෙනෙක් පැවිදි වුණා. අපව පැවිදි කළේ බුරුම ජාතික විනයාලංකාර කියන හාමුදුරුවෝ. මහණ වෙන්න ඉස්සර වෙලා සාමණේර බණ දහම් පොත, පාලි වර නැගිල්ල, වගේ පොත් කිහිපයක් පාඩම් කළා. ඒ පොත් පාඩම් කළේ **බටුවිට සුසීම** කියන හාමුරුවන් ළඟ. පැවිදි වීමෙන් පස්සේ අපට වැඩි කාලයක් ලංකාවේ ඉන්න ලැබුණේ නැහැ. බුරුම ජාතික විනයාලංකාර හාමුදුරුවන් 1908 ජනවාරි 27 වැනි දා අප ඔක්කෝම බුරුම රටට එක්කර ගෙන ගියා. ඒ නිසා බණ දහම් පිළිබඳ අපට මූලික දැනුම ලැබුණේ බුරුමයේ දී. ඒ විතරක් නෙමෙයි ත්‍රිපිටක ධර්මය සම්පූර්ණයෙන් ම ඉගෙන ගත්තෙත් බුරුම රටේදී. මා ඇතුළු සාමණේර පිරිස නතර වෙලා හිටියේ පහත බුරුමයේ ශ්වේජින් නිකායේ මහානායක මාහිමියන් වහන්සේ ළඟ. මුල් අවුරුදු කිහිපයේදී අපට හරිම අමාරු වුණා. ඒකට හේතුව බුරුම භාෂාව අපට නොතේරෙන නිසයි. බුරුම භාෂාව ඉගෙන ගැනීමත් හරිම අමාරුයි. සමහර බුරුම වචන අපට උච්චාරණය කරන්න කොහොමවත් බැරි වුණා. නමුත් පස්සේ පස්සේ ටික ටික හරි ගියා. මට ඒ කාලේ හොඳට පාඩම් හිටිනවා. ඒ නිසා මං හුඟක් පොත් පාඩම් කළා. අවුරුදු දහයකට වැඩි කාලයක් මං බුරුම රටේ හිටියා. ඒ කාලය තුළ බුරුම රටේ පිළිගත් උගත් ධර්ම විනයධර ආචාර්යවරුන් ළඟ ධර්ම විනය අටුවා ටීකා සහිතව හොඳින් ඉගෙන ගත්තා. ඔය අතර එක වරක් ලංකාවට ඇවිත් යන්න අවස්ථාව ලැබුණා. ආපසු මා බුරුමයට ගියේ උපසම්පදාව ලබා ගැනීමටත් එක්කයි. **1917 ඔක්තෝබර් 26 වෙනි දින**

**බුරුම රටේ ධම්මිකාරාම සීමාවේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව** මා ලබා ගත්තා. අභිධර්මය ගැන ගැඹුරු දැනුමක් මා ලබා ගත්තෙත් බුරුම රටේදී. ඒ පිළිබඳ මහා විශාරද උගත් භික්ෂූන් වහන්සේලා බුරුම රටේ ඉන්නවා. ඒ වගේම වටිනා පොත් පත් රාශියක් බුරුම භාෂාවෙන් ලිය වී තියෙනවා. භාවනා ක්‍රම පිළිබඳව හොඳ දැනුමක් ලබා ගත්තෙත්, ඒවා හොඳින් ප්‍රගුණ කළේත් බුරුම රටේදී. මට බුරුම භාෂාව ස්ව භාෂාව තරමටම හොඳට පුළුවන්. කථා කරන්න, ලියන්න, කියන්න එකසේම පුළුවන්.

මෙතෙන්දි මම බුරුම රටේ ආරාමික අධ්‍යාපනයේ තියෙන හොඳම ඉගැන්වීමේ ක්‍රමයක් ගැනත් කියන්නම්. මා දන්නේ නැහැ වෙන මොන රටකවත් ඒ වගේ ඉගැන්වීමේ ක්‍රමයක් තියෙනවා කියලා. රාත්‍රියට මහ කළුවරේ තමයි ඒ ඉගැන්වීම කරන්නේ. ගුරුවරයාත්, ශිෂ්‍යයොත් මහ කළුවරේ එක එක තැන වාඩිවෙලා ඉන්නවා. පොත් පත් කිසිවක් නෑ. ගුරුවරයා මුලින් විස්තර කරලා කියා දෙනවා. ඒක හොඳට අහගෙන හිටියොත් ශිෂ්‍යයන්ටත් ඒ පාඩම පොතේ තියෙන හැටියට ම කියන්න පුළුවන් වෙනවා. අභිධර්මාර්ථ සංග්‍රහයේ ස්වරූප විභාගය, මාතෘකාව, ධාතු කථා, යමක, පට්ඨාන ඔය වගේ පොත් ඔක්කෝම රාත්‍රියේ උගන්වනවා. ඒවා හඳුන්වන්නේ **'රාත්‍රී වාචන'** වශයෙන්.

දිනපතා උදේ 4.30 ට අවදි වෙන්න ඕනෑ. ඒ සඳහා ගෙඩිය ගහනවා. ඊළඟට වන්දනාමාන කටයුතු වල යෙදෙන්න ඕනෑ. මෙතනදී පැමිණීම ලකුණු කරනවා. නම කියවන විට ඉන්නවා කියලා ශබ්ද නගා කියන්නටත් ඕනෑ. ඔය වෙලාවට නාවොත් දඬුවම් ලැබෙනවා. වතුර කල පහක්, සමහර විට ඊට වැඩි ප්‍රමාණයක් ගෙනිහින් තැනකට වත් කරන්න වෙනවා. මට නම් ඔය පාන්දර නැගිටින එක මක්කරලවත් කරන්න බැහැ. මුලින් මුලින් මටත් ඔය දඬුවම ලැබුණා. පස්සේ මට දඬුවම් නොදී අත් හැරියා. ඒ ඇත්තොම තේරුම් ගත්තා මට ඒක කරන්න බැහැ කියලා.

මා කලින් සඳහන් කළා අර රාත්‍රි වාචන හෙවත් අන්ධකාරයේ කරන ඉගැන්වීම ගැන. සමහර විට පැය තුන හතරක් එක දිගට පාඩම කරගෙන යනවා. සමහර දිනවල මේ මහ කළුවරේ වාඩිවෙලා ඉන්න අතරම මට නින්ද යනවා. පාඩම අවසන් වෙලා අනෙක්

ඔක්කෝම නැගිටලා ගිහිල්ලා. මං විතරයි ඉතිරි වෙලා ඉන්නේ. මා ඒ කාලේ හරිම කම්මැලියි. මං තමයි ඒ කාලයේ බුරුමයේ හිටිය ලොකුම කම්මැලියා.

බුරුම රටේ ආරාමික අධ්‍යාපනය ගැන මෙතෙන්දී තව ටිකක් කියන්නම්. ආරාමික අධ්‍යාපනයේ පාලි ව්‍යාකරණ ඉගැන්වීමටත් විශේෂ ස්ථානයක් ලැබුණා. පාලි ව්‍යාකරණ හා භාෂාව ගැඹුරට ඉගැන්නුවා. ඒ සමග ම ත්‍රිපිටක ධර්මයත් අටුවා ටීකා සහිතව විස්තරාත්මකව ඉගැන්නුවා. අප බුරුම රටේ ඉන්න කාලේ අනෙක් ඉගැන්වීම් වලට විශේෂ තැනක් ලැබුණේ නෑ. දැන් නම් හුඟක් වෙනස් වෙලා කියලා ආරංචියි. ඔය ඉංග්‍රීසි වගේ භාෂා ඉගෙනීමට සමහර බුරුම පැවිද්දන් දැන් දැන් ලංකාවටත් එනවානේ.

බුරුමයේදී ශ්වේජින් නිකායෙන් උපසම්පදාවත් ලබාගෙන අවුරුද්දක් විතර ගියාට පස්සෙයි මා ලංකාවට ආවේ. ඒ ඇවිදිල්ලා කොළඹ, **දෙමටගොඩ මහා විසුද්ධාරාමයේ** කාලයක් නතරව හිටියා. මෙතනදී මා එක දෙයක් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඔය විසුද්ධාරාමයේ වැඩ හිටිය **අරංගල සිරිධම්ම** හාමුදුරුවන් තමයි මේ දහම් පොත් පත් ලිවීමට මාව උනන්දු කළේ. 'බුරුම රටේ බුරුම භාෂාවෙන් ධර්මය පිළිබඳවත් විශේෂයෙන් අභිධර්මය පිළිබඳවත් වටිනා පොත් පත් ලියවිලා තියෙනවා. 'ඒ වගේ පොත් ටිකක් ඔබ වහන්සේත් සිංහල භාෂාවෙන් ලිව්වොත් හොඳයි' කියලා නිතර නිතර ඒ හාමුදුරුවන් මට කිව්වා".

# බුරුමයේ සිට ලංකාවට

**2**

"බුරුම රටේ ඉඳලා ලංකාවට ඇවිදින් මා ඉස්සෙල්ලම නතර වුණේ **දෙමටගොඩ මහා විසුද්ධාරාම පන්සලේ**. ඒකට විශේෂ හේතුවකුත් තිබුණා. ඒ කාලයේ පිටරටක ඉඳලා මෙහාට ආවාම සනීපාරක්ෂාව සඳහා රජයට පෙනී සිටින්නත් වෙනවා. ඉතින් කොළඹ නතර වී සිටීම ඒකටත් පහසුවක් වෙනවනේ. විසුද්ධාරාමයේ නතර වෙන්නට ඒකත් එක හේතුවක් වුණා. ඔය ඉන්න අතර සිරිධම්ම හාමුදුරුවන් අභිධර්මය උගන්වන පන්තිවලට ගිහිල්ලා මාත් පැත්තකින් අහගෙන හිටියා. මං ඉතින් බුරුම රටේ වසර ගණනාවක් ඉඳලනේ ලංකාවට ආවේ. ඒ නිසා වැඩි දෙනෙක් හිතාගෙන හිටියා මට අභිධර්මය වගේ දේවල් හොඳට පුළුවන් කියලා. ඉගෙනීමට ආව ශිෂ්‍යයන් සමහර අවස්ථාවල මට කිව්වා ඒ අයට අභිධර්මාර්ථ සංග්‍රහය උගන්වන්න කියලා. මා ඒකට එච්චර කැමති වුණේ නෑ. ඒ ඇත්තන් නැවත නැවත මේ ඉල්ලීම මගෙන් කළ නිසා දවසක් මා ඒ ඇත්තන්ට අභිධර්මාර්ථ සංග්‍රහය ඉගැන්නුවා. ඔය අතර ශිෂ්‍යයන් කියන්න පටන් ගත්තා සිරිධම්ම හාමුදුරුවන්ට වඩා මගේ ඉගැන්වීම හොඳයි කියලා. මා ඒ වෙලාවේ කල්පනා කළා මේ වගේ කථාවක් ඇති වෙච්ච එක හොඳ නෑ. දැන් ඉතිං මං ඉක්මනින් මෙතනින් අයින් වෙලා යන්ට ඕනෑ කියල.

ඒ වන විට අභිධර්මය ගැන ලෝක ප්‍රසිද්ධ වෙලා හිටියේ සිරිධම්ම හාමුදුරුවන්. ඉතින් මං වගේ පුංචි කෙනෙක් සිරිධම්ම හාමුදුරුවන්ට වඩා හොඳට උගන්වනවා කිව්වාම ඒක ඒ හාමුදුරුවන්ට මදි පුංචිකමක් වෙනවනේ. ඒ නිසා ඉක්මනින් ම එතනින් අයින් වෙලා යන්නට මං තීරණය කළා. හැබැයි මා ඒ ඇත්තන්ට කිව්වේ නැහැ අස්වෙලා යනවා කියලා. යමින් එමින් ටික දවසක් ඉඳලා පස්සේ

නොගිහින් ම ඇත් හැරියා. නමුත් අපේ සම්බන්ධකම මේ මෑතක් වන තුරුම තිබුණා. ඒ විද්‍යෝදයාරාමයේ අභිධර්මය ඉගෙනීමට ආව ශිෂ්‍යයන් ගැන මං මුලදී බිය වුණා. මේ ඇත්තන් හරියට දන්නවා ඇති කියලා. බැලුවාම මට තරම් ඒවා ගැන දැනුමක් ඇති කවුරුවත් ඒ ශිෂ්‍යයන් අතර හිටියේ නැහැ. නමුත් ඒ අය මැරිගෙන උදේ ඉඳන් පාඩම් කරනවා. මං එහෙම මහන්සි වෙලා කවදාවත් පාඩම් කරන්නේ නැහැ. මට එක වරක් ඕනෑම දෙයක් බැලුවාම පාඩම් හිටිනවා. ත්‍රිපිටකයේ වැඩිම ප්‍රමාණයක් මට කට පාඩම්. දැනුත් ඒවා වෙනසක් නැතුව පාඩම් තියෙනවා.

විද්‍යෝදයාරාමයෙන් ගිහිල්ලා මං **පානදුරේ පන්සලක** ටික දවසක් නතර වී හිටියා. ඒ පන්සලේ විහාරාධිපති වශයෙන් හිටියේ **ධීරානන්ද** කියලා හාමුදුරු නමක්. ඒ පන්සල 'වැල්ලබඩ පන්සල' නමින් ප්‍රසිද්ධ වෙලා තිබුණේ. මුහුද අයින නිසා. ශරීර සෞඛ්‍යයටත් ඒක හොඳ නිසා මං කලක් එහි නතරව හිටියා. අවුරුද්දක් හමාරක් විතරම එහි හිටියා. එතනදී තමයි මුලින් ම පොත් ලිවීම පටන් ගත්තේ. මගෙ මුල්ම පොත තමයි '**නිර්වාණ විනිශ්චය**'. මේ පොත ලියන්න හේතුවකුත් තිබුණා. ඒ කාලයේ තිබුණා '**ධර්ම ශ්‍රී**' කියලා සඟරාවක්. ඒ සඟරාවේ සංස්කාරකවරයා මගෙන් ඉල්ලීමක් කළා නිර්වාණය ගැන ලිපියක් ලියලා දෙන්න කියලා. ඒක පළ වුණාම ඒ ලිපියේ කාරණා විවේචනය කරමින් කවුදෝ ගිහි මහත්මයෙක් ලිපියක් ලියලා තිබුණා. මට නම මතක නැහැ. ඒකට පිළිතුරු දෙමින් තවත් ලිපි කීපයක් ම මං ලිව්වා. ඇත්තටම මං තීරණය කළා මේ විදියට ලිපි ලිවීමෙන් වැඩක් නැහැ, නිර්වාණය ගැන විස්තර කරමින් පොතක් ලියන්න ඕනෑ කියලා. ඒක තමයි 'නිර්වාණ විනිශ්චය' කියන පොත. එතකොට මගේ වයස අවුරුදු විසි නවයක් විතර ඇති. මේ පොත මුද්‍රණයෙන් පිට වුණාම සමහර දෙනා ඒක කියවන්නත් ඇති. ඒක ටිකක් ගැඹුරු කාරණා ඇතුළත් පොතක්. ඒක කියවන අයට ඒ තරම් රසයක් නොදැනෙන්නත් ඇති. නිර්වාණය ගැඹුරු දහමක්. තේරුම් ගැනීමත් අපහසුයි. තේරුම් කිරීමට සුදුසු වචන තෝරා ගැනීමත් හරි අමාරුයි. ඒ නිසා මං හිතනවා 'නිර්වාණ විනිශ්චය' පොත මගේ අනිත් පොත් තරමට කියවන අයට ප්‍රිය බවක් ඇති නූනාදෝ කියලා, කොහොම වුණත් මගේ සිංහල දැනුමත් ඔය වෙන කොට ඒ තරම් හොඳ නැහැ. ඔය කාලේ මං සිංහල දැනුම හදා ගන්න ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය වගේ පොත් කියෙව්වා. ඒවායේ තියෙන

වචනත් මට හුරු වුණා. ඔය 'නිර්වාණ විනිශ්චය' කියන පොතේ මං යොදලා තියෙන වචන හුඟාක් ඇර පැරණි පොත්වල තියෙන වචන කියලා මට හිතෙනවා.

**මහා නායක හාමුදුරුවන් පසුව ලියපු පොත්වල තියෙන භාෂාව හරිම සරලයි නේද ?**

මාත් හිතනවා එහෙමයි කියලා. 'නිර්වාණ විනිශ්චය' ලියූ භාෂාව මං ඒ පොතෙන් ම අවසන් කළා. අනෙක් පොත් ලිව්වේ බොහොම සරල සිංහලෙන්. ඇත්ත වශයෙන් ම මට උවමනා කළා ඔය නිර්වාණ විනිශ්චය පොත නැවත මුද්‍රණය නොකර ඒකෙන් ම අවසන් කරලා දාන්න. නමුත් මගේ අකමැත්ත මැද මේ ළඟදී ඒ පොත නැවත මුද්‍රණය කරලා තියෙනවා. මං පසුව ලිව්වනේ 'පටිච්ච සමුප්පාද විවරණය' කියලා පොතක්. ඒ පොතේ ඔය නිර්වාණය ගැනත් හොඳ විස්තරයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකයි මං 'නිර්වාණ විනිශ්චය' පොත නැවත මුද්‍රණය කරන්න එපා කියලා කිව්වේ. ඒ පොත අවසන් කරලා දාන්න ඕනෑ කියන හැඟීමක් මා තුළ තිබුණා. මං පොත් ලිව්වේ මුද්‍රණය කරලා විකුණලා මුදල් හම්බ කිරීමේ අදහසින් නොවෙයි. මගේ පොතක් වෙන කවුරුන් හෝ මුද්‍රණය කළාට, මගේ පොත්වල කොටස් උපුටා ගත්තාට, මගේ නමත් මකලා, වෙන කෙනෙකුගේ ම නමින් මුද්‍රණය කළාට, මගේ නම් කිසිම විරුද්ධකමක් නැහැ. ඒක නීති විරෝධී වුණාට මගෙන් නම් තහනමක් නැහැ.

මං පොත් ලිව්වේ පොදු ජනතාවට මේ උතුම් ධර්මය බෙදා දීමටත් වඩා **'මගේ සම්මෝහය දුරු කර ගැනීමටයි.'** ධර්මය ඉගෙන ගැනීමෙනුත්, පොත් ලිවීම සඳහා කරුණු රැස් කිරීමෙනුත්, ඒ සම්මෝහය දුරු වෙනවා කියලා කියන්න පුළුවන්.

# මේක බුරුම පන්සල
## (ශ්වේජින් නිකායේ මූලස්ථානය)

3

බුරුම ජාතික **යූ. විනයාලංකාර** හාමුදුරුවන් ආරම්භ කළ නිසා මේ පන්සලට ඒ නම කියනවා. ඒ ගැන මං මුලිනුත් කිව්වා. බුරුම පන්සල කිව්වාට බුරුමයේ පන්සල් වල තියෙන ඔක්කෝම වැඩ පිළිවෙල මෙහේ අනුගමනය කළේ නැහැ. එහෙම කරන්නත් බැහැනේ. නමුත් මුල් කාලයේ දී ඔය සියම් නිකායේ පන්සල් සමග වැඩි සම්බන්ධයක් තිබුණේ නැහැ. බටුවිට පන්සලත්, බොල්ගොඩ පන්සලත්, අපේම නිකායට අයිති ඒවා. ඒ නිසා ඒ පන්සල් දෙකත් සමග ළඟ සම්බන්ධයක් තිබුණා. නමුත් ඉක්මණින්ම සියම් නිකායේ පන්සල් සමගත් අපේ සම්බන්ධය ඇතිවුණා. දැන් නම් මොකවත් වෙනසක් නැහැ. කවුරුත් ඔහේ එකට එකතු වෙලා ආගමික කටයුතු කරනවා.

මා මේ බුරුම පන්සලට එන්න ඉස්සර වෙලා තවත් ස්ථාන කිහිපයකම ටික ටික කාලය ගත කළා. අවුරුද්දක් විතර වාසය කළ තැනක් තමයි කළුතර **"කුමරි කන්ද"** කියන පන්සල. එතන වස් කාලයකුත් ගත කළා. ඒ පන්සලේ හිටිය **කොත්මලේ සද්ධාවාස** කියල උගත් හාමුදුරු නමක්.

**බොල්ගොඩ පන්සලෙත්** මං සෑහෙන කාලයක් හිටියා. ඒ පන්සලේ හිටිය **ධම්ම ජෝති** කියන හාමුදුරුවන් අපවත් වුණයින් පස්සේ කටයුතු කර ගෙන ගියේ මං. ඒ ඉන්න අතර පුළුවන් තරමින් ඒ ස්ථානය දියුණු කළා. ආගමික කටයුතු බොහෝ විට ඉටුකර දුන්නේ මේ බුරුම පන්සලෙන්, සංඝයා වැඩමවා ගෙන ගිහිල්ලා.

**කිරිවත්තුඩුව** පැත්තේ රාමඤ්ඤ නිකායේ පන්සලකත් ටික කාලයක් මං නැවතිලා හිටියා. ඒ කාලේ ඒ පන්සල පාළුවට ගිහිල්ලා තිබුණ. ඒ පන්සල අයිති හාමුදුරුවන්ට තවත් හුගාක් පන්සල් තිබුණා. බොහෝ දෙනා ඒ හාමුදුරුවන්ට කිව්වේ "පන්සල් චක්‍රවර්ති" කියලා. ඒ හාමුදුරුවන් **මුල්ලේගම** හාමුදුරුනමක්. මං ඔහොම තැන් තැන්වල හිටියේ මෙහේ **අගගධම්මාලංකාර** කියන හාමුදුරුවෝ වැඩ සිටි නිසයි. ඒ කාලේ අවුරුදු දහයක් විතර තැන් තැන්වල ඉඳලා අගගධම්මාලංකාර හාමුදුරුවන් අපවත් වුණාට පස්සේ තමයි මං මෙහාට ආවේ. මේ ස්ථානයත් වැදගත් ස්ථානයක් නිසා ඒකත් දියුණු කරගෙන ඉන්න ඕනෑ කියන අදහසක් හිතට ආවා.

මුල් කාලයේ පන්සල් වල ඉඳීමේ අදහසක් මට තිබුණේ නැහැ. ආරණ්‍යයකට වෙලා බණ භාවනාවෙන් කල් ගෙවීමටයි හිතා ගෙන හිටියේ. එහෙම ආරණ්‍යය දෙක තුනකටත් මත් ගියා. නමුත් මට ඇති වෙච්ච අසනීපකම් නිසා, ඒ අදහස අත් හැරලා පන්සලට ම ආවා. ඉතින් එහෙම අදහස් වෙනස් වෙනවානේ. මුල සිටම මගෙ ආසාව වුණේ මේ උතුම් ධර්මය හොඳට දැන ඉගෙන ගන්න ඕනෑ කියන එකයි. මේ ධර්මය ලියලා කියලා ඒ පිළිබඳව දැනුමක් අනික් අයටත් ලබා දෙන්නට ඕනෑ කියන අදහසක් මට තිබුණේ නැහැ. ප්‍රථමයෙන් මා මේ ධර්මය දැන ඉගෙන එයින් ප්‍රතිඵලයක් ලබන්නට ඕනෑ කියන අදහසයි මට තිබුණේ. සසරින් එතර වීම සඳහා කටයුතු කිරීමයි මට උවමනා කළේ. නමුත් ඉතින් පන්සලකට වෙලා බණ දහම් කියමින් පොත් පත් ලියමින් වෙනත් ආගමික වැඩ සටහන් වලටත් යමින් එමින් කොහොමද ඒ සඳහා ම කටයුතු කරන්නේ. පුළුවන් තරමින් බණ භාවනාවක යෙදෙමින් කල් ගෙවනවා. සියලු කටයුතු වලට සහභාගි වෙමින් බණ භාවනා සඳහාත් එක්තරා ප්‍රමාණයකට කාලය ගත කළා. මුලු කාලයම ඒ සඳහා යොදා ගන්න නම් හොඳයි කියලත් දැන් හිතෙනවා.

අපේ ශ්වේජින් නිකාය ගැනත් මෙහි දී යමක් මම කියන්නම්. ධර්මාශෝක රජතුමාගේ ධර්ම දූත ව්‍යාපාරයේ ප්‍රතිඵල ලැබූ රටවල් අතර එක් රටක් තමයි ස්වර්ණ භූමිය. ඒක රාමඤ්ඤ රට කියලත් ප්‍රසිද්ධ වී තියෙනවා. ඒක අයත් වන්නේ පහත බුරුමයට යි. රාමාධිපති නම් රජතුමාගේ කාලය වන විට ශාසනික පරිහානිය වැඩි දියුණු වී ගිහිල්ලා උපසම්පදාවක් ඇතැයි ස්ථිර වශයෙන් නො පිළිගත

හැකි තත්ත්වයක් උදා වුණා. මේ අතර ශ්‍රී ලංකාවේ නිර්මල වූ උපසම්පදාව පවත්නා බව දැන ගෙන භික්ෂූන් වහන්සේලා හතළිස් අට නමක් මෙහාට ඇවිත් නිර්මල පැවිද්ද හා උපසම්පදාව ලබා ගත් බවත් ඉතිහාසයේ සඳහන් වෙනවා. ජයවර්ධනපුරයේ රජ කළ බුවනෙකබාහු රජුගේ කාලයේ දී කල්‍යාණි නදියේ උදකුක්ඛෙප සීමාවකදී විනය කර්මය කළ බවත් දැක්වෙනවා. හතළිස් අට නමක් උපසම්පදාව ලබා ගෙන රාමඤ්ඤ රටට (ස්වකීය රටට) ගිහිල්ලා සියලුම භික්ෂූන් වහන්සේලාට උපසම්පදාව ලබා දුන්නා. ඒ අනුව කලින් පැවති සොණුත්තර සංඝ පරම්පරාව අවසන් වෙලා මහාවිහාර පරම්පරාව ආරම්භ වුණා. ඒ මහා විහාර පරම්පරාවත් ක්‍රමයෙන් පිරිහෙන්නට පටන් ගත්තා. මේ ගැන බලවත් සංවේගයට පත්වූ "**ජාගරාභිධ්‍ය සද්ධම්ම වංශ ධම්මසේනාපති අතුලාධිපති සිරිපවර මහා ධම්ම රාජාධි රාජගුරු** ස්වාමීන්ද්‍රයන් වහන්සේ දුස්සීල භික්ෂූන් ගෙන් ඈත්වී ඔවුන් හා ධර්මාමිෂ සම්භෝගයෙන් වැලකිලා ශික්ෂාකාමී සිල්වත් භික්ෂු පිරිසක් ඇති කරගෙන ප්‍රත්‍යන්ත ප්‍රදේශයක වාසය කළා. කලින් කී දිග නම උන්වහන්සේට දුන්නේ රජතුමා විසින්. ඒක ගරු නමක්. උන්වහන්සේගේ නම **ජාගර** යන්නයි. උන්වහන්සේ උපන්නේ **ශ්වේජින්** නැමැති ගමේ. ඒ නිසාම උන් වහන්සේට **ශ්වේජින් ශයාඩෝ** නමත් කියනවා. බුරුමයේ උන්වහන්සේ ප්‍රසිද්ධ වී සිටියේ මේ නමින්. නමුත් ලංකාවේ උන් වහන්සේ ප්‍රසිද්ධ වුණේ "ජාගර" යන නමින්. උන්වහන්සේ වැඩ සිටියේ **මෙන්ඩුන් රජතුමාගේ** කාලයේ.

මේ රජතුමා ශ්‍රද්ධා බුද්ධි සම්පන්න රජ කෙනෙක්. පස්වන ධර්මසංගායනාව කරවලා ත්‍රිපිටක ධර්මය කිරිගරුඬ (සුදුගල්) පුවරුවල කොටවා තැබීම ආදී පින්කම් රාශියක්ම මේ රජතුමාගේ මූලිකත්වයෙන් සිදුවී තියෙනවා. එතුමා ධර්මවිනය ආඥා පනත නමින් ආඥා පනතක් නිකුත් කරලා බුදු සසුන පිරිසිදු කිරීමටත් උත්සාහ ගත්තා. නමුත් ඒක එච්චර සඵල වුණේ නැහැ. මෙන්ඩුන් රජතුමා කුමාර කාලයේ ඉඳලම ජාගර හිමියන් දැන ඇඳිනගෙන උන්වහන්සේ කෙරෙහි පැහැදිලා හිටියා. මණ්ඩලේ යන නමින් අභිනව නගරයක් කරවා එතුමා ජාගර හිමියන් මණ්ඩලේ නගරයට වඩම්වා ගත්තා. අභිනව සංඝාරාම පහක්ම සාදවා උන් වහන්සේට පූජා කළා. ඒ විතරක් නෙවෙයි, ජාගර හිමියන්ගේ මාර්ගයෙන් ශාසන සංශෝධනයක් කිරීමටත් එතුමා ක්‍රියා කළා. ජාගර හිමියන් ඒ ආරාම පාලනය කිරීම සඳහා වගන්ති විස්සකින් යුක්ත ධර්මාවවාද

ලේඛනයක් ද සකස් කර ගත්තා. උන්වහන්සේගේ පාලන ක්‍රමයේ හොඳකම නිසා ඒ ආරාම වල වාසය කරන භික්ෂූන් වහන්සේලා පර්යාප්ති ප්‍රතිපත්ති දෙකින්ම දියුණු වන්නට පටන් ගත්තා. ජාගර හිමියන්ගේ භික්ෂු පිරිස අතර රාජගුරු උපාධිය ලැබූ භික්ෂූන් වහන්සේලා විසි එක් නමක් ම වැඩ සිටියා. මේ තත්ත්වය නිසා අනෙක් බොහෝ භික්ෂූන් වහන්සේලාත් ජාගර හිමියන්ගේ පිරිසට එකතු වෙන්නට පටන් ගත්තා. ඉක්මණින්ම දහසකට අධික භික්ෂු පිරිසක් ඇති වුණා.

අළුත් නිකායක් ආරම්භ කිරීමේ අදහසක් ජාගර හාමුදුරුවන්ටත් මෙන්ඩුන් රජතුමාටත් තිබුණේ නැහැ. එහෙම වුණත් ජාගර හිමියන්ගේ භික්ෂු පිරිස රටේ කැපී පෙනෙන භික්ෂු පිරිසක් බවට පත් වුණා. ඒ නිසා රට වාසීන් **ශ්වේජින් ශයාඩෝ** යන ජාගර හිමියන්ගේ නාමය අනුව ඒ භික්ෂු පිරිස ශ්වේජින් නිකාය කියලා හඳුන්වන්නට පටන් ගත්තා. ශ්වේජින් නිකාය ආරම්භ වුණේ ඔන්න ඔය ආකාරයටයි. ශ්වේජින් නිකාය යන නම රටේ ඉක්මණින් ම පැතිරී ප්‍රසිද්ධියට පත්වුණා. ජාගර හිමියන් මේ නිකායේ මහා නායක පදවියට කවුරුවත් පත් කළේ නැහැ. නමුත් හැමදෙනාම උන්වහන්සේ මහා නායක හිමියන් වශයෙන් පිළිගත්තා. ශ්වේජින් නිකායේ ප්‍රධාන දායකයා මෙන්ඩුන් රජතුමා. නිකාය ආරම්භ වූයේත් එතුමා විසින් කරවූ රාජකීය ආරාමවලයි. ඒ නිසා මේ නිකාය රාජකීය නිකායක්. ජාගර හිමියන්ගේ කාලය තුළ මේ නිකාය නාම මාත්‍ර වශයෙන් තිබුණත් ක්‍රමානුකූලව පිළියෙළ වූ බවක් කියන්න අමාරුයි. උන් වහන්සේගේ අභාවයෙන් පසුව මේ නිකාය ඉදිරියටත් හොඳින් පවත්වා ගෙන යාම සඳහා මහානායක ධූරයට **"විසුද්ධාචාර ධජාධිපති පවර මහා ධම්ම රාජාධි රාජගුරු.** මහා ස්ථවිරයන් වහන්සේ පත්කර ගත්තා. උන්වහන්සේ ත්‍රිපිටක ධර්මය පිළිබඳව උසස් දැනුමක් ඇති මහා පඬිවරයෙක්. ඒ වගේ ම නොයෙක් ග්‍රන්ථයන් සම්පාදනය කළ මහා ගත් කරුවෙක්. ඉංග්‍රීසි ආණ්ඩුවෙන් අග්ග මහා පණ්ඩිත උපාධියක් උන්වහන්සේට පිරිනැමුවා. උන්වහන්සේගේ කාලයේ තමයි මේ නිකාය ක්‍රමානුකූලව සකස් වුණේ. උන් වහන්සේ විසින් නිකායේ අනාගත පැවැත්ම සඳහා වගන්ති තිහකින් යුතු කතිකාවතක්ද සම්මත කළා. දැනට ශ්වේජින් නිකාය පාලනය වන්නේ ඒ කතිකාවත අනුවයි. මේ වන විට මේ නිකාය ශ්‍රී ලංකාවටත් සියම් දේශයටත් පැතිරී තියෙනවා. බුරුමයේ දැනට ශ්වේජින් නිකායේ භික්ෂූන් වහන්සේලා පසළොස් දහසක් පමණ ඉන්නවා. විහාරස්ථාන දෙදහසක් පමණ තියෙනවා.

බුරුමයේ කළ **ජටඨ මහා සංගායනාවේ** බොහොමයක් වැඩ කළේ මේ නිකායේ භික්ෂූන් වහන්සේලායි. මේ ශ්වේජින් නිකායේ උපාධිධාරී බොහෝ පණ්ඩිත භික්ෂූන් වැඩ ඉන්නවා. ඒ වගේම බොහෝ ගත් කරුවන්, බොහෝ කර්ම ස්ථානාචාර්යවරුන් බොහෝ යෝගීන්, බොහෝ ආරණ්‍යයිකයන්, බොහෝ ධූතංගධාරීන්, ඇති නිකායක්. භාවනා ක්‍රම පිළිබඳව ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළ, සතිපට්ඨාන භාවනා ක්‍රමය ලෝක ව්‍යාප්ත කළ මහා කර්මස්ථානාචාර්ය **අග්ග මහා පණ්ඩිත මහා සීසසියාඩෝ භදන්ත සෝභන** මහා ස්ථවිරයන් වහන්සේත් ශ්වේජින් නිකායේ මහා තෙර නමක්.

ශ්වේජින් නිකාය ආරම්භ කළ ජාගර මහ තෙරුන් වහන්සේ 1872 ශ්‍රී ලංකාවටත් වැඩියා. උන් වහන්සේගේ වැඩම වීමෙන් පසුව ලංකාවටත් ශ්වේජින් නිකායේ ආභාසය ලැබුණා. ඉන් අනතුරුව බුරුමයේ ශ්වේජින් නිකායේ මහා නායක ස්වාමීන්ද්‍ර යන් වහන්සේගේ ශිෂ්‍ය නමක් වන යූ. විනයාලංකාර තෙරුන් වහන්සේ ලංකාවට වැඩියා. උන් වහන්සේගේ මූලිකත්වයෙන් තමයි මේ පන්සල පටන් ගත්තේ. ඒ නමින් තමයි මේ පන්සල හඳුන්වන්නේ. උන් වහන්සේගේ මූලිකත්වයෙන් මේ ස්ථානයේ දී කුල දරුවන් විසි හත් දෙනෙක් පැවිදි කළා. ප්‍රථම ශ්වේජින් නිකායික භික්ෂු පිරිස තමයි ඒ. මේ විනයාලංකාරාරාමය 1907 ජනවාරි මස 20 වෙනි දින යූ. විනයාලංකාර බුරුම නා හිමියන් ප්‍රධාන මහා සංඝ රත්නය උදෙසා සාංඝික කොට පූජා කළා. ඒ නිසා මේ පොකුණුවිට විනයා ලංකාරාරාමයේ තමයි ශ්‍රී ලංකාවේ ප්‍රථම ශ්වේජින් නිකායික සංඝයා විසින්ම සම්මත කළ ප්‍රථම බද්ධ සීමාව තියෙන්නේ. ඒ නිසාම මේ රටේ ශ්වේජින් නිකාය මුල් බැස ගත්තා කියලත් මට හිතෙනවා. ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකායේ ප්‍රථම මහා



**විනයාලංකාරාරාමයේ හෙවත් බුරුම පන්සලේ ආදි කර්තෘ බුරුම ජාතික යූ. විනයාලංකාර නා හිමි**

නායක ධූරය හෙබ වූයේ **උඩුවේ විමලරංසි** තෙරුන් වහන්සේ යි. දෙවන වර මහා නායක ධූරයේ වැඩ සිටියේ **දෙවිනුවර කදාණාවාස** මහ තෙරුන් වහන්සේ යි.

ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකාය දෙසිය පනස් නමක් පමණ භික්ෂූන් වහන්සේලා සිටින 70 ක් පමණ විහාරස්ථාන ඇති කුඩා නිකායක්.


## මගේ උපසම්පදාව බුරුම රටේ දී . . .

බුරුමයේ ඇත්තන් උපසම්පදා විනය කර්මය කරන්න ඉතාම හොඳට දන්නවා. ඒ වගේම හොඳට කරනවා. ශික්ෂා පද ගැනත් හොඳ අවබෝධයක් ඒ ඇත්තන්ට තියෙනවා. අපේ රටේ සමහර ඇත්තන් ඒ ශික්ෂා පද පිළිපැදීම තියා ඒ ශික්ෂා පද ටික ගැනවත් හරියට දන්නේ නැහැ.

බුරුම රටේ වස් කාලය අවසන් වේගෙන යන කොට භික්ෂූන් වහන්සේලා සඳහා විභාගයක් පවත් වනවා. ඒක තනිකරම කට පාඩම් ගැනීමේ විභාගයක්. උභය ප්‍රාති මෝක්ෂය, ඛුද්ද සික්ඛා, මූල සික්ඛා, වගේ පොත් සම්පූර්ණයෙන්ම කට පාඩම් ගන්නවා. මාත් ඔය විභාගයට පෙනී සිටියා. මං මුලින්ම පාඩම් දුන්නේ උභය ප්‍රාති මෝක්ෂයයි. කුදු සිකත් මට වැඩි හරියක් කට පාඩම්. භික්ෂූන් වහන්සේලා සඳහා ලිඛිත විභාග වගේම කට පාඩම් ගැනීමේ විභාගත් බුරුම රටේ සකස් වී තිබීම ඉතාම වැදගත් දෙයක් සේ මා සලකනවා. උපසම්පදාවත් ලබා ගෙන අර කට පාඩම් ගැනීමේ විභාගවලටත් පෙනී සිටීමෙන් පසුවයි මා ලංකාවට ආවේ. නමුත් මට සිංහලෙන් කිසිවක් කිරීමට හැකියාවක් තිබුණේ නැහැ. සිංහල භාෂාව ගැන මට දැනුමක් නැති නිසා මං තරමක් අසීරු තත්ත්වයකට මූණ දුන්නා. බුරුමයේ සිට ලංකාවට ඇවිත් මාස කීපයක්ම දෙමටගොඩ මහා විසුද්ධාරාමයේ ගත කළ බව මා කලින්නුත් සඳහන් කළා මතක ඇති. සිරිධම්ම හාමුදුරුවන් ශිෂ්‍යයනට උගන්වන විට පැත්තකින් අහගෙන ඉඳලා තමයි මං සිංහල වචන ටිකක් ඉගෙන ගත්තේ. උන් වහන්සේ ත්‍රිපිටක ධර්මය සිංහලෙන් ඉගැන්නුවා. මං සිංහලෙන් ලියන්න කාගෙන් වත් විශේෂයෙන් ඉගෙන ගත්තේ නැහැ. ඇත්තෙන්ම සිංහල මට හොඳට ලියන්න බැහැ. සිරිධම්ම හාමුදුරුවන් උගන්වන විට

අහගෙන ඉඳලා ලබා ගත් සිංහල දැනුමෙන් තමයි ඔය ඔක්කොම පොත් ලිව්වේ. මගේ පොත් වල සිංහල හොඳ ද ? නරක ද ? කියලා මා නම් දන්නේ නැහැ. මා දන්න සිංහලෙන් ලියූ දහම් පොත් දැන් විසි පහක් තිහක් අතර ගණනක් ඇති. මට නම් හරියට මතක නැහැ.

සිරිධම්ම හාමුදුරුවන්ගේ උනන්දු කිරීම අනුව මං පොත් ලියන්න පටන් ගත්ත බව කලිනුත් කිව්වා. මාත් ටික ටික ලියන්න පටන් ගත්තා. ඒ කාලෙ එහෙම පොත් ලිව්වාට ඒවා මුද්‍රණය කර ගන්න හරිම අමාරුයි. ඔය ජේ.බී ප්‍රනාන්දු වගෙ පොත් සාප්පු කාරයන් හිටියා. නමුත් ඒ වගේ අය මේ වගේ පොත් මුද්‍රණය කරන්න බය වුණා. මේවා මුද්‍රණය කරලා විකුණ ගන්න පුළුවන් වේවි ද කියලා විශාල බියක් තිබුණා. ඒ නිසා මං හුඟක් කල් නො ලියන් හිටියා. විසුද්ධාරාමයෙන් ආවාට පස්සෙත් ඔය එක එක්කෙනාගේ ඉල්ලීම් අනුව සඟරාවලට, පත්තර වලට, ලිපි ලියා දුන්නා මිසක් පොත් ලියන්න උනන්දුවක් ඇති වුණේ නැහැ.



**විනයාලංකාරාරාමයේ ශෙවජින් නිකායික සංඝයා විසින් සම්මත කළ බද්ධ සීමාව තෙමසකට පෙර අපවත් වී වදාළ හේන්ගොඩ කල්‍යාණ ධම්ම හිමියෝ ඉදිරිපස වැඩ සිටිති.**

# මං පොත් ලීවේ . . .

4

සමහර ධර්ම කාරණයක් හරියට තේරුම් ගන්න කාලයක් උත්සාහ අරගෙන මට ඒක හොඳට පැහැදිලි වුණාම ඒ ගැන පොතකුත් ලියා තිබ්බොත් හොඳයි කියලා බොහෝ විට හිතුණා. පටිච්ච සමුප්පාදය තේරුම් ගන්න මං හුඟාක් කල් උත්සාහ ගත්තා. ඒ අනුව මං පටිච්ච සමුප්පාදය තේරුම් ගත්තා. ඒ සඳහා පොතකුත් ලිව්වා. ඒ තමයි '**පටිච්ච සමුප්පාද විවරණය**'.

පාරමිතා ධර්ම ගැන නොයෙක් පොත් පත් ලියවිලා තියෙනවා. ගිහි පැවිදි බොහෝ දෙනෙක් ඒ ගැන ලිපි ලේඛනත් ලියලා තියෙනවා. නමුත් ඒවා කියවීමෙන් මගේ සිතේ ප්‍රසාදයක් ඇති වුණේ නැහැ. ඒ නිසා මං පාරමිතා ධර්ම විස්තර කිරිමට '**පාරමිතා ප්‍රකරණය**' කියලා පොතක් ලිව්වා.

'**විනය කර්ම**' පොත ලියන්නට හේතු වුණේ ඔය බණ්ඩාරවෙල මහ උල්පොත න්‍යග්‍රෝධාරාමය කියලා පන්සලක් තියෙනවා. මං සමහර විට ග්‍රීෂ්ම කාලවලට ගොහින් නතර වෙලත් ඉන්න තැනක්. දවසක් ඔය පන්සලේ පින්කමක් අවසන් වෙලා එතනට රැස්වෙලා හිටිය ඇත්තන් මගෙන් ඉල්ලීමක් කළා අනේ හාමුදුරුවනේ ! මේ විනය කර්ම කිරිමට හරියට නොදන්නා ඇත්තන්ට ඒ ගැන දැනුමක් තේරුමක් ඇති කර ගන්නට පොතක් ලියනව නම් කොච්චර වටිනවද ? කියලා. අන්න ඒ ඉල්ලීම අනුවයි මං '**විනය කර්ම**' පොත ලිව්වේ. 'විනය කර්ම, පොතේ තිබුණු පමණට කරන්න බැහැ. ඒ නිසා විනය කර්ම කිරීම පිළිබඳවත් පැහැදිලි කරමින් තමයි ඒ පොත ලීවේ. ඒක දැන් තුන් නිකායේම සංඝයා භාවිත කරන පොතක් වෙලා තියෙනවා. ඒ ගැන මං හරියට සතුටු වෙනවා.

**'සූ විසි මහ ගුණය'** මං ලිවේ තුනුරුවන්ට පූජාවක් වශයෙන්මයි. මං හිතනවා ඒ පොත ලිවීමෙන් මං තුණුරුවන්ට ලොකුම පූජාවක් කළා කියලා. ඒ වගේම ඒක මගේ ඕනෑකම නිසාමයි ලිව්වේ.

ඒ කාලේ කඳුබොඩ කරගෙන ගිය සතිපට්ඨාන භාවනා ක්‍රමයට විරුද්ධව ඇතැම් භික්ෂූන් කරුණු කියන්න ලියන්න පටන් ගත්තා. ඒ ඇත්තන් ලියන කියන දේවල් විවේචනය කරමින් යථා තත්ත්වය පැහැදිලි කර දීමටයි මං. **සතිපට්ඨාන භාවනා විවේචනය** කියන පොත ලිව්වේ.

**'ශාසනාවතරණය'** මං බොහෝම අගය කරන පොතක්. ඒක ලිව්වේ මේ රටේ මහණකම් කරන ඇත්තන්ටයි. අද මහණකම කරන සමහර ඇත්තන්ට ඒ පිළිබඳව කිසිම දැනීමක් නැහැ. දවසක් වයස්ගත හාමුදුරු නමක් මෙහාට ආවා. ඇවිදින් මට පුද පඩුරුත් පූජා කරලා කිව්වා නායක හාමුදුරුවන්ගේ පොත් ටික නැත්නම් මේ කාලයේ ඉන්න භික්ෂූන් වහන්සේලාට කරන්න දෙයක් නෑ කියලා. දෙවෙනි දවසෙත් ඔය විදියටම කියලා මට ගුරු පඩුරු පූජා කරලා හරියට සතුටු වුණා.

**'පට්ඨාන මහා ප්‍රකරණ සන්නය'** ලිවේ **මුණසිංහ** කියන නෝනා මහත්මියගේ ඉල්ලීම අනුවයි. එයා මගෙන් පට්ඨානය ඉගෙන ගන්න ආවා. ඉගෙන ගන්න අතරම මේකට සන්නයක් ලියන්න කියලත් මට ආරාධනා කළා. මුණසිංහ නෝනට පට්ඨානය මං ඉගැන්නුවේ බුරුම පොත බලාගෙනයි. අන්තිමට ඒ බුරුම පොත අනුව සන්නයක් ලිව්වා. **මුණසිංහ නෝනා** එයාගේ වියදමින් ඒක මුද්‍රණය කළා. ඇත්තම කියනව නම් මං මේකට සන්නයක් ලියන්න හරියට කම්මැලි වුණා. හේතුව මේවා ඉගෙන ගන්න අය, බලන අය දැන් මේ රටේ නැති නිසයි. හුඟක් මහන්සි වෙලා කරන වැඩකින් ප්‍රයෝජනයකුත් තියෙන්න එපායැ.

**'අභිධර්මයේ මූලික කරුණු'** පොත මං ලිවේ ඒ පිළිබඳ ලියලා තියෙන පොත් කීපයක් කියවා බැලීමෙන් පසුවයි. මට හිතුණා ඒවා ලියා තියෙන්නේ හරි හැටි කාරණා තේරුම් නොගෙන බව. අභිධර්මයේ එන ගැඹුරු කාරණා ගැන කියන්න ලියන්න භාෂාවේ වචන හිඟයි. ඒ නිසා මේ පොත මං හරි ප්‍රවේශමෙන් වචන තෝරා බේරා ගෙන තමයි ලියලා තියෙන්නේ. හැබැයි මං ඒ කාරණා හොඳට තේරුම් අරගෙනයි ලිවේ.

**'චත්තාලීසාකාර විපස්සනා භාවනා'** පොත ලිව්වේ දැන් ඉතින් අපත් ඒ සඳහා යොමු විය යුතුයි කියලා හිතාගෙනයි. භාවනා කරන අයට ඒ පොතෙනුත් ප්‍රයෝජනයක් ලැබෙන්න ඇති. මගේ භාවනා පිළිබඳ දැනුමත් ඒ පොත ලිවීමෙන් හුඟක් දියුණු වුණා. දැන් ඉතින් අන්තිම කාලෙට අපත් ඇවිදින්. ඒ නිසා මේ චත්තාලීසාකාර විපසසනා භාවනාවෙන් වාසය කිරීමට අධිෂ්ඨාන කරගෙන මාත් ඒ අනුව කල් ගෙවනවා.

**'බෞද්ධයාගේ අත්පොත'** බෞද්ධයකු වශයෙන් මුලින් ම කියවා දැන ගත යුතු කරුණු ඇතුළත් කොට ලියූ පොතක්. බෞද්ධකම අපට උපතින්ම ලැබුණත් එය උපතින් ම පිහිටන්නක් නොවෙයි. ඒ සඳහා මූලික දැනුමක් අවශ්‍ය වෙනවා. මේ පොත ඒ සඳහා උපකාර වන බවයි මගේ හැඟීම.

පින උසස් පහත් වන්නේ, අඩු වැඩි වන්නේ කරන තැනැත්තාගේ හොඳ නොහොඳකම් අනුවයි. තුණුරුවන් ගැන දැනුමක් නැතුව, වැඳුම් පිදුම් කළ යුතු වස්තු ගැන වැඳුම් පිදුම් කළ යුතු ආකාරය ගැන, ඒවායේ අනුසස් ගැන හරි දැනුමක් නැතුව ගතානුගතිකව කරන අයට එයින් උසස් පිනක් ලැබෙන්නේ නැහැ. උසස් පිනක් ලැබිය හැකි වන්නේ ඒවා ගැන දැනුමක් ඇතිව ක්‍රමානුකූලව පින් කරන අයටයි. අන්න ඒ දැනුම ඇති කිරීම සඳහා තමයි **'පුණ්‍යෝපදේශය'** කියන පොත මං ලිව්වේ.

මංගල සූත්‍රය වැනි වටිනා උපදේශ මාලාවක් අනාවරණය කරන වෙනත් සූත්‍රයක් නැති තරමයි. මිනිස් සමාජය විසින් අමතක කළ ගුණ දහම් මංගල සූත්‍රයෙන් නැවත නැවත අපට මතක් කර දෙනවා. මංගල සූත්‍රයේ ඇතුළත් මෙලොව පරලොව යහපත පිණිස හේතු වන මංගල කාරණා තිස් අටක් **'මංගල ධර්ම විස්තරය'** කියන පොතේ ඇතුළත් වෙනවා. ජීවිතයක් සාර්ථක කර ගැනීම සඳහා ආගම් භේදයකින් තොරව හැම දෙනා විසින්ම කියවිය යුතු පොතක් වශයෙන් මෙය ලියා සකස් කළේ අපවත් වී වදාළ මගේ ශිෂ්‍ය ගොඩිගමුවේ සෝරත ස්ථවිරයන් වහන්සේයි. පොත ලියන කොට මා ලියූ පත්‍රිකා හා අවශ්‍ය උපදෙස් මගෙනුත් ලබා ගන්නා. මංගල ධර්ම විස්තරය කාලීන වශයෙන් වැදගත් පොතක්.

බුදුරජාණන් වහන්සේලා ලෝකයේ පහළ වන්නේ **චතුරාර්ය සත්‍යය** ධර්මය දේශනා කිරීමටයි. ලෝකෝත්තර මාර්ග ඵල ලැබීමට නම් මේ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළ යුතුමයි. කාටත් පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි චතුරාර්ය සත්‍ය ධර්මය පැහැදිලි කරන්නට මං හුඟක් උත්සාහ ගත්තා. මං හිතනවා මගේ උත්සාහය බොහෝ දුරටම සාර්ථකයි කියලා. මේ පොතට ඉතාම වටිනා ප්‍රස්තාවනාවක් ලිව්වේ **අතිගරු බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක** ස්වාමීන්ද්‍රයන් වහන්සේයි. අදත් මං උන් වහන්සේට ඒ ගැන පින් දෙනවා.

අකුසල ධර්මවලින් මිදීමට සිත කිලිටි කරන ධර්ම ගැන අවබෝධයක් අපට තියෙන්න ඕනැ. අන්න ඒ අවබෝධය එක්තරා පමණකට හෝ ලබා දීමේ අරමුණ ඇතුවයි **'වංචක ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම'** කියන පොත මං ලිව්වේ. වත්ථ සූත්‍රයේ දක්වා තිබෙන චිත්තෝපක්ලේශ ධර්ම පැහැදිලි කරමින් තමයි ඔය පොත ලීවේ. කුසල් ස්වරූපයෙන් ඉදිරිපත් වී සිත රවටන, චිත්ත ස්වභාවය පැහැදිලි කිරීමක් මේ පොතින් කෙරෙනවා. මං හිතන හැටියට මේ පිළිබඳව මෙතෙක් ලියවී තිබෙන එකම පොත මේකයි. මේ **වංචක ධර්ම පොත** බොහෝ උගතුන්ගේ ප්‍රශංසාවට ලක් වූ බවත් මා දන්නවා.

සත්වයාගේ මෙලොව පරලොව යහපතටත් නිවන් ලැබීමටත් උපකාර වන ධර්ම විස්තර ඇතුළත් පොතක් තමයි මා විසින් සම්පාදනය කළ **'බුද්ධ නීති සංග්‍රහය'**. තුන් පිටකයේ පැතිර පවත්නා ඉතාම වැදගත් උපදේශ ගාථා පන්සිය පනහක් මේ පොතට ඇතුළත් වී තිබෙනවා. බුද්ධ නීති සංග්‍රහය කා හටත් එකසේ ප්‍රයෝජනවත් වන පොතක් හැටියට මට කියන්න පුළුවන්. මේ වැනි පොත් වෙනත් භාෂාවලට පරිවර්තනය කළ හැකි නම් එයිනුත් විශාල පිරිසකට යහපතක් වෙනවා කියලා මං හිතනවා.

බුදු, පසේ බුදු, මහ රහත් යනුවෙන් නිවන් දැකිය හැකි බෝධි තුනක් තියෙනවා. ඒ සත්‍යය අවබෝධ කර ගැනීමට උපකාර වන ධර්ම තිස් හතක් තියෙනවා. අන්න ඒ ධර්ම තිස් හත විස්තර කිරීමටයි **'බෝධිපාක්ෂික ධර්ම විස්තරය'** කියන පොත මං ලිව්වේ. නිවන් ප්‍රාර්ථනා කරන අය විසින් කිය විය යුතු පොතක් වශයෙන් මේ පොත හඳුන්වා දෙන්න පුළුවන්.

මේ හැරුණු විට එක එක වැදගත් මාතෘකා යටතේ තවත් පොත් ගණනාවක් මං ලිව්වා. බෞද්ධයකු වශයෙන් දත යුතු මූලික කරුණු ඇතුළත් පොත් ලිව්වා වගේම අභිධර්මය හදාරන අයට සහ මනෝ විද්‍යාත්මකව බුදු දහම අගය කරන අයටත් වැදගත් පොත් ගණනාවක් මා විසින් ලියා තිබෙනවා. අද මේ රටේ විශාල වශයෙන් භාවනා වැඩ පිළිවෙළ පැතිරිලා තියෙනවා. භාවනාව ගැන, විශේෂයෙන් **විදර්ශනා භාවනාව** ගැන පොත් කීපයක් මං ලිව්වා. ඒ වගේම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා විනය කර්ම පොත **'උපසම්පදා ශීලය'** වගේ පොත් කිහිපයකුත් ලිව්වා. කිසිවක් ලියන්න කියන්න බැරිව ඇස් දෙකම පේන්නේ නැතුව, කන් ඇහෙන්නේ නැතුව ඉන්න මට කලින් සඳහන් කළ හැටියට ඔය වගේ පොත් ටිකක් ලියන්නට ලැබීම ගැන මං හරියට සතුටු වෙනවා.

මේ වන විට මා විවිධ මාතෘකා යටතේ පොත් තිහකට ආසන්න ප්‍රමාණයක් ලියලා තියෙනවා. නමුත් මා මේ පොත් ලිව්වේ විශේෂ අරමුණක් ඇතුව නොවෙයි. පොත් ලිවීම ගැන මට විශේෂ අරමුණක් ඇති වුණා නම් මීට වඩා හොඳ පොත් පෙළක් ලියනවා. පොත් ලිව්වේ එක එක්කෙනාගේ ඒ ඒ අවස්ථාවල ඉදිරිපත් වෙච්ච ඉල්ලීම් අනුවයි. සමහර විට එක්කෙනෙක් හරි පිරිසක් වශයෙන් හරි ඇවිල්ලා මට කිව්වා, අසවල් ධර්ම කාරණය අපට පැහැදිලි නැහැ. නායක හාමුදුරුවන් ඒ ගැන මුකුත් ලිව්වොත් හොඳයි කියලා. මා ලිව්ව වැඩි හරියක් පොත් ඔන්න ඔය විදිහට එක එක්කෙනාගේ ඉල්ලීම් අනුවයි ලිව්වේ. ත්‍රිපිටකයේ තියෙන ඉතාම වටිනා ධර්ම කාරණා පැහැදිලි කර දීමටයි වැඩිම ප්‍රමාණයක් පොත් ලිව්වේ.

2500 යේ බුද්ධ ජයන්තිය නිමිති කරගෙන මං පොත් කීපයක් ලිව්වා. නමුත් බුද්ධ ජයන්තිය නිමිති කරගෙනම පොත් ලිවීම ආරම්භ කළා කියන්න අමාරුයි. මං ධර්මය ඉගෙන ගත්තේ හරි අමාරුවෙන්. ඒ නිසා මට හිතුණා මේ ධර්මය මාත් හොඳට තේරුම් අරගෙන අනෙක් අයටත් කියා දෙන්නට ඕනෑ කියලා. හැබැයි මුලදී ඒ වගේ හැඟීමක් මට තිබුණේ නැහැ. බුදු හාමුදුරුවන්ගේ ධර්මය ගැඹුරුයි. මේ ගැඹුරු ධර්මය පැහැදිලි අවබෝධයකින් තොරව ලියන්නට කියන්නට යාම හරිම නිෂ්ඵල වැඩක් කියල මට හිතුණා. ඒ විතරක් නෙමෙයි ඒක නුසුදුසු වැඩක් කියලත් මට හිතුණා. වැඩියෙන් ම මං උත්සාහ ගත්තේ මේ ගැඹුරු ධර්මය තේරුම් ගන්නයි, අවබෝධ

කරගන්නයි. සමහර ධර්ම කාරණා තේරුම් ගන්නට මං සති ගණන් මාස ගණන් කල්පනා කළා. ඒ අනුව මං හරියට තේරුම් නොගත්ත කිසිම කාරණයක් මගේ පොත්වල ලිව්වේ නැහැ. භික්ෂු විනය, විදර්ශනා භාවනාව, අභිධර්මය, මනෝ විද්‍යාව ආදී විෂයන්ට අයත් පොත් වගේම පොදුවේ සියල්ලන්ටම ප්‍රයෝජනවත් පොත් රාශියකුත් මං ලීවා. ගැඹුරු ධර්ම කාරණා ගැන වුණත් මං ලිව්වේ ඒ ගැන මට හොඳ නිරවුල් දැනුමක් ලැබුණට පස්සේ. මං දවසකට ලිව්වේ ටිකයි. මහන්සි වෙලා වෙහෙස වෙලා නිදි වරාගෙන ලිවීමක් මගේ නැහැ. මං හැමදාම ලිව්වේ හිරු එළියෙන් විතරයි. ලාම්පු පත්තු කරගෙන, ලයිට් දාගෙන මං කවදාවත් කිසිවක් ලිව්වේ නැහැ. ඒ වගේම මේසයක් උඩ තබාගෙන පුටුවක වාඩි වෙලා ඉඳගෙන ලිවෙත් නැහැ. මා වෙනුවෙන් ම හදා ගත්ත ටිකක් ලොකු පළල් පුටුවක් උඩ වාඩි වෙලා ලෑලි කෑල්ලක් උඩ තියාගෙන තමයි ඔය ඔක්කොම පොත් ලීවේ. මං ලියන ටික කවදාවත් දෙසැරයක් ලියන්නේ නැහැ. පළමුවෙනි වරට ලියන එකමයි මුද්‍රණයට යවන්නෙත්. සමහර පොත් මුද්‍රණය වෙමින් තිබෙද්දී එක එක කොටස් ලිය ලියා යැව්වා. මගේ අත් අකුරුත් ටිකක් ලස්සනයි කියලා ඒ දවස්වල හැමෝම කිව්වා. දැන් නම් එහෙම ලස්සනක් නැහැ.

හිරු එළියෙන් දවාලට ලිවීම තමයි හොඳ. ඇස් වලටත් ඒක හොඳයි. මට නම් ලියන්න ඕනෑ කළේ පෑනත්, කඩදාසියත්, ලෑලි කෑල්ලත් විතරයි. වෙන වෙන දේවල් ඒකට එකතු කර ගත්තේ නැහැ. හුඟක් දේවල් ඕකට එක්කාසු කර ගන්න ගියාම හරි කරදරයි.

අභිධර්මය ගැන පොත් කිහිපයක් ලියන්න ලැබීම ගැන මං වඩාත් සතුටු වෙනවා. මොකද 'ඒක හරි අමාරුයි, මොකවත් තේරෙන්නේ නැහැ' කිය කියා හුඟ දෙනෙක් අභිධර්මය ගැන බය වෙලයි හිටියේ. ඒ වගේම දහම් පාසල්වල ඉගෙන ගන්න ළමයින්නුත් කළේ චිත්ත, චෛතසික ලැයිස්තු කට පාඩම් කර ගැනීම විතරයි. නමුත් මගේ 'අභිධර්ම මාර්ගය' වගේ පොත්වලින් ඒ කාටත් හුඟක් ප්‍රයෝජන ලැබුණා කියලා මං හිතනවා. සමහර දෙනා මං ගැන කියනවා, මාත් අභිධර්මය ගැන මහ විශාරදයෙක් කියලා. ඒක එක්කෙනා එහෙම හිතුවට කිව්වට මොකද ? මං නම් එහෙම හිතන්නේ නැහැ. කියන්නෙත් නැහැ. හැබැයි ඉතින් මට එක දෙයක් කියන්න පුළුවන්. මුල ඉඳලම මට පුරුදු වෙලා තිබුණා කොච්චර කාලයක්

ගියත් කමක් නෑ ඉගෙන ගන්න දේ හරියට ඉගෙන ගන්න ඕනෑ කියලා. මෙන්න මේ නිසා මං බොහෝ ප්‍රශ්න විසඳා ගත්තා. සමහර කාරණා මාස ගණන් අවුරුදු ගණන් කල්පනා කරමින් ඉඳලයි තරමක් දුරට හරි විසඳා ගත්තේ.


මෙතෙන්දී මට පුළුවන් අනෙක් අයටත් උපදේශයක් දෙන්න. 'මොකක් හරි කමක් නෑ ඒ දේ හොඳට දැන ගන්න'. මට නම් පේන හැටියට මේ රටේ ගිහි පැවිදි වැඩි දෙනෙකුට අද මේ වගේ තත්ත්වයක් නැහැ. හැම එකෙන්ම ඩිංග ඩිංග දන්නවා. එකක් වත් හරියට දන්නේ නැහැ. ඊට වඩා හොඳයි නො දැන සිටීම.

**මහා නායක හාමුදුරුවන් තවමත් පොත් ලියනවද ?**

දැන් මං දුර්වලයි. ලියන්න බැහැ. අතේ ඇඟිලි පණ නැහැ. දැන් අවුරුදු හත අටක ඉඳලා පුංචි ලියුම් කෑල්ලක් හරි ලිව්වොත් ඒකෙත් තැන් තැන්වල අකුරු අඩු වෙනවා. ඒකත් කාට හරි පෙන්නලා තමයි තැපෑලට දාන්නේ. දැන් මගේ කාලය ගත වෙන්නේ භාවනාවෙන්, සිහියෙන්, කල්පනාවෙන්. මං කියන්නේ නැහැ මගේ මුළු කාලයම භාවනා කර කර ඉන්නවා කියලා. ඒ වුණාට මං උත්සාහ ගන්නවා හැකි තාක් සිහියෙන් කල්පනාවෙන් ඉන්න. ඒ අතර මං ත්‍රිලක්ෂණයත් මෙනෙහි කරනවා.

මං මෙතෙක් ලීව පොත්වලින් මේ රටේ ගිහි පැවිදි දෙපක්ෂයට ම එක්තරා ප්‍රමාණයකට හෝ සෙතක් වුණා කියලා මං හිතනවා. ඒක මට සතුටක්. මං පොත් ලියන්න පටන් ගන්න කොට දහම් පිපාසයෙන් සැහෙන පිරිසක් හිටියා. විශේෂයෙන් ගිහි, උගත් බෞද්ධ පිරිස. ඒ අයට කියවන්න සිංහලෙන් ප්‍රමාණවත් දහම් පොත් තිබුණේ නැහැ. මේ රටේ බහුතර පැවිදි පිරිසටත් මගේ පොත්වලින් යහපතක් වුණා. සමහර පොත් පැවිදි ඇත්තන් සඳහා ම ලියපු ඒවා. මගේ පොත් කියවලා ඒවායින් ප්‍රයෝජන ලබා ගත්ත ගිහි පැවිදි බොහෝ දෙනා තෑගි බෝගත් අරගෙන ඈත ප්‍රදේශවලින් පවා මාව බලන්නත් එනවා.

මං පොත් ලිව්වේ මුදල් හදල් හරි හම්බ කර ගන්න නෙමෙයි. එදත් ඒ වගේ අදහසක් මගේ හිතේ තිබුණේ නැහැ. අදත් නැහැ. මං කළේ පොත් ලිවීම විතරයි. මුද්‍රණය කරවීම ආදී අනෙක් ඔක්කොම



**දහම් පොත් තිස් ගණනක් ලිවීමට උපකාර කර ගත් ඒ ඓතිහාසික ලෑලි කැල්ල සහ වැඩ සිටි පුටුව**

වැඩ කටයුතු මුලින් කළේ මගේ ශිෂ්‍ය ගොඩිගමුවේ සොරත ස්ථවිර නම. ඒ නම මුද්‍රණය කළ මුල් පොත බුද්ධ ජයන්තිය මුල් කරගෙන 'චතුරාර්ය සත්‍ය'ය යි. එය මුද්‍රණය කළේ විනයාලංකාර නා හිමිගෙන් රු. 1000/-. මේ පන්සලේ ප්‍රධාන දායකව සිටි වැලිගම්පිටියේ **ඒ.ඩී. සුවාරිස් අප්පුහාමි**ගෙන් රු. 1000/- **වැලිගම්පිටියේ ලියෝරිස්** මුදලාලි මහතාගෙන් රු. 1000/- කුත් ණයට ඉල්ලා ගෙනයි. පොත් විකිණීමෙන් පසු ණය ගෙවල නැවත විදර්ශනා භාවනාව මුද්‍රණය පටන් ගත්තා. දැන් මගේ ශිෂ්‍ය හේන්ගොඩ කල්‍යාණධම්ම නම පොත් පත් මුද්‍රණය කරමින්, විහාරස්ථානය දියුණු කරමින්, නේවාසික භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා සපුරාලමින් මගේ පුංචි පුංචි ඕනෑ එපාකමුත් සම්පූර්ණ කරමින් කටයුතු කරනවා. මං ඒ ගැනත් හරියට සතුටු වෙනවා.

මගේ දහම් පොත් කියවීමෙන් එක එක්කෙනා ලබාගෙන තියෙන ප්‍රතිඵල ගැනත් වෙනම පොතක් ලියන්න පුළුවන්. ඒ තරමට ම කාරණා තියෙනවා. නමුත් දැන් නම් මට ඒක බැහැ. මං දුර්වලයි.

**නායක හාමුදුරුවන්ට ගෞරව උපාධි හා පදවි එහෙමත් ලැබී තිබෙනවා නේද ?**

ඉස්කෝලේ දෙවන පන්තියට ගිය මට මොන පදවියක්වත් උපාධියක්වත් ලැබේවි කියලා කවුද හිතුවේ. නමුත් ඉතින් ඔය ලැබී තියෙන්නේ. මුලදී මට මේ එකක්වත් තිබුණේ නැහැ. මං ඉතින් ඔර බුරුම රටේදී ලබා ගත් ඉගෙනීම අනුව ත්‍රිපිටක ධර්මය පිළිබඳවත්, පාලි භාෂාව පිළිබඳවත් තරමක දැනුමක් ලබා ගත්තා. ලංකාවට ආවාට පස්සේ එක එක්කෙනාගේ ඉල්ලීම් අනුව පොත් කිහිපයක් ලිව්වා. ඉන් පස්සේ තමයි ඔය පදවි ලැබෙන්නට පටන ගත්තෙ. ඉස්සර වෙලාම මට **ප්‍රාචීන භාෂෝපකාර සමාගමෙන් සම්මාන පණ්ඩිත** උපාධියක් ලැබුණා. ඊළඟට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ **අභිධර්මය පිළිබඳ මහාචාර්ය** පදවිය ලැබුණා. ඇත්ත වශයෙන්ම මං ඒක බාර ගත්තේ කැමැත්තකින් නොවෙයි. සතියකට එක දවසක් හරි වඩින්න කියලා මට ආරාධනාවක් ලැබුණා. අපේ **යක්කඩුවේ නායක** ස්ථවිරයන් වහන්සේගෙන්. ඒ නිසයි මං ඒක බාර ගත්තේ. ඉගෙන ගත්ත දෙයක් කාට හරි හොඳට උගන්වන්න ලැබෙනවා නම් ඒක සතුටක්. නමුත් ඒ කාලේ වුණත් උන්නාන්සේලා උගන්වන දේ හරියට ඉගෙන ගත්තේ නැහැ. සූත්‍ර, අභිධර්ම, විනය වගේ දේවල් ඉගෙන ගන්න ඒ දවස් වෙන කොටත් අපේ පැවිදි ඇත්තන් ඒ තරම් කැමැත්තකින් හිටියේ නැහැ. තවත් දෙයක් මං මෙහි දී කියන්නට ඕනෑ. මං ඒ විශ්ව විද්‍යාලයේ ඉගැන්වීමෙන් කිසිම වැටුපක් බලාපොරොත්තු වුණේත් නැහැ. මට ලැබිච්ච මුදලින් කොටසක් විද්‍යාලංකාරයේ දියුණුව සඳහාම පරිත්‍යාග කළා.

1963 වසරේ දී මට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් **සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය** ලැබුණා. 1976 වසරේදී **ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහා නායක** පදවියත් මට ලැබුණා. 1995 දී අමරපුර මහ සංඝ සභාව එක් වීමෙන් පසු **"අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන"** යන නම සහ අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයෙන් **"ප්‍රවචන විශාරද"** යන නමත් මට ලැබුණා. මේ පදවි - උපාධි මට පිරිනමන්නට ඇත්තේ මගෙනුත් මේ රටට ජාතියට සම්මා සම්බුද්ධ ශාසනයට යම්කිසි සේවයක් සිදුවී ඇති නිසා වෙන්න පුළුවන්.

# වර්තමාන භික්ෂු අධ්‍යාපනය කොහෙත්ම සුදුසු නෑ.

5

අද මේ රටේ භික්ෂූන් වහන්සේලා සඳහා සකස් වී තිබෙන අධ්‍යාපනය කොහෙත් ම සුදුසු නෑ. භික්ෂු ජීවිතයට අවශ්‍ය සියළු දේත් ත්‍රිපිටක ධර්මයත් මා ඉගෙන ගත්තේ බුරුම රටේ දී. බුරුම රටේ ආරාමවල තිබෙන අධ්‍යාපනය ඉතාම හොඳයි. අපේ රටේ පන්සල්වලත් ඔය කියන අධ්‍යාපනය ඉතා හොඳින් තිබුණා. මේ මෑතක් වන තෙක් තිබුණු ඒ ආරාමික අධ්‍යාපනය බොහෝම වටිනා එකක්. ගිහියන්ටත් වඩා භික්ෂූන් වහන්සේලාට ඒක වටිනව. නමුත් දැන්නම් ඒ ආරාමික අධ්‍යාපනය අපේ රටේ ආරාමවලින් බොහෝ දුරට ම ඈත් වී ගෙන ගිහිල්ලා. සිංහල, පාලි, සංස්කෘත, භාෂා පිළිබඳව ගැඹුරු පිරිසිදු දැනුම් සම්භාරය තිබුණේ පන්සල්වල. ඒ පිළිබඳ විශාරද පඬිවරු හිටියෙත් පන්සල් වල. විද්‍යෝදය, විද්‍යාලංකාර නමින් ආරම්භ වූ විශ්වවිද්‍යාල දෙකත් අහිමි වෙලා. ඒවායේ අයිතියත් ගිහියන්ට ගිහිල්ලා. දැන් භික්ෂූන් සිංහල, පාලි, සංස්කෘත ඉගෙන ගන්ඩ ගිහියන් ළගට යනවා. ඒ විතරක් නෙමෙයි. ධර්ම විනය දෙකම ඉගෙන ගන්නෙත් ගිහියන්ගෙන්. මොන තරම් නරක ප්‍රතිඵල ලැබුණත් අප සියලු දෙනාම බලාගෙන ඉන්නවා.

ඉස්සර ආරාමික අධ්‍යාපනය තුළින් හොඳ සාමණේර භික්ෂුවක් සකස් වුණා. සමහර විට උපසම්පදාව ලබන තෙක්ම ඒ අධ්‍යාපනය ප්‍රමාණවත් වුණා. තමන්ගේ ගුරුවරයා ළඟදී ම මහණ කමට අවශ්‍ය සියලු දේ ඉගෙන ගෙන අංග සම්පූර්ණ පැවිදි ජීවිත සකස් කර ගත් දැන උගත් පැවිද්දන් මේ රටේ සෑහෙන ප්‍රමාණයක් හිටියා. අදත් කලාතුරකින් ඉන්නවා. එකල ආරාමික අධ්‍යාපනයට ගැලපෙන සේ පිරිවෙන් අධ්‍යාපනය සකස් වී තිබුණා. ආරාමික අධ්‍යාපනයේදී කට

පාඩම් කරන පොත පත පිළිබඳව වැඩිපුර ඉගෙනීමක් ලැබුණේ පිරිවෙන තුළින්. ඒ නිසා හරි ලස්සනට මේ දෙක ගැලපී සිටියා. ඒ වගේම බාධාවකින් තොරව ශිෂ්‍යයන් ඉදිරියට ගියා. දැන උගත් පැවිද්දන් බිහි වුණා. ඒ නිසා භික්ෂූන් වහන්සේලා සඳහා ම යුගයට ගැලපෙන හොඳ අධ්‍යාපන ක්‍රමයක් සකස් වෙන්නට ඕනෑ. රටේ ජාතික අධ්‍යාපනය ගිහියන් සඳහා සකස් වී තියෙනවා.

භික්ෂූන් වහන්සේලාට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් ඉතා ඉක්මනින් සකස් කළ යුතුව තිබෙනවා. ඒක භික්ෂූන් වහන්සේලා සඳහා සකස් වූ ත්‍රිපිටකය මූල් කරගත් භික්ෂු අධ්‍යාපන ක්‍රමයක් විය යුතුයි. නමුත් එවැනි අධ්‍යාපනයක් සකස් වන බවක් පේන තෙක් මානයේවත් දකින්නට නැහැ. මේ එක්කම මා කියන්නට ඕනෑ ලංකාවේ සියලුම සංඝයාට බලපාන විදිහේ ක්‍රමවත් භික්ෂු සංවිධානයක් ද ඉතාමත්ම අවශ්‍ය බව.

තිසරණ පවා තේරුම් නොගත් බෞද්ධ ගිහි පිරිසකුත්, තිසරණය හරි හැටි තේරුම් කර දෙන්නට බැරි භික්ෂු පිරිසකුත් ඇතිවීම ගැන කාටද ඉතින් දොස් පවරන්නේ ?

අද පැවිදි වීමේ මූලික පරමාර්ථ බොහෝ දුරටම වෙනස් වී ඇති බවක් පේනවා. 'සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡි කරණත්ථාය' කියා පැවිද්ද ඉල්ලා හිටියට අද බොහෝ විට ඒ පරමාර්ථ නැහැ. බොහෝ තරුණ ඇත්තන්ගේ අදහස වී තිබෙන්නේ උපාධියක් සමත් වීම හා ඒ අනුව මුදල් ඉපයීමේ රැකියාවක් (පාසැල් ගුරු පත්වීමක් වැනි දෙයක්) ලබා ගැනීමයි. ඉගෙනීමත් බොහෝ විට ප්‍රථම උපාධියෙන් අවසන් කරනවා. වැඩිදුර ඉගෙනීම සඳහා උනන්දුව ඉතාම අඩුයි. පැවිද්දන් වශයෙන් අප මොන දේ කළත් මූලික පරමාර්ථවලින් සහමුලින් ම පිට පනින්න හොඳ නෑ.

අද ගුණ ධර්මවලින් විශාල පිරිහීමක් දකින්නට තියෙනවා. නමුත් ඒක පුදුම වෙන්න දෙයක් නෙමෙයි. කකුසඳ බුදු හාමුදුරුවන්ගේ ශාසනයත් කලක් තිබිලා පිරිහිලා ගියා. කෝණාගම බුදුහාමුදුරුවන්ගේ ශාසනයත් ඉක්මණින්ම පිරිහිලා ගියා. කාශ්‍යප බුදුහාමුදුරුවන්ගේ ශාසනයත් ඒ වගේම පිරිහිලා ගියා. ගෞතම බුදුහාමුදුරුවන් ගේ ශාසනයත් කාලයක් තිබිලා පිරිහිලා යාවි. මේ ගැන කවුරුවත්

දුක්වෙලා වැඩක් නැහැ. කලබල වෙලා වැඩක් නැහැ. ඇති වෙනවා, දියුණු වෙනවා, පිරිහිලා යනවා. ඒක ඉතින් ලෝකස්වභාව ධර්මය. සියල්ල ඇති වෙලා, පැවතිලා, නැති වෙලා යනවා, කියන එක අපේ බුදුහාමුදුරුවන්ගේ ධර්මයෙන් අප නිතර දකින අහන කියන එකක්. පිරිහීම සිදු වන්නෙත් ස්වභාව ධර්මය අනුවයි. කවුරු මොන තරම් උත්සාහ ගත්තත් මේ ශාසනය මුලින් තිබුණු තත්ත්වයට ගන්න කාටවත් පුළුවන් කමක් නැහැ. බුද්ධ කාලයේ තත්ත්වයට නොවෙයි අනුරාධපුර යුගයේ තත්ත්වයට වත් මේ ශාසනය නැවත ගන්න බැහැ.

මං හුඟක් සන්තෝෂ වෙනවා ශාසනය මේ තරමින්වත් පවතින එකට. භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය ගැනත් මට කියන්න තියෙන්නෙ ඒ ටිකමයි. මේ තරමින් වත් ශාසනික කටයුතු කරමින් මෙහි රැඳී සිටීම ගැන සියළු ඇත්තන්ට මං ප්‍රශංසා කරනවා. ඇත්ත වශයෙන්ම ඒ ඇත්තන් කරන්නේ මහා ප්‍රශංසනීය වැඩක්.

යමක් පරණ වුණාම සුළු සුළු අළුත්වැඩියාවන් කරලා ඒක පාවිච්චි කරනවා. ගෙවල් පරණ වුණාමත් අළුත්වැඩියාවක් කරලා නව ටික කලක් ප්‍රයෝජනයට ගන්නවා. ඇඳුම් පරණ වුණාමත් මහලා අණ්ඩ දාලා අඳින්න ගන්නවා. කෑම ටිකක් පරණ වුණාමත් සමහර විට රත් කරලා කෑමට ගන්නවා. බුද්ධ ධර්මය පරණ නූනත් ශාසනික වැඩ පිළිවෙල දැන් හුඟක් පරණ වෙලයි තියෙන්නේ. කොච්චර පරණ වුණත් නුවණ තියෙන එක්කෙනාට ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. ඒ වුණත් අද ඉන්න පැවිද්දන් මහ රහත් තත්ත්වයට පත් කරන්න බැහැ. එහෙම හිතන්නවත් එපා. අද මාර්ග ඵල ලැබීම අමාරුයි. මාර්ග ඵල නැහැ කියලා අද ඉන්න ඇත්තන්ට නින්දා කිරීමත් දොස් කීමත් වැරදියි. වර්තමාන සමාජයේ මහණකම කරන එක හරිම දුෂ්කරයි. බොහෝ පැවිද්දන් මා ළඟට ඇවිදිනුත් එහෙම කියනවා. මෙතෙන්දී මං කැමතියි බණ ටිකක් කියන්න.

"දවසක් ජම්බුඛාදක කියන පිරිවැජියා අග්‍ර ශ්‍රාවක ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේ ළඟට ඇවිදින් ඇහුවා, "ස්වාමීනි, ලෝකයේ දුෂ්කරම වැඩේ මොකක්ද කියලා. ඒ වෙලාවේ දී සැරියුත් හාමුදුරුවන් දුන් පිළිතුර තමයි, ලෝකයේ දුෂ්කරම වැඩේ මහණ කමයි කියලා. ඊළඟට පිරිවැජියා ඇසුවා මහණ වූ තැනැත්තාට දුෂ්කර දේ මොකක් ද කියලා. සැරියුත් හාමුදුරුවන් කිව්වා මහණ වූ තැනැත්තාට දුෂ්කර

දේ තමයි ඒකට සිත අලවගෙන ඉදීම කියලා. මහණකමට සිත අලවා ගෙන ඉන්න එක්කෙනාට දුෂ්කර දේ මොකක් ද කියලා ඊළඟට පිරිවැජියා ඇහුවා. මහණකමට සිත අලවාගෙන සිටින එක්කෙනාට දුෂ්කර දේ තමයි ධර්මානුකූලව පිළිපැදීම කියලා සැරියුත් හාමුදුරුවෝ ප්‍රකාශ කළා. ඒ නිසා මහණ කම දුෂ්කර එකක්. අන්න ඒ දුෂ්කර දේ මේ රටේ දහස් සංඛ්‍යාත පිරිසක් කරනවා. ඒ පිරිස විසි පන්දාහක් විතර වෙනවා කියලා සමහරු කියනවා. මේ දුෂ්කර වැඩේ කිරීම ගැන ඒ ඇත්තන්ට නැවතත් මා ප්‍රශංසා කනවා. මහණකම නො කරන එක්කෙනාට වඩා හොඳයි කරන එක්කෙනා. ඒ නිසා මේ රටේ පොදු ජනතාවගෙන් එක ඉල්ලීමක් කරන්න කැමතියි. පැවිද්දන්ට අවමන් කරන්න එපා. ඒ අය කරන්නේ දුෂ්කර අමාරු වැඩක්. මුල් කාලෙට වඩා පිරිහීමක් දක්නට තියෙනව නම් ඒක ස්වභාවිකයි. සියල්ලම අනිත්‍යයි. බුද්ධ ශාසනයත් නිත්‍ය දෙයක් නොවෙයි. මේ ශාසනය චිර කලක් පැවැත් වීමට නම් ගිහියන්ගේ ආධාරය ඕනෑ කරනවාමයි. ගිහියන් භික්ෂූන්ට දොස් කියන්න කියන්න වඩා ඉක්මනට පිරිහෙනවා.

**සගාරා අනගාරාච - උභො අඤ්ඤොඤ්ඤ නිස්සිතා**
**ආරාධයන්ති සද්ධම්මං - යොගක්ඛෙමං අනුත්තරං**

ගිහියෝද පැවිද්දෝද යන දෙපක්ෂය ඔවුනොවුන් නිසා ප්‍රතිපත්ති ප්‍රතිවේධ දෙක සම්පාදනය කෙරෙති. අර්හත්වය හා නිවන සම්පාදනය කෙරෙති.

# 6 අභිධර්මය බුද්ධ දේශනාවක්මයි

බුදුහාමුදුරුවන්ගේ ලොකුම දේශනාව අභිධර්ම දේශනාවයි. අනිත් ඔක්කෝම දේශනා මේ අභිධර්මයෙහි ඇතුළත්ව තියෙනවා. අභිධර්මය බුද්ධ දේශනාවක් නොවෙයි කිව්වොත් බුද්ධ චරිතයේ සමහර කාරණා වෙනස් කරන්න වෙනව නේද ? මව් තුමියට සළකන්න තව්තිසා දෙව් ලොවට වැඩම වීම වගේ කොටස් අයින් කරන්නත් වෙනව නේද ? අභිධර්මය බුද්ධ දේශනාවක් නොවෙයි කියන්නේ, ඒ ඒ අය ලබා ගෙන තිබෙන දැනුම අනුවයි.

බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වීමෙන් ලැබෙන විශිෂ්ඨ ධර්මය අභිධර්මය යි. මේ පිරිසිදු ධර්මය බුදු සස්නෙන් පිටත වෙන කොතනකවත් දකින්නට නැහැ. සූත්‍ර පිටකයේ තිබෙන බොහෝ කරුණු අභිධර්ම පිටකයේ තිබෙන ඒවා. ඒ වුණාට ඒ ධර්ම අභිධර්ම පිටකයේ මෙන් විස්තර කරල නැහැ. ක්‍රමානුකූලව විභාග කරලත් නැහැ. පැහැදිලි කරලත් නැහැ. ඒ නිසා බුද්ධ ධර්මය ගැන සම්පූර්ණ දැනුමක්, නිරවුල් දැනුමක් සූත්‍ර පිටකය පමණක් ඉගෙනීමෙන් ලබා ගන්න බැහැ. ධර්ම කථිකයකු වන්න, නිරවුල් ලෙස ධර්ම දේශනාවක් කරන්න අභිධර්මය ඉගෙන ගන්නම ඕනෑ. ධර්ම දේශනාවක වරද නිවරද සොයා ගැනීමට, ඇදකුද සොයා ගැනීමට, අඩු වැඩිකම් සොයා ගැනීමට, ඇති නූල ද, ලඹය ද, මට්ටම් ලෑල්ලද, කෝදු ලීය ද අභිධර්මය යි. අභිධර්මය නො දැන කරන ධර්ම දේශනාව දිග් නූල, ලඹය, මට්ටම් ලෑල්ල, කෝදු ලීය, පාවිච්චි නොකොට හදන ගෙයක් වගෙයි. මේ ගැන මං අභිධර්මයේ මූලික කරුණු කියන පොතේ සංඥාපනයේ විස්තර සහිතව ලියලා ඇති. යම් කෙනෙකු යම් ධර්ම කාරණයක් ඇසුවාම ඒක හරියට කියා දෙන්න පුළුවන් අභිධම්මිකයනට බවයි සඳහන්ව තියෙන්නේ.

ලෞකික ලෝකෝත්තර ධර්මයන්ගේ තත්වය ප්‍රකාශවන අභිධර්මය තථාගතයන් වහන්සේ බුදු බවට පැමිණ සතරවන සතියෙහි බෝ මැඩට පශ්චිම දිසාවෙහි වැඩ සිට සතියක් මුළුල්ලෙහි සම්මර්ශනය කළ බව බුද්ධ චරිතයෙහි සඳහන් වෙනවා. අභිධර්මය ප්‍රකරණ වශයෙන් හතකට බෙදෙනවා. එයින් ධම්මසඞගණී ආදී ප්‍රකරණ සය සම්මර්ශනය කිරීමේ දී බුදුරාජාණන් වහන්සේගේ ශරීරයෙන් බුදු රැස් නික්මුනේ නැහැ. අනන්ත නය සමන්වාගත මහා පට්ඨාන ප්‍රකරණයට පැමිණියාම තථාගතයන් වහන්සේගේ සිත අතිශයින්ම ප්‍රසන්න බවට පත්වුණා. සිත ඇසුරු කළා වූ ලේ ධාතුව ද එයින්ම පිරිසිදු වුණා. ලේ ධාතුව පිරිසිදු වූ විට තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් නීල පීතාදී ෂට් වර්ණ බුද්ධ රශ්මිය නික්මෙන්නට පටන් ගත්තා. සතියක් මුළුල්ලෙහි තථාගතයන් වහන්සේ සිතින් මෙනෙහි කළ ධර්මය වර්ෂ සියයක්, දහසක් දේශනා කළත් අවසන් නොවන තරම් විශාල වෙනවා.

බුදුබවට පත් වී සවන සතියෙහි තව්තිසා දෙව් ලොවදී මාතෘ දිව්‍ය රාජයා ප්‍රධාන දස දහසක් සක්වලින් පැමිණි දිව්‍ය, බ්‍රහ්මයන්ට ඒ ධර්මය හකුළුවා තුන් මසකින් දේශනා කොට වදාළා. තථාගතයන් වහන්සේගේ තොල් දෙක මනාසේ ස්පර්ශ වෙනවා. දිව ඉතාමත් මෘදුයි. ඒ නිසාම වචන පිට වීම ඉතාම වේගවත් වෙනවා. උන්වහන්සේ දන් වළඳා ඉක්බිතිව පැමිණි පිරිසට වදාරන්නා වූ අනු මෙවෙනි බණ මදක් වැඩි කොට දේශනා කරනොත් බණවර හැට හතරකින් යුක්ත වූ දීඝ නිකාය තරම් වෙනවා. සවස් කාලයෙහි විහාරයට බණ ඇසීමට පැමිණෙන අයට දේශනා කරන්නා වූ එක බණක් අංගුත්තර, සංයුක්ත නිකාය දෙකට සමාන වනවා. ස්වල්ප කාලයකින් දේශනා කරන ධර්මය මේ තරම් විශාල නම් තෙමසක් මුළුල්ලෙහි නොනවත්වා පවත්වන ලද අභිධර්ම දේශනාව කෙතෙක් දීර්ඝ වේ දැයි සිතා ගන්නට පුළුවන්. එය පොත්වල ලිවේ නම් කොතරම් විශාල පොත් ගොඩක් ලැබේද ?

තුන් මසක් මුළුල්ලෙහි නොනවත්වා පවත්වන ලද මෙපමණ මහත් දේශනාවක් අහන්නට මිනිසුන් සමර්ථ වෙන්නේ නැහැ. ඒ නිසාම මේ ධර්මය දෙවියන්ට දේශනා කළා. දෙවියන්ට දහම් දෙසන අතර තථාගතයන් වහන්සේ දහම් දෙසීමට බුදු රුවක් නිර්මාණය කොට දින පතාම ආහාර කෘත්‍යය සඳහා මිනිස් ලොවට වැඩම වූ

බවත් සඳහන් වෙනවා. බුදෙධාපස්ථානය සඳහා දම් සෙනෙවි ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේ පැමිණියාම දෙවියන්ට දෙසූ මේ ධර්මය උන්වහන්සේට ඉතා සංක්ෂෙපයෙන් දේශනා කරනවා. ශාරිපුත්‍ර හාමුදුරුවන් ඒ ධර්මය නය දහසින් නය ලක්ෂයෙන් තේරුම් ගන්නවා. එහෙම දැන ගත් අභිධර්මය උන්වහන්සේ තමන් වහන්සේගේ පන්සීයක් පමණ අතැවැසි භික්ෂූන්ට උගන්වනවා. අද පවත්නා මේ අභිධර්මය තථාගතයන් වහන්සේ විසින් ශාරිපුත්‍ර මහ රහතන් වහන්සේට දේශනා කොට වදාළ උන්වහන්සේ විසින් ස්වකීය අතැවැසි පන්සියක් භික්ෂූන්ට උගන්වා වදාළ ඒ ශ්‍රේෂ්ඨ ධර්මය යි. එය තථාගත දේශනාවක්මයි.

සප්ත ප්‍රකරණයෙන් කථාවත්ථු ප්‍රකරණය බුදු රාජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් දෙසිය අටළොස්වෙනි වර්ෂයෙහි මොග්ගලීපුත්ත මහරහතුන් වහන්සේ විසින් වදාරණ ලද්දක්. එය තථාගතයන් වහන්සේ උන්වහන්සේ උදෙසාම තබා වදාළ මාතෘකාවට අනුව දෙසා වදාළ නිසා එය බුද්ධ භාෂිතයක්ම යි.

**දැනට මේ රටේ වැඩ ඉන්න අභිධර්ම විශාරදයා මහානායක හාමුදුරුවෝ තමයි කියලා බොහෝ දෙනා කියනවා.**

කව්ද කියන්නේ ?

මේ රටේ වැඩිම දෙනෙක් කියනවා.

අනේ ! මම නම් ඒක දන්නේ නැහැ.

**ඒ විතරක් නෙමෙයි. අභිධර්මය වැනි දුෂ්කර ගැඹුරු විෂයයක් පොදු මහ ජනතාව අතර ජනප්‍රිය කරවීමේ ගෞරවය මහා නායක හාමුදුරුවන්ට ලැබෙන බවයි බොහෝ දෙනාගේ හැඟීම.**

ඒ ගැන මං මොකවත් දන්නේ නැහැ. මං ඉතින් ඔය අභිධර්ම මාර්ගය, අභිධර්මයේ මූලික කරුණු වගේ පොත් දෙකක් ලීවා. ඒ පොත් වලිනුත් ගිහි පැවිදි දෙපක්ෂයටම යම් කිසි ප්‍රයෝජනයක් වෙන්නට ඇතැයි කියලා මං හිතනවා. මං ලියන්නට කලිනුත් අභිධර්මය ගැන පොත් ලියවිලා තිබුණා. ඒ පොත් වලින් වැඩි හරියක්

මිනිසුන්ට කියවලා අභිධර්මය තේරුම් ගන්න බැරි ඒවා. මං කළේ ටිකක් සරලව මං තේරුම් ගත්ත විදියට ලියන එකයි. අභිධර්මය සරලව ලියන එක හරි අමාරු වැඩක්. අභිධර්මයේ එන ඒ ඒ කාරණා වලට ගැළපෙන සිංහල වචන තෝරා බේරා ගැනීම හරිම අපහසුයි. ලොකුම දුෂ්කරතාව ඒකයි. කෙනෙක් අපව කිතිත්තුවාම ඇති වන වේදනාව එකක්. පිච්චුනාම ඇතිවන වේදනාව වෙන එකක්. මොකක් හරි ඇඟට ඇනුනාම ඇතිවන වේදනාව තව එකක්. නමුත් මේවා වෙන වෙනම කියන්න කෝ වෙන වෙන වචන.

**මහානායක හාමුදුරුවන් අභිධර්මය ගැන මේ ගැඹුරු දැනුම ලබා ගත්තේ කොහොමද ?**

පොත් කියවීමෙන් හා කල්පනා කිරීමෙන්. මං නිකන් සිටින සෑම වෙලාවකම වගේ ගැඹුරු ධර්ම කාරණා ගැන කල්පනා කරනවා. රාත්‍රී කාලයෙත් බොහෝ විට මං ඒක කරනවා.

**වැඩිපුර දැනුම ඇති කර ගත්තේ බුරුම රටේදී ද ?**

නැහැ. බුරුමෙ හිටියෙ කුඩා කාලයේ ඉඳලා අවුරුදු දහයක විතර කාලයක්. උපසම්පදාවත් ලබන කම්ම හිටියා. බුරුමේදී හරියට කට පාඩම් කළා. මගේ මේ දැනීම මා විසින්ම දියුණු කර ගත්ත එකක්.

**සත්‍යය අවබෝධ කර ගැනීමට අභිධර්මය දැන ගැනීම අවශ්‍යමද ?**

සත්‍යයමයි අභිධර්මයේ තියෙන්නේ. අභිධර්මයේ කියන හැටියට අවබෝධ වුණොත් තමයි සත්‍යය අවබෝධ වන්නේ.

**ඒක තව ටිකක් පැහැදිලි කරන්න.**

වචන හැදෙන්නේ කොහොමද කියලා කල්පනා කරන්න. පොල් ගෙඩියක් ඇසට පෙණුනාම ඒ අනුව ලකුණක් කර ගන්නවා. ඒ අනුවයි වචනයක් හැදෙන්නේ.

ඒ වචනය, එහි අර්ථය වැටහෙන්නේ ඒ කියන එක්කෙනාට විතරයි. වෙන කාටවත් ඒක තේරෙන්නේ නැහැ. ඒ නිසා නියමාර්ථය

දැක්වෙන දේශනාව තමයි අභිධර්ම දේශනාව කියන්නේ. මාත් ඉතින් කල්පනා කරලා කරලා ඔය ධර්ම කාරණා ටිකක් තේරුම් අරන් තියෙනවා මිසක් ඔක්කොම ධර්ම කාරණා මටත් වැටහෙන්නේ නැහැ.

මොනම භාෂාවක්වත් නොදන්නා කෙනෙකුට ගලක් පෙණුනා කියලා හිතමු. එයා ඒ ගල දැකලා හිතින් ලකුණක් කර ගන්නවා. අන්න ඒ අනුවයි ඒකට වචනයක් හැදෙන්නේ. එයා ඒ වචනය කීවාට අර්ථය තේරෙන්නේ එයාට විතරයි. වෙන කාටවත් තේරෙන්නෙ නැහැ. ගල දැකලා ගල හඳුනන්නේ නැති එක්කෙනාට ගල ගැන කොච්චර කීවත්, ඒක මොකක් ද කියලා තේරෙන්නේ නැහැ. ඉතින් මේ ලෝක ව්‍යවහාරය තියෙන්නෙ යම්යම් දෙනා යම් යම් දේ දැකලා ඒ අනුව තියා ගත්තු ලකුණු අනුව හැදිච්ච වචන තමයි. ඒක ඒ වචනය හදා ගත්ත එක්කෙනාට තේරෙනවා. අනිත් කෙනෙකුට තේරෙන්නේ නැහැ. භාෂාවල වචන හිඟකම තමයි අභිධර්මය පැහැදිළි කරදීමට තියෙන අපහසුව. අප මේ එක වචනයක් කතා කරන කොට බුදු හාමුදුරුවෝ වචන 64 විතර කතා කරනවා.

**නායක හාමුදුරුවනේ, අභිධර්මයේ මූලික කාරණා පවා පැහැදිළි කර දිමට දක්ෂ අය අද ඉතාමත් අඩුයි. විශාල පිරිහීමක් දකින්නට තියෙනවා. මොකද ඒකට හේතුව ?**

හොඳට දැන ගෙන හිටිය අය දැන් අඩුයි. ඉගෙන ගන්න අයත් අඩුයි. මුල දී අභිධර්මය ඉගෙනීම විශේෂ වශයෙන් තිබුණා. දැන් එහෙම නැහැ.

**චිත්ත, චෛතසික, රූප යන ධර්ම පරමාර්ථ ධර්ම ලෙසින් අභිධර්මයෙහි හැඳින්වීමේ යුක්තිය කුමක්ද ? ඒවා වෙනස් නොවේද ? නොබෙදිය හැකිද ?**

චිත්තය බෙදන්න බැහැ. ඒක එකක්. චෛතසිකත් බෙදන්න බැහැ. රූපත් ඒ ඒ හැඩය අනුව පවතිනවා. බෙදන්න බැහැ. මූලික අභිධර්මයේ උගන්වන්නේ මේ සියල්ලම ක්‍රියා කියලා. ද්‍රව්‍යයක් නැහැ. සියල්ලම ක්‍රියා. වෙනස් වෙනවා, කියන එකක් මේවායේ නැහැ.

අභිධර්ම පොත්වල දක්නට ලැබෙන හැටියට නම් ඇත්තේ පරමාර්ථ ධර්ම අසූ දෙකයි. මේ අසූ දෙක කොටින් කියනවා නම් චිත්තය, චෛතසිකය, රූපය, නිර්වාණය කියලා හතරයි.


පරමාර්ථ ධර්ම ගස් ගල් වගේ විශාල ලෙස ඇස්වලට පෙණෙන ඒවා නොවෙයි. පරමාර්ථ සියල්ලම ක්‍රියා. අද්‍රව්‍යයි. මේ ක්‍රියා තත්ත්වය මැනවින් වටහා නොගත් කෙනෙකුට පරමාර්ථයන්ගේ තත්ත්වය වටහා ගැනීම අපහසු වෙනවා. ක්‍රියා තත්ත්වය අවබෝධ කර ගත්තාම ඔහුට පරමාර්ථ තත්ත්වය අවබෝධ කර ගැනීම පහසු වෙනවා. ද්‍රව්‍ය මෙන් ක්‍රියාව ඇසට පේන්නෙ නැහැ. ලෝකයේ ක්‍රියා වශයෙන් සලකන දේ වලින් වැඩි හරියක් ද්‍රව්‍යවල චලනය මයි. ද්‍රව්‍යය ඇසට පේනවා. ක්‍රියාව ඇසට පේන්නේ නැහැ. ක්‍රියාව ද්‍රව්‍ය දෙස බලා ඒ අනුව සිතින් දත යුත්තක් වෙනවා.

**ධර්මය නො දැන භාවනාවෙන් පමණක් ප්‍රතිඵලයක් ලැබිය හැකිද ?**

බුදු, පසේ බුදු, උතුමන් විසින් මේ ධර්මය තම තමන් විසින්ම අවබෝධ කර ගන්නවා. නමුත් සැරියුත් මහ රහතන් වහන්සේ වැනි මහ තියුණු නුවණක් ඇති උතුමෙකුට වුණත් සද්ධර්ම ශ්‍රවණය, ධර්මාවබෝධය සඳහා අවශ්‍ය වෙනවා. ඒ නිසා ධර්මය ඇසීම, ධර්මය දැන ගැනීමටත්, ධර්මය අවබෝධ කර ගැනීමටත් අවශ්‍යම බවයි මට කියන්නට තියෙන්නේ.

අද මේ රටේ කෙරන භාවනා වැඩ පිළිවෙළවල් ගැන නම් මං සතුටු වන්නේ නැහැ. මට නම් හිතෙන්නේ හුඟ දෙනෙක් මුලා වෙලා කියලා. ධර්මය නො දැන කොහොම ද භාවනා වඩන්නේ. ධර්මය ගැන හොඳ දැනුමක් මුලින් ඇති කර ගන්න ඕනෑ. ඒ වගේම භාවනාව ගැනත් තරමක හෝ දැනුමක් ඇති කර ගන්න ඕනෑ. අද භාවනාව හුඟාක් අසාර්ථක වෙලා තියෙන්නේ ඒ ගැන දැනුමක් තේරුමක් නැති නිස යි. මුලින් ම කෙනෙකුට භාවනා ක්‍රමයක් දීම වැරදියි. භාවනාව ගැන දැනුමක් තේරුමක් මුලින් ලබා දෙන්නම ඕනෑ. අද නම් ගිය හැටියේ ම දෙන්නේ භාවනාවක්. නමුත් ඒ භාවනාව ගන්න එක්කෙනාට ඒ ගැන කිසිම තේරුමක් නැහැ. මේ රටේ භාවනා දෙන බෙහෝ දෙනාට (භාවනා ආචාර්යවරුන්ටත්) ඒ පිළිබඳ තියෙන දැනුම ඉතාම ස්වල්පයි. එහෙම තියනෙ කොට කොහොම ද භාවනාවෙන් ප්‍රතිඵල ලබා ගන්නේ ?

අද යොදා ගෙන තියෙන භාවනා පන්ති. භාවනා පාඩම්, භාවනා මධ්‍යස්ථාන ගැනත් මං යමක් කියන්නට ම ඕනෑ. අද තියෙන විදිහේ වැඩ පිළිවෙළක් ත්‍රිපිටකයේ කොහේ වත් මට නම් දකින්නට ලැබිලා නැහැ. බුද්ධ කාලයේ ඒ ඒ අය බුදුරජාණන්වහන්සේ ළඟට ඇවිදින් කර්මස්ථාන ලබා ගෙන ගිහිල්ලා භාවනා වැඩුවා. ඒ ඒ පුද්ගලයන්ගේ චරිතානුකූලව සුදුසු කර්මස්ථාන බුදුරාජාණන් වහන්සේ විසින් දී වදාළා. කර්මස්ථාන ලබා ගෙන විවේකස්ථාන සොයා ගෙන ගිහිල්ලා, භාවනා වැඩුයේ පන්ති වශයෙන්, කණ්ඩායම් වශයෙන් නෙමෙයි. තැන් තැන් වලට වෙලා උත්සාහයෙන් වීර්යයෙන් කෙලෙසුන් නැති කිරීම සඳහා භාවනා වැඩුවා. අද වගේ සිය දහස් ගණන් එක තැනකට රැස් කර ගෙන කරන භාවනා වැඩ පිළිවෙළක් ගැන මා දන්නේ නැහැ.



**මා නිතර ත්‍රිලක්ෂණය මෙනෙහි කරනවා**

කඳුබොඩ වගේ ස්ථාන කිහිපයක කෙරෙන භාවනා වැඩ පිළිවෙළ හොඳයි. ඒ වුණත් එක එක වකවානුවල ඒක කරවන අය අනුව, වඩාත් හොඳ වෙන්නත් පුළුවන්. වඩා හොඳ නො වෙන්නත් පුළුවන්. හොඳ තේරුමක් දැනුමක් පළපුරුද්දක් ඇතුව ක්‍රියා කරනව නම් කොතනත් හොඳයි. අද මේ රටේ කෙරෙන භාවනා වැඩ පිළිවෙළ වැඩක් නෑ කියලම කියන්න මම ඉක්මන් වන්නේ නැහැ. ඒවා හොඳ පිත් සිද්ද වෙන දේවල් වශයෙන් මං සලකනවා. හැබැයි බොහෝ තැන්වලින් භාවනාව එක්තරා ප්‍රමාණයකටවත් මුදුන් පත්වීමක් නම් සිදු වන්නේ නැහැ. හැම භාවනා ක්‍රමයක් ම හැම දෙනාටම සුදුසු වන්නෙත් නැහැ. අසවල් භාවනාව, අසවල් පුද්ගලයාට සුදුසු යි, කියලා හරියට ම නියම කරන්න පුළුවන් කම තිබුණේ බුදු හාමුදුරුවන්ට පමණ යි. අද වුණත් ධර්ම විනයධර, බහුශ්‍රැත, භාවනාව පිළිබඳ තරමක් හෝ දැනුමක් ඇති ඇත්තන්ට යමෙකු කාලයක් ඇසුරු කිරීමෙන් පසුව පුළුවන්කම තියෙනවා සුදුසු භාවනාවක් නියම කරන්න. ඒ ඒ පුද්ගලයාගේ චරිතය තරමක් දුරට හෝ තේරුම් ගැනීමෙන් පසුවයි භාවනාවක් නියම කරන්න ඕනෑ.

මං ඉතින් ලොකුවට ලෝකයට කියන්න කැමති නැහැ දැන් මගේ මුළු කාලයම භාවනාවට ගත කරනව කියලා. කවදත් සිහියෙන් කල්පනාවෙන් තමයි මා කටයුතු කරන්නේ. නිතර නිතර මං ත්‍රිලක්ෂණය මෙනෙහි කරනවා. ඔය කඳුබොඩ කරන භාවනාව මුලින්ම මේ රටට හඳුන්වා දුන්නේ මායි. ඒක ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ බුරුම හාමුදුරුවන්ගේ භාවනාවක් හැටියටයි. කඳුබොඩ කෙරෙන්නේ පුරාණ සතිපට්ඨාන භාවනාවමයි. අළුත් අළුත් භාවනා පටන් ගන්නටම වැඩක් නැහැ. ඒවා කරවන අයත් යම් කිසි ප්‍රමාණයකටවත් භාවනාවෙන් දියුණුවක් ලබා ගෙනයි ඒක පටන් ගන්නට ඕනෑ. අද නම් බැලුවාම ඒ තත්ත්වය හුඟක් අඩුයි. සමහර විට තමනුත් මුලා වී අනුනුත් ඒ තත්ත්වයට දැමීමක් වශයෙනුයි මට පේන්නෙ. ඒකෙන් යහපත් ප්‍රතිඵලයක් ලැබෙයි කියලා මට නම් කියන්න බැහැ.

**නායක හාමුදුරුවෝ හුඟක් බර බහා තැබූ කෙනෙක් කියලා බොහෝ දෙනා කියනවා. ඒගැන යමක් . . .**

ඒක නම් ඇත්තක්. මට බරක් නැහැ. මා විහාර පන්සල් පරිපාලන කටයුතු වල යෙදීමක් නැහැ. කවදාවත් කාගෙන් වත් කිසිම

දෙයක් මා ඉල්ලුවෙත් නැහැ. ඉල්ලන්නෙත් නැහැ. යමක් නැතිනම් ඒ නැතිකම මට යහපතක් කියලයි මං හිතන්නේ. නැති වුනාම, නො ලැබුණාම තමයි හරියට ප්‍රතිපත්තිය පිරෙන්නේ. පුරන්න පුළුවනුත් එතකොටයි. මට කියලා මගේ කියලා කිසිවක් මෙතන නැහැ. මේ කුටියේ තමයි මං ඉන්නේ. මේ කුටියේ ඇතුළු දොර අවුරුදු පහළොහකින්වත් වහපු බවක් මට මතක නැහැ. යතුර තියෙන්නෙ හැමදාම දොරේම යි.

මා හුඟක් වෙද පොත් කියවලා තියෙනවා. ඒ වුණාට මං වෙදකම් කරන්නේ නැහැ. මට අවශ්‍ය පුංචි පුංචි බෙහෙත් ඉදලා හිටලා කාට හරි කියලා හදාගෙන පාවිච්චි කරනවා. මට බොහෝ දෙනාට තියෙන සීනි අමාරුව, ලේ ගමනේ අඩු වැඩිකම වැනි රෝග නෑ. හිත හුඟක් සැහැල්ලු වූ තරමටම ලෙඩ රෝගත් අඩුවෙනවා. මට යම්කිසි ආමාරුවක් ඇති වුවහොත් ඒකට ප්‍රතිකාරයකුත් මටම හිතෙනවා. මගේ ජීවිත කාලයේ දී තද බල අසනීප වෙලා වැඩි දින ගණනක් ඉස්පිරිතාලවල ඉඳලා නෑ. මං කවදත් ආහාර ගත්තෙත් ටිකයි.

මං හිතන්නේ ලෝකේ ඉන්න ලොකුම පොහොසතාත් දුප්පතාත් මමයි කියලයි. දුප්පත්කම කියන්නේ සෑහීමටක පත් නොවීමයි. නැත්නම් ඇතිවීමක් නැති කමයි. මදිකමයි. මම සෑහීමකට පත්වෙලා ඉන්න කෙනෙක්. ලද දෙයින් සතුටු වෙලා ඉන්නවා. සෙවීම පිළිබඳ උත්සාහයකුත් නෑ. ඒක නිසා මං ලෝකේ ලොකුම පොහොසතා කියලා හිතනවා. දුප්පත් කම කියන්නේ නැති කමයි. හිඟන්නා දුප්පතෙකි. හිඟන්නාට තියෙන පොල්කටුව හැරමිටිය උනත් මගේය කියලා හිතින් අල්ලගෙනයි ඉන්නේ. ඒක නිසා ඔහුත් යමක් ඇති කෙනෙක්. මට මොනව තිබුණත් ඒ කිසිවක් හිතින් අල්ලගෙන නැති නිසා කිසිවක් නැති කෙනෙක් හා සාමානයි. ඒක නිසා තමයි ලෝකේ ඉන්න දුප්පතාත් මමයි කීවේ.

# ධර්ම සාකච්ඡාවක් !

7

**නිරෝධය කී වැදෑරුම් ද ?**

දෙයාකාරයි. ක්ෂණික නිරෝධය හා අනුත්පාද නිරෝධය.

උපදින උපදින සෑම අවිද්‍යාවක් ම එකෙනෙහි ම නිරුද්ධ වෙනවා. සෑම සංස්කාරයක් ම, සෑම විඤ්ඤාණයක් ම, සෑම නාමයක් ම, සෑම රූපයක් ම ඒ මොහොතේදී ම නිරුද්ධ වී යනවා. අවිද්‍යාදීන් ගේ ඒ නිරෝධය ස්වභාවික නිරෝධය යි. ඒක තමා ක්ෂණික නිරෝධය කියන්නේ. සංසාර චක්‍රයට අයිති ධර්මයන් ක්ෂණික නිරෝධයෙන් කොපමණ නිරුද්ධ වුවත් අළුත් අළුත් ධර්ම ඉදිරියට ඇතිවීම් වශයෙන් සංසාර චක්‍රයාගේ කරකැවීම සිදු වෙනවා මිසක් නැවතීමක් සිදු වන්නේ නැහැ.

අනුත්පාද නිරෝධය නම් ඒකෙන් ඇති නොවූ, මතු ඇති විය හැකිව තිබෙන්නා වූ අවිද්‍යා සංස්කාර ආදීන්ගේ මතු කවර කලකවත් නූපදනා ස්වභාවය යි.

**සංසාර චක්‍රය සිඳ දුක්ඛ ස්කන්ධයෙන් මිදී නිවන් සුව ලබනු කැමති අය විසින් කළ යුතු එකම දේ කුමක්ද ?**

අවිද්‍යාව නැති කිරීම යි. යම් ප්‍රතිපත්තියකින් අවිද්‍යාව නැති වේ නම් ඒ ප්‍රතිපත්තිය පිරීම යි. අවිද්‍යා නිරෝධය වුවහොත් සංස්කාරාදී සකල ප්‍රතීත්‍ය සමුත්පාදාංගයන්ගේම නිරෝධය සිද්ධ වෙනවා.

## සැප වර්ග කීය ද ?

සැප වර්ග දෙකයි. වේදයිත සුඛය, විමුක්ති සුඛය.

ඇසට හොඳ දේවල් දැකීමෙන් ද, කණට මිහිරි හඬ ඇසීමෙන් ද, නාසයට මිහිරි ගන්ධයක් ආඝ්‍රාණය කිරීමෙන් ද, දිවට හොඳ බොජුන් වැළඳීමෙන් ද, කයට හොඳ පහස ලැබීමෙන් ද, සිතට හොඳ මිළ මුදල් තනතුරු ගරු නම්බු ආදිය ලැබීමෙන් ද, ඇති වන සොම්නස, ප්‍රීතිය, සහිත ආශ්වාදය **වේදයිත සුඛය** යි.

පැමිණ ඇත්තා වූ ද, මතු ඇති විය හැකි වූ ද, දුක් වලින් කරදර වලින් විපත් වලින් මිදීම **විමුක්ති සුඛයයි**. නිදහස් සුවය වශයෙන් ද හඳුන්වන්න පුළුවන්. මේ දුකින් මිදීමේ සැපය කොතෙක් උත්සාහ කොට වුව ද, කොතෙක් වියදම් කොට වුව ද, ලබා ගත යුතුමයි. මේ දුකින් මිදීමේ සුවය වේදයිත සුඛය වැනි ක්ෂණික සුඛයක් නොවෙයි.

## අවිද්‍යා සංස්කාරාදීන්ගේ අනුත්පාද නිරෝධය නිවන නම් එය මොන තරම් වටිනා සුවය කැයි කීවත්, ඒ සුවය විඳින කෙනෙකු නැති බැවින් ඒ නිවන කාහටවත් ප්‍රයෝජයක් නැති දෙයක් නොවේ ද ?

නිවනෙහි තතු සොයන පුද්ගලයා විසින් මේ කියන අනුත්පාද නිරෝධය අතීතයෙහි ඉපිද නිරුද්ධ වුණු නාම රූපයන්ගේ, වර්තමාන නාම රූපයන්ගේ නිරෝධයක් නොව මතු ඇති විය හැකි නාම රූපයන් ගේ නිරෝධය බව සිත්හි තබා ගෙන ම නිවන ගැන කල්පනා කළ යුතුය. එසේ නොවුව හොත් කාරණය අවුල් වේ.

නිවන් සුව විඳින පුද්ගලයන් ගැන කථා කරන්නවුන් ඒ කථාව කරන්නේ ද ආත්මයක්, සත්වයෙක්, පුද්ගලයෙක් සත්‍ය වශයෙන් ම ඇතිය යන වැරදි හැඟීම උඩ ඉඳගෙනයි. නිවනෙන් ප්‍රයෝජනයක් ඇති නැති බව පිළිබඳ ප්‍රශ්නය විසඳා ගත හැකි වන්නේ ආත්මයක් ඇද්ද, නැද්ද යන මේ කරුණ විසඳා ගැනීමෙනි. වේගයෙන් ගිනි පෙනෙල්ලක් කර කවන විට එහි නැති ගිනි වලල්ලක් පෙනෙන්නාක් මෙන් වේගයෙන් ඉපද ඉපද බිඳී බිඳී යන නාම රූප පරම්පරාව සත්වයකු පුද්ගලයකු සේ පෙනේ. ඒ නාම රූපයන් අතර සැප දුක්

විඳින මමය කියා සැලකිය යුතු දෙයක් ඇතුවාක් මෙන් පෙනේ. එහෙත් නාම රූප පරම්පරාව මිස එහි සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැත.

**ඔය කියන විමුක්ති සුඛය කොපමණ උසස් කොපමණ වටිනා දෙයකැයි කියතත් ඒ සුවය අපට නම් ඕනෑ නැත. අපට ඕනෑ කරන්නේ ප්‍රිය වස්තූන් ඇතිව. ප්‍රිය පුද්ගලයන් ඇතිව. ජරාවක් - ව්‍යාධියක් - මරණයක් - අප්‍රිය සම්ප්‍රයෝගයක් - ප්‍රිය විප්පයෝගයක් නැතිව සැපෙන් සොම්නසින් ප්‍රීතියෙන් සෑම කල්හිම විසිය හැකි තත්ත්වයකැයි ඇතැමුන් කියනවා.**

**මහානායක හාමුදුරුවෝ මොකද ඒ ගැන කියන්නේ ?**

මේ ලෝකයේ හෝ අන් තැනක හෝ ස්ථිර තත්ත්වයක් ඇති තැනක් නම් නැහැ. එනිසා එබඳු තත්ත්වයක් නො ලැබිය හැකිය. ඇත්තේ සංසාර චක්‍රයාගේ පැවැත්මය, නැවැත්මය යන දෙක පමණයි. පැවැත්ම කැමති නම් පැවැත්ම ගත හැකිය. නැවැත්ම කැමති නම් නැවැත්ම වූ නිවන් සුවය ගත හැකිය.

ප්‍රිය වස්තූන් ඇත්තේ ද, ප්‍රිය පුද්ගලයන් ඇත්තේ ද, සැප, සොම්නස, ප්‍රීතිය ඇත්තේ ද, සංසාර චක්‍රයෙහි ය. ජරාව, ව්‍යාධිය, මරණය, අප්‍රිය සම්ප්‍රයෝගය, ප්‍රිය විප්‍රයෝගය, ශෝකය, පරිදේවය, දුක, දොම්නස, උපායාසය ඇත්තේ ද, පණු - උකුණු - මකුණු - බලු - බළල් - ඌරු - කුකුල් ආදී තිරිසන් සතුන් වීම ඇත්තේ ද, යක්ෂ - ප්‍රේත වීම ඇත්තේ ද, ගින්නෙන් දැවි දැවී ලෝහ ගුලි ගිලින, ලෝදිය තිරි සතුන් වීම ඇත්තේ ද, සංසාර චක්‍රයෙහි ය.

නිවනෙහි වනාහි ප්‍රිය වස්තු ප්‍රිය පුද්ගලයෝ ද නැත. ප්‍රීතිය, සුඛ, සොම්නස ද, නැත. ජරා - ව්‍යාධි - මරණ - ශෝක - පරිදේව - දුක්ඛ - දෝමනස්සයෝ ද නැත. එහි පැමිණි පසු නැවත අපායට යාමකුත් නැත. එහි ඇත්තේ ශාන්ත ස්වභාවයක් පමණි. ටිකක් කල්පනා කොට වඩා හොඳ දෙය තෝරා ගන්න.

**ඇතැමෙකුට විමුක්තිය අප්‍රිය වී සංසාරය ප්‍රිය වන්නෙත්. ඇතැමෙකුට සංසාරය අප්‍රිය වී විමුක්තිය ප්‍රිය වන්නෙත් ඇයි ?**

ඒ ඒ ඇත්තන්ගේ අදහස් අනුවයි. අවිද්‍යාව සත්වයාගේ සිත කිළිටි කරන - බොරු කරන - අඳුරු කරන චෛතසික ධර්මයකි.

එය එක්තරා මානසික රෝගයක්. ඒ රෝගයෙන් දුර්වල වූ, අඳුරුවූ සිතට පරම්පරා වශයෙන් ඉපිද ඉපිද බිඳි බිඳී යාම, නාම රූපයන් ගේ සැබෑ තත්ත්වය පේන්නේ නැහැ. නොයෙක් විට නාම රූපයන් සත්ත්වයන් හැටියට මිස නාම රූප හැටියට පේන්නේ නැහැ. එයින් සක්කාය දෘෂ්ටිය ඇති වෙනවා. නැවත නැවත සක්කාය දෘෂ්ටිය ඇති වෙන කොට එය වැඩී තහවුරු වී දෘෂ්ටිධ්‍යාශය ඇති වෙනවා. එයත් එක්තරා මානසික රෝගයක්.

සක්කාය දෘෂ්ටිය සමඟ ම ආත්ම වශයෙන් සළකන පංචස්කන්ධය ලොව ඇති ඉතාම හොඳ දෙය, ඉතාම උසස් දෙය හැටියට ගන්නා තෘෂ්ණාවත්, තණ්හාව හා පංචස්කන්ධයට අයත්ව ඇති වන සුඛ සෝමනස්සයන් හා බාහිර රූපාදියත්, හොඳ හැටියට ගන්නා වූ තණ්හාවත් ඇති වෙනවා. ඒවා වැඩී තහවුරු වී තෘෂ්ණාධ්‍යාශය ඇති වෙනවා. ඒකත් එක්තරා මානසික රෝගයක්. ධර්මය සේවනය නො කරන ධර්මයෙන් ඈත්ව වෙසෙන ජනයා කෙරෙහි අවිද්‍යා - තෘෂ්ණා - දෘෂ්ටි සංඛ්‍යාත රෝග තුන තදින්ම පවතිනවා.

කෙලෙස් රෝගඇති අයට පංචස්කන්ධය ප්‍රිය වෙනවා. පංචස්කන්ධය සංඛ්‍යාත දුක්ඛස්කන්ධයාගේ නිරෝධය වූ නිවන අප්‍රිය වෙනවා. එයට බිය වෙනවා. එසේ වන්නේ නිරෝධය නරක නිසා නොව, කෙලෙස් රෝගය නිසයි.

ධර්මය නැමති බෙහෙත සේවනය කොට, කෙලෙස් රෝගය සුව කරගෙන සිත පිරිසිදු කර ගෙන, වාසය කරන සත්පුරුෂයන්ට පංචස්කන්ධය තරම් නපුරක්, බිය විය යුත්තක් වෙනත් නැත. නිවන තරමට උසස්ව පෙනෙන අනිත් සැපයකුත් නැත.

**නිවන සත්වයන් යන එන සිටින තැනක් නොවේ නම්, එබඳු නිවනකින් ඇති ප්‍රයෝජනය කවරේද ?**

නිවනින් ලබන්නට ඇත්තා වූ ප්‍රයෝජනය නම් දුක් ගිනි නිවා ගැනීමයි. සත්වයන්ගේ දුක් ගිනි නිවෙන්නේ නිවනට පැමිණ වාසය කිරීමෙන් නොව, නිවන් දැකීමෙනි. අන් කවර ධර්මයකටවත් නැති දක්නවුන්ගේ දුක් ගිනි නිවාලන පුදුම අනුභාවයක් නිවනට තියෙනවා.

හරියට නිවන දැකීමට සමත් වන ලෝකෝත්තර ඥානයෙන් නිවන දෙස බැලුව හොත් එයින් ඒ නැනැත්තාගේ දුක් ගිනි මතු කවර කාලෙකවත් නූපදනා පරිදි නිවී යනවා. නිවන් දුටු ඒ පින්වතා ඒ නිවන් සුවයට හිමි කාරයෙක් වෙනවා.

නිවන ඇත්තේ පැමිණ වාසය කිරීමට නොව දැකීමටයි. නිවන් දකිනවාය, නිවන් දුටුවාය, යන වචන බෞද්ධයන් අතර ව්‍යවහාරයට පැමිණ තිබෙන්නේ ඒ නිසයි. නිවනට පිවිසියේ ය. නිවන් ගියේ ය, නිවනට පැමිණියේ ය. යන ව්‍යවහාර තිබුණත් ඒවා පරියාය කථාය. නිවන් කථාවේ දී ව්‍යවහාරයට ඉතා හොඳ වචන නිවන් දකිනවාය, නිවන් දුටුවාය යන වචනයි.

## හට ගැනීමක් නැතිව නිවනක් තිබේද ?

හට ගැනීමක් නැතිව නිර්වාණ ධාතුව ඇත්තේ ය යනු ගැඹුරු කරුණකි. නිර්වාණය හරියට තේරුම් ගැනීමට අපහසු වීමට ඇති කරුණු වලින් මේ හට ගැනීමක් නැති බවත් එක් කරුණකි. යමක් ඇත්නම් එහි හට ගැනීමකුත් තිබිය යුතුය. හට නොගත් දෙයක් සත්‍ය වශයෙන් නොතිබිය හැකිය යනු ද එක්තරා නීතියකි. ලොවැති බොහෝ දේවලට ඒ නීතිය සාධාරණ වුවත් එය සර්ව සාධාරණ නීතියක් නොවේ. හට ගැනීමක් නැතිව ඇති ධර්ම ද ඇත්තේය. පරමාර්ථ ධර්ම අනුව කථා කරතොත් ප්‍රඥප්තීන් නැති දේවල් හැටියට කිය යුතු ඒවා ය. එහෙත් ප්‍රඥප්ති ද සර්වාකාරයෙන් නැති ඒවා නොව ප්‍රඥප්ති භාවයෙන් ඇති ඒවා ය.

ආකාශය ද, පටන් ගැනීමක් නැතිව ඇති එක් දෙයකි. ආකාශය කා හටත් ප්‍රත්‍යක්ෂ දෙයකි. ආකාශයක් ඇති බව කවුරුත් පිළිගනිති. මේ ආකාශය අසවල් කාලයෙන් ඔබ්බට තිබුණේ නැත. ආකාශය ඇත්තේ අසවල් කාලයේ පටන් යැයි කිව හැකි කාලයක් නැත. එය මුළු අතීත කාලයේම පැවැත්තේය. මෙය නුවණින් කල්පනා කරන කා හට වුවත් පිළිගත හැකි කරුණකි. පළමුවෙන් ඇති වීමක් නැතිව ආකාශය සැම කල්හිම පවත්නාක් මෙන් නිවනක් ඇති වීමක් නැතිව සැම කල්හි පවත්නක් බව තේරුම් ගත යුතුය.

යම්කිසි හේතුවකින් හෝ ඉබේම හෝ හට ගැනීමක් නැතිව ඇත්තා වූ නිවන ආකාශය සේ හිස් බවක් නොවේ. එය එක්තරා පරමාර්ථ ධර්මයකි. ඒ බව දත යුත්තේ එහි ඇති අනුභාවයෙනි. හිස් බවෙහි කිසි අනුභාවයක් නැත. සියලු කෙළෙස් නැති කිරීමේ, සියලු දුක් නැති කිරීමේ මහානුභාවයක් නිවනෙහි ඇත. නිවන් පසක් කිරීමෙන් හෙවත් නුවණැසින් නිවන දැකීමෙන් දුටු තැනැත්තාගේ කෙළෙස් මතු නූපදනා පරිදි නැතිව යන්නේත් දුක් නැති වී යන්නේත් නිවනේ අනුභාවයෙනි. එබඳු අනුභාවයක් හිස් බවෙහි නැති බැවින් නිර්වාණ ධාතුව අනුභාව සම්පන්න එක්තරා පරමාර්ථ ධර්මයෙකැයි පිළිගත යුතුයි.

## සිල් රැකීමෙන් පමණක් නිවන් ලැබිය හැකි ද ?

ඇතැම් පැවිද්දන් පමණක් නොව, ඇතැම් ගිහියන් ද, ශීලය ගැනම කථා කරමින් ශීලයම උසස් කොට ගනිමින් ශීලයෙන් ම සියල්ල සිදු කර ගන්නා බලාපොරොත්තුවෙන් සිල් පිරිසිදු කර ගැනීමෙහි ම යෙදී සිටිනවා. ඒ ඒ ඇත්තන් ගේ වැරදි හැඟීමක්. සිල් රැකීමෙන් පමණක් නැවතී සිටීම, වැට බැඳ ගෙන කුඹුර නොවපුරා සිටීමක් වගෙයි.

## බෝධි යන්නෙහි පැහැදිලි තේරුම කුමක්ද ?

බෝධි කියන්නේ ලෝකෝත්තර ඥාන වලට කියන නමක්. බෝධි කියන ඒ ලෝකෝත්තර ඥානය ලැබීමට උපකාර වන ධර්ම සමූහයක් තියෙනවා. ඒවාට කියන්නේ බෝධි පාක්ෂික ධර්ම කියලා. ඒ අති උතුම් ලෝකෝත්තර ඥානය ලැබීම සඳහා කළ යුතු දේ නම් ඒ බෝධි පාක්ෂික ධර්ම වැඩීමයි. වෙන විදියකින් කියනවා නම් ශීල, සමාධි, ප්‍රඥා තුන වැඩීමයි. තවත් ක්‍රමයකින් කියනවා නම් ශීල විසුද්ධිය ආදී කොට ඇති විසුද්ධි හත වැඩීමයි.

## ඇතැම් බෞද්ධයන් මෙලොවට වඩා පරලොව ගැන සිතීමේ වරදක් තිබේද ?

මිනිසුන් ආගම් පිහිට කොට ගන්නේ පරලොව සැපත - යහපත ප්‍රාර්ථනා කර ගෙනයි. මෙලොව සඳහා ආගම් වලින් පිහිට

ඇත්තේ ස්වල්ප වශයෙන් යැයි සිතනවා. මනුෂ්‍යයකු මේ ලෝකයේ ජීවත්වන කාලය අවුරුදු සියයකටත් අඩු ඉතාම ස්වල්ප කාලයක්. නමුත් ඉන් එහා තියෙන පරලොව පිළිබඳ කාලය කල්ප ගණනකින්වත් ප්‍රමාණ කළ නො හැකි දීර්ඝ එකක්. ඒනිසා නුවණැති අය මෙලොව ගැන කල්පනා කරනවාට වඩා පරලොව ගැන කල්පනා කරනවා. මෙලොව කොපමණ ලාභයක් ලැබෙන, සැපයක් ලැබෙන, කාරණයක් වුණත් ඒක මරණින් මතු දුගතියට යෑමට කරුණක් වනවා නම් එබඳු වැඩ වලින් වැලකීමට උත්සාහ දරණවා. එබඳු අය ජීවිත ආරක්ෂාව සඳහා වුවත් පාපයක් කරන්නේ නැහැ.

## මෙකල රහත් බව ලබා ගත හැකි ද ?

රහත් වීමේ මග දක්වන්නා වූ බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලොව නිර්මලව පවත්නා තාක් ලෝකයෙහි රහතුන් වහන්සේලා නැතැයි රහත් බව ලැබිය නො හැකි යැයි නොකිය හැකි යි. මේ කාලයේ අතීතයේ මෙන් රහතුන් සුලභ නැති බව පමණක් කියන්න පුළුවන්. රහතුන් වහන්සේලා තමන්ගේ රහත් බව ලෝකයට පෙන්වමින් ඇවිදින අය නොවේ. දුටුවාම රහත්බව අඳුනා ගැනීමේ ලකුණක් ද උන්වහන්සේලා තුළ නැහැ. ඒ නිසා රහත් කෙනෙකුන් දුටුවත් හඳුනා ගත නො හැකියි. රහත් වීමට පිරිය යුතු ප්‍රතිපත්ති පුරා අවසන් කළහොත් දිනය කවදා හෝ වේවා ඒ තැනැත්තා අර්හත්වය ලබා ගත්තෙක් වෙනවා. රහත් වීමේ ප්‍රතිපත්තිය පුරා අවසන් කළත් සමහර කලක දී රහත් බවට නො පැමිණිය හැකි යැයි කීම යුක්ති යුක්ත නොවන කථාවක්. එසේ කීම තථාගතයන් වහන්සේගේ ධර්මයත් ශාසනික ප්‍රතිපත්තියත් කලකට අවලංගු කර දැමීමක් වෙනවා.

රහත් වීමට උත්සාහ කරන පින්වතුන්ගෙන් ඇතැමෙක් ඉතාම කෙටි ධර්ම දේශනාවක් ඇසීමෙනුත් රහත් වෙනවා. ඇතැමෙක් පැවිදි වීමට හිසකේ කපන අතරතුර දී රහත් වෙනවා. ඇතැමෙක් පැවිදිව දින ගණනකින් රහත් වෙනවා. ඇතැමෙක් මාස ගණනකින් රහත් වෙනවා. ඇතැමෙක් වර්ෂ ගණනක් උත්සාහ කරලා රහත් වෙනවා. ඇතැමෙක් මුළු ජීවිත කාලයේ දීම දුක් විඳලත් රහත් වෙන්නෙ නැහැ.

## සමථ භාවනාවෙන් සමාධියක් නොලබා විදර්ශනා වැඩීමෙන් පමණක් ප්‍රතිඵලයක් ලබා ගත හැකිද ?

සමහරුන් අතර මේ මතය තියෙනවා. නමුත් ඒක වැරදි මතයක්. සමථ භාවනා වලින් සමාධි උපදවා ධ්‍යාන උපදවා විදර්ශනා වඩන්නට සිටියහොත් විදර්ශනා වඩන්නට නොලැබී ජීවිතය කෙළවර වෙනවා ඇති. ඒ නිසා බුද්ධෝත්පාදයෙන් ලැබිය හැකි උසස් ඵලය නොලැබී යන්නේය. භාවනා කිරීමට පටන් ගන්නා අයගෙන් ධ්‍යානයක් - මාර්ගයක් - ඵලයක් ලැබීම දක්වා භාවනාව ගෙන යාම තබා තරමක සමාධියක්, තරමක විදර්ශනා ඥානයක් ලැබෙන තෙක් වුව ද, භාවනාව කරගෙන යා හැක්කේ ඉතාම ටික දෙනෙකුට පමණයි. එයට හේතුව නීවරණයන් විසින් ඒ අය පරදවනු ලැබීම යි. භාවනාව දියුණු කළහැකි වීමට නම් යෝගාවචරයා විසින් නීවරණ පැරදවිය යුතුය. ඇත්ත වශයෙන් ම යෝගාවචරයකුට භාවනා කරමියි කියා කරන්නට ඇත්තේ නීවරණ සටනයි. බුදු සස්නෙහි පැවිදිව ආර්ය ශීලයෙහි ද පිහිටා, ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙහි සිත පිහිටා, ආර්ය වූ සිහිනුවණින් යුක්තව විවේකස්ථානයකට පැමිණ කර්මස්ථානයෙහි සිත පිහිටුවා ගෙන කාමච්ඡන්දා දී නීවරණයන්ගෙන් සිත පිරිසිදු කොට ගෙන යෝගාවචරයන් ධ්‍යානාදී ධර්ම ලබන බව බොහෝ සූත්‍රවල දී බුදුරාජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා. ඒ සූත්‍ර දේශනාවල දැක්වෙන අන්දමට යෝගාවචරයකුට භාවනා කිරීම වශයෙන් කරන්නට ඇති ප්‍රධාන දෙය නීවරණයන් ගෙන් සිත පිරිසිදු කර ගැනීමයි. මෙකල භාවනා කරමියි කියා සමහර අවස්ථාවල යම් කිසිවක් මෙනෙහි කරන අය නීවරණ ප්‍රහාණය නැමැති බර වැඩක් තමන්ට කරන්නට ඇති බව පවා දන්නේ නැහැ. ඒ අය නොයෙක් ආකාරයෙන් තමන් කෙරෙහි ඇදී එන නීවරණයන් හඳුනන්නෙත් නැහැ. ඒ බැවින් ඔවුන් නීවරණයන් විසින් පරදවනු ලැබ භාවනා කරමියි කියමින් හැම කල්හි ම එකම තත්ත්වයෙන් සිටිනවා. නීවරණයන් ප්‍රහාණය කිරීමට වීර්යය නො කරන ඔවුන්ට කිසි කලෙක භාවනාවෙන් උසස් ඵලයක් නොලැබිය හැකි යි. නීවරණයන් හඳුනන්නන්ට නීවරණයන් ප්‍රහාණය කළ හැකි ය.

## සුගතිය කී වැදෑරුම් ද ?

සුගතිය දෙවැදෑරුම් වෙනවා. එනම් ප්‍රතිපත්ති සුගතිය හා ගති සුගතිය යි. මේ කියන ප්‍රතිපත්ති සුගතියත් නැවත කොටස් දෙකකට බෙදෙනවා. ඒ තමයි අගාරික ප්‍රතිපත්ති සුගතිය හා අනගාරික ප්‍රතිපත්ති සුගතිය. සිත පිරිසිදු වුණාම ගිහියා ප්‍රාණ ඝාතයෙන් වැළකීම ආදියෙන් දශ කුසල කර්ම පථය සම්පූර්ණ කරනව. දානා දී පුණ්‍ය ක්‍රියා වස්තූන් සම්පූර්ණ කරනවා. මෙය ඔහුගේ ප්‍රතිපත්ති සුගතිය යි. යහපත් ප්‍රතිපත්තියෙහි පිහිටි හෙතෙම මරණින් මතු මිනිස් ලොව උසස් බවට ද පැමිණෙනවා. දෙව් ලොවට ද පැමිණෙනවා. මේ ඔහු ගේ ගති සුගතිය යි.

මේ ශාසනයෙහි පිරිසිදු සිත් ඇති භික්ෂුවක් ඒ පිරිසිදු සිතින් චතුපාරිශුද්ධි ශීලය සම්පූර්ණ කරනවා. තෙලෙස් ධූතාංග ආරක්ෂා කරනවා. ප්‍රත්‍ය වැඩි කර ගැනීමේ ප්‍රතිපත්තිය අත් හැර විවේකස්ථානයක වාසය කරමින් තමාට සුදුසු කර්මස්ථානයක් අනුව භාවනා කරලා ධ්‍යාන සමාපත්තිය උපදවා ගන්නවා. සෝවාන් මාර්ගය වඩනවා. සකදාගාමී මාර්ගය වඩනවා. අනාගාමී මාර්ගය වඩනවා. මේ ඒ භික්ෂුව ගේ ප්‍රතිපත්ති සුගතියයි. ඒ භික්ෂූන් වහන්සේ යහපත් ප්‍රතිපත්තියෙහි පිහිටලා මරණින් මතු උත්පත්ති වශයෙන් මිනිස් ලොව උසස් කුලවලට පැමිණෙනවා. නැත්නම් කාමාවචර දිව්‍යලෝක සයට පැමිණෙනවා. නැත්නම් බ්‍රහ්ම ලෝකවලට පැමිණෙනවා. මෙලෙස පැමිණීම ඒ භික්ෂුවගේ ගති සුගතිය යි. එ පමණක් නොවෙයි සිතේ ඇති කර ගන්නා වූ පිරිසිදු බව නිසා සියලු දුක් නසා නිවනටත් පැමිණෙනවා.

## විමසීම් වේගයෙන් මිථ්‍යා දෘෂ්ටිය ක්‍රියාත්මක වන්නේ කෙසේද ?

විමසීම ප්‍රඥාවට අයත් ක්‍රියාවක්. කළ හැකි නම් හැම කරුණක් ම විමසා ඒවායේ නතු දැන ගැනීම වඩාත් හොඳයි. විමසා වැඩ කළ යුතු බවත් නො විමසා ක්‍රියා කිරීම අනතුරුදායක බවත් බුදුරජාණන් වහන්සේ විසින් වගේ ම තවත් බොහෝ බුද්ධිමතුන් විසින් ප්‍රකාශ කොට තියෙනවා. විමසීම යහපත් වුණත්, නොවිමසා ක්‍රියා කිරීම අනතුරුදායක වුණත්, සාමාන්‍ය මනුෂ්‍යයකු සියල්ලම විමසා නියම වශයෙන් දැන ගෙනම වැඩ කරන්න සිතතොත් ඔහුට වැඩ කරන්න

කාලයක් ලැබෙන්නේ නැහැ. විමසීමට ම ඔහුගේ කාලය ගෙවී යනවා. ඒ නිසා විමසීම යහපත් වුණත් එය එක්තරා ප්‍රමාණයක් කළ යුත්තක්. සෑම දෙනාම සෑම දෙයක් ම විමසා ප්‍රත්‍යක්ෂ කර ගැනීමට සමර්ථ වන්නේ නැහැ.

බුද්ධාදී මහෝත්තමයන් වහන්සේලාගේ ඥානයෙන් දක්නා ලද කරුණු සාමාන්‍ය මනුෂ්‍ය ඥානයට විෂය වන්නේ නැහැ. ඒ උතුමන් විසින් පෙන්වා දෙන ලද ගැඹුරු කරුණු ඒ උතුමන් කෙරෙහිත් ඒ උතුමන් විසින් පෙන්වා දෙන ලද ධර්මය කෙරෙහිත් ගෞරව පෙරදැරි කර ගෙන ම විමසීම කළ යුතුව තියෙනවා. එහෙම විමසීම් කරන්නා වූ පුද්ගලයා මුලාවට පත් වන්නේ නැහැ. යම් කරුණක් තේරුම් ගැනීමට තමාගේ නුවණ ප්‍රමාණවත් නොවන තැන දී ඔහුට ඒ බව අවබෝධ වෙනවා. නුවණ ප්‍රමාණවත් නොවන කරුණුවල දී මිථ්‍යා ලබ්ධියක් ඔහුට ඇති වන්නේ නැහැ. ශාස්තෘ ගෞරවයෙන් හා ධර්ම ගෞරවයෙන් තොරව සැකය පෙරදැරි කර ගෙන සත්‍යාසත්‍ය සෙවීමේ අදහසින් ධර්මය විමසන පුද්ගලයාට යම් යම් කරුණක් තේරුම් ගැනීමට තමාගේ නුවණ ප්‍රමාණ නොවන විට ඒ බව ඔහුට දැනෙන්නේ නැහැ. ඔහු නොමඟ ගොස් මිථ්‍යා ලබ්ධිය ඇති කර ගන්නවා. සමහරු එපමණකින්ුත් නො නැවතී බුදුවරුන්ට, රහතුන්ට, නින්දා කරන, ධර්මයට නින්දා කරන, ධර්මය අවලංගු කරන්න නැත් කරන අය බවට පත් වෙනවා. එය ඔවුන්ට පමණක් නොවෙයි ලෝ සසුන් දෙකටත් මහා අනර්ථයක් වෙනවා. ඒ නිසා විමසීම යහපත් වුණත් එය පරිස්සමින් කළ යුතු වෙනවා.

සත්‍යය හෝ අසත්‍යය කවර ලබ්ධියක පිහිටා විමසන්නා වූ තැනැත්තාට ද තමා ගත් ලබ්ධිය සත්‍ය බවට නොයෙකුත් හේතු යුක්ති පේන්න පුළුවන්. ආත්මයක් ඇතැයි ගත් තැනැත්තාට ඒ සත්‍ය බවට නොයෙකුත් හේතු යුක්ති පේනවා. ආත්මයක් නැතැයි ගත් තැනැත්තාටත් එය සත්‍ය බවට බොහෝ හේතු යුක්ති ලැබෙනවා. ලෝකයේ මැවුම් කරුවෙකු ඇතැයි සිතන්නාටත් බොහෝ හේතු යුක්ති තියෙනවා. නැතැයි ගත් තැනැත්තාටත් බොහෝ හේතු යුක්ති ලැබෙනවා. මේ අනුව කිව හැක්කේ තම තමන් ගත් ලබ්ධිය සත්‍ය බවට බෙහෝ හේතු යුක්ති ලැබෙන බවයි.

ගැඹුරු කාරණා, අවබෝධ කර ගැනීමට අපහසු කාරණා යැයි කියන්නේ පහදා ගැනීමට උපකාර වන හේතු යුක්ති දුර්ලභ කරුණු වලටයි. ගැඹුරු කරුණු වල දී සත්‍යය පහදා ගැනීමට උපකාර වන හේතු යුක්ති දුර්ලභ නිසා ගැඹුරු කරුණුත් ඇති සැටියට ම ගෙන එය වැඩි දුරටත් විමසන්නා වූ තැනැත්තාට එය පහදා ගැනීමට ලැබෙන්නේ හේතු යුක්ති ස්වල්පයක් පමණයි. එබඳු කරුණක් වරදවා තේරුම් ගෙන වැඩි දුරටත් එය විමසන්නෙකුට තමා ගත් වැරදි ආකාරයට සත්‍ය බවට ලැබෙන හේතු යුක්ති ඉතා බොහෝ වෙනවා. ඒවා එයට හේතු හැටියට ඔහුට පෙණුනත් සත්‍ය හේතුන් නොවෙයි. යම්කිසි සිද්ධියකට සත්‍යය හේතු නොවී, හේතුන් සේ පෙනෙන කරුණු වලට ප්‍රතිරූපක හේතු යයි අප කියනවා. මිථ්‍යා ලබ්ධියක් ගෙන එය විමසන්නා වූ තැනැත්තා තමාගේ ඒ ලබ්ධිය සත්‍ය බවට බොහෝ ප්‍රතිරූපක හේතු දකිනවා. ඒ වායින් හෙතෙම වැඩි දුරටත් රැවටෙනවා. "විමසීමේ ආකාරයෙන් ප්‍රති රූපක හේතුන් ගැනීමෙන් මිථ්‍යා දෘෂ්ඨිය" වංචා කරන්නේ යැයි කීවේ ඒ නිසයි.

**යෝගාවචරයකුට අභ්‍යන්තර හා බාහිර වශයෙන් පවත්නා වූ අන්තරාය මොනවාද ?**

සංසාර දුකින් මිදී නිවන් දැකීමේ බලවත් ඡන්දයෙන් භාවනාවට පටන් ගන්නා වූ සත්පුරුෂයන්ට වරින් වර ඒ යෝග කර්මයට බාධා කරන්නා වූ ද, සමහර විට යෝගාවචරයා යෝග කර්මයෙන් සම්පූර්ණයෙන් ම බැහැර කරන්නා වූද අන්තරායික කරුණු බොහෝ තියෙනවා. යෝග කර්මය සාර්ථක වන පරිදි කළ හැකි වීමට යෝගාවචරයන් විසින් ඒ අන්තරායික කරුණුත් ඒවා පැමිණියහොත් ඒ වායින් මිදීමට පිළිපැදිය යුතු ආකාරයත් කලින් ම දැන සිටිය යුතු යි.

මේ අන්තරායන්ගෙන් කොටසක් යෝගාවචරයාගේ අභ්‍යන්තරයෙන්ම පැණ නැගෙන්නා වූ ඒවාය. කොටසක් පිටතින් පැමිණෙන්නා වූ අන්තරායෝය. ඒ අන්තරායන් මැඩ ගෙන ජය භූමියට පැමිණිය හැකි වනුයේ බලවත් ඡන්දය ඇත්තා වූ, බලවත් වීර්යය ඇත්තා වූ, මහත් වූ දුක් ඉවසීමේ ශක්තිය ඇත්තා වූ තියුණු නුවණ ඇත්තා වූ, යෝගාවචරයන්ට පමණයි. සෙසු අය අවසානය තෙක් යෝග කර්මය නො කොට අතර මග නවතිනවා. යෝගාවචරයාගේ

අභ්‍යන්තරයෙන්ම නැග එන්නා වූ අන්තරාය නම් පංච නීවරණ, සාගින්න හා පිපාසාව යි. බාහිර වශයෙන් පැමිණෙන අන්තරාය අතර රෝග පීඩා හට ගැනීම, සතුරන් සිටීම, ලාභ සත්කාර ගලා ඒම, ඔහු කෙරෙහි ඇලුම් කරන ස්ත්‍රියක් නැවත නැවත පැමිණීම ආදිය විශේෂයෙන් සඳහන් කළ හැකි ය. මෙබඳු උපද්‍රවයන් යෝගාවචරයන්ට පැමිණෙන බව අප නිසැකවම දැන ගෙන සිටින සත්‍යයකි.

# ජීවිතයේ රසවත් සිදුවීම් ටිකක්

8

**මහානායක හාමුදුරුවනේ, ජීවිතයේ රසවත් තොරතුරු එකක් දෙකක් . . .**

මං ඉස්සෙල්ලම කියන්නම් නැවෙන් බුරුමෙට ගිය හැටි. ඒ කාලෙ බුරුමෙට යන්න නැවට අය කරන ගාස්තුව රුපියල් 20 යි. රුපියල් 20 අය කළේත් ලොකු අයට. පොඩි අයට අය කළේ රුපියල් 10 යි. ඉතින් අපව මහණ කරලා, පුංචි කාලෙම බුරුමෙට එක්කරන් යන්න තීරණය කරලා අපට නියම කළා අපේ ගෙවල් වලට කියලා පුංචි අය රුපියල් 10 කුත්, ලොකු අය රුපියල් 20 කුත් බැගින් ගෙනත් දෙන්න කියලා. ඒ කටයුතු ඔක්කොම දායකයොයි, සංවිධායකයොයි, ලොකු හාමුදුරුවරුයි එකතු වෙලා තමයි කළේ. ඉතින් මට සල්ලි ගෙනත් දෙන්න ප්‍රමාද වුණා. නමුත් සංවිධායකයෝ ඔක්කෝම හිටියා. එක දායක මහත්තයෙක් මං දුන්නු සල්ලි ටික අරගෙන ඒක ලැයිස්තුවට දාන්නෙ නැතුව නිකං හිටියා. ඒක හංගා ගත්තා. ඉතින් බුරුමෙට යන්න නැවෙන් පිටත් වෙලා දවස් දෙකක් විතර ගියාට පස්සේ තමයි ඔය සල්ලි එකතු කරපු ලැයිස්තුව බැලුවේ. මගේ සල්ලි ලැබුණු බවක් ලැයිස්තුවේ සඳහන් වෙලා නැහැ. මුදලත් නැහැ. දැන් ඉතින් මට මහා ප්‍රශ්නයක් ඇති වුණා. අනික් කවුරුවත් මේක දන්නෙත් නැහැ. නැවේ හිටිය ලොකු හාමුදුරුවරු මගේ මුදලත් දාලා අනිත් අයත් එක්කම මාවත් ගෙනැල්ලා බුරුමයෙන් බැස්සුවා. බුරුමෙට ආවට පස්සේ, එක එක්කෙනාගෙන් අය කර ගත්ත මුදල් වලින් ටික ටික ඉතුරු වෙලත් තිබුණා. ඒ මුදල් තමයි බුරුමෙ එහාට මෙහාට යන කොට වියදමට යොදා ගත්තේ. ඒ ගමන් වලදී මට ඉතින්

යන්න සූදානම් වෙන්න කීවාම මාත් සූදානම් වෙනවා. කවුරු වියදම් කරනවද ? කොහොම කරනවද ? කියලා මං දන්නේ නෑ. මාත් ඉතින් ඒ ඒ තැන් වලට ගියා. මෙතන එකම දවසේ 27 දෙනෙක් මහණ කළා. ඒ මහණ කළේත් බුරුම ජාතික යූ. විනයාලංකාර කියන හාමුදුරුවෝ. මහණ කරලා දැන් ඉතින් අපට කරන්නේ මොකද කියලා කල්පනා කරලා තමයි තීරණය කළේ අපව බුරුමෙට එක්කර ගෙන යන්න. ඔය වෙන කොට **බටුවිට සුසීම** කියන හාමුදුරුවොයි, බොල්ගොඩ පන්සලේ හිටිය **වැලිතර ධම්මජෝති** කියන හාමුදුරුවොයි නිතර නිතර එහාට මෙහාට යමින් එමින් මෙහේ ආගමික කටයුතු බොහොමයක්ම ඉටු කළා. ඒ යන එන අවස්ථාවලදී අපට වරනැගිල්ලක්, ධම්පියා අටුවා වෙන් කථා කීපයකුත් පාඩම් කෙරෙව්වා. අන්න ඒකෙන් අපට යන්තම් කැඩිච්ච පාලි ටිකක් කථා කරන්න පුළුවන් වෙලා තිබුණා. අපව බුරුමෙට එක්කරන් ගියායින් පස්සේ අපට මොනවා උගන්වන්නද ? කොහොමද උගන්වන්නේ, කියලා, එක්කරන් ගිය ඇත්තන්ටත් කිසිම දැනුමක් අවබෝධයක් තිබුණේ නැහැ. අපි ඉතින් භාෂාව දන්නෙත් නැහැ. කොහොම වුණත් ඒ ඇත්තෝ කට පාඩම් කරන පොත් කියවා අපට කට පාඩම් කිරීමට අවස්ථාව සැලසුවා.

**මහානායක හාමුදුරුවො ඉංග්‍රීසි ඉගෙන ගත්තද ?**

නෑ. නෑ !!

**එහෙනම් මේ එක එක්කෙනා කියන්නේ නායක හාමුදුරුවෝ ඉංග්‍රීසි ඉගෙන ගන්න සූදානම් වෙලා ඒක අත්හැර දැම්මා කියලා ?**

ඒවා ඉතින් බොරු කථා වෙන්න ඇති. මං ඉංග්‍රීසි ඉගෙන ගත්තේ නැත්තේ මොකද දන්නව ද ? අපි කුඩා කාලේ ඉංග්‍රීසි ඉගෙන ගන්නවට මේ ගිහියෝ බොහොම විරුද්ධයි. ඉගෙන ගන්න එක්කෙනාට බනිනවා. මොකද ඒ කාලේ ඉංග්‍රීසි ඉගෙන ගත්තේ රස්සාවක් කරන්න මිසක් වෙන දේකට නෙමෙයි. ඔන්න ඔය වල්පොල රාහුල නම් ඉංග්‍රීසි වලින් කෙනෙක් පරද්දන්න පුළුවන් තත්ත්වයට ඉගෙන ගත්තා. ඒ දුෂ්කරත්වය නිසාත්, ඕකේ අගයක් අපට නොතිබුණ නිසාත්, ශ්‍රමණ ධර්මයට ඕනෑ නොකරන නිසාත්, ඉංග්‍රීසි ඉගෙනීම ගැන අපි උත්සාහයක් කළේ නෑ.

**ඉංග්‍රීසි ඉගෙන ගත්තෙම නැද්ද ?**

නෑ

**මේ සමහරු කියනවා මෙහාට කෙනෙක් එක්කර ගෙන ඇවිත් ඉංග්‍රීසි ඉගෙන ගන්න සූදානම් වුණා කියලා.**

මං ඉතින් ඉංග්‍රීසි හෝඩිය ගැන, වචන උච්චාරණය ගැන, යම් යම් දේවල් කිව්ව බව නම් ඇත්ත. PUT පුට් නම් BUT බට් වෙන්නේ කොහොමද කියලා මං ඇහුවා. ඉංග්‍රීසි හෝඩිය හදලා තියෙන්නේ දක්ෂයෙක් නෙමෙයි. නුවණ ටිකක් අඩු කෙනෙක්. ඉංග්‍රීසි හෝඩියේ තියෙනවා අකුරු හතර ජාතියක්. අපේ හෝඩියේ තියෙන්නේ අකුරු එක ජාතියනේ. අපේ හෝඩිය ඉගෙන ගත්තාම අපේ භාෂාව ඔක්කොම කියවන්න පුළුවන්. ඉංග්‍රීසි හෝඩිය ඉගෙන ගෙන ඉංග්‍රීසි භාෂාව කියවන්න බෑ. වචනෙන් වචනෙ කියන හැටි වෙන වෙනම ඉගෙන ගන්නත් ඕනෑ.

**ඒ මොකද ?**

ඒ මොකද ඉතින් ඒ අකුරු හදපු එක්කෙනාගේ අදක්ෂකම තමයි. මට ඉංග්‍රීසි ඉගෙන ගන්න ඒතරම් ඕනකමක් ඇති වුණෙත් නෑ. අපි කුඩා කාලයේ බොහෝ දෙනා ඉංග්‍රීසි ඉගෙන ගත්තේ රක්ෂාවක් සඳහායි. ඒ මාර්ගයේ යාම ගැන අපේ බලාපොරොත්තුවක් තිබුණේ නැති නිසා ඉංග්‍රීසි ඉගෙන ගන්න උත්සාහයක් කළෙත් නෑ.

**මහානායක හාමුදුරුවනේ මේ පොකුණු විට පන්සලට විටින් විට සිහි මඳ උදවිය එනවා කියලා මං අහලා තියෙනවා. ඒ අය අතර නොයෙක් තරාතිරමේ අය හිටියා කියලත් මං අහලා තියෙනවා. අන්න ඒ ආව ගිය අය සමඟ නායක හාමුදුරුවෝ බොහොම සුහදව නිතර නිතර කතා බහ කළ බවත් අහලා තියෙනවා. ඒ ගැන ටිකක් කියන්න පුළුවන්ද ?**

ඉස්සර "සාදයියා" කියලා එක්කෙනෙක් නිතර නිතර මෙහාට ආවා. එයා කියන්නේ එයා තමයි බුදුන් කියල.

## එයා කොහේ කෙනෙක්ද ?

මේ ගමේ එක්කෙනෙක්. එයා සැමදාම එනවා. ඉන්නකම්ම එයා ජීවත් වුණේ මේ පන්සලෙන් ම කාලා බීලා. එයා පන්සලට ඇවිදිල්ලා උදැල්ලත් අරගෙන පොඩ්ඩක් මිදුල උදළු ගාලා, පොඩ්ඩක් මිදුලත් අතු ගාලා, කාලා යන එක්කෙනෙක්. එයා මෙහාට එන්නේ මොන මොනවදෝ හයියෙන් කියමින්. පාරේ යන කොටත් හයියෙන් මොන මොනවාදෝ කිය කියා යනවා. ඒ කියා කියා යන්නේ තේරුමක් ඇති වචන නෙමෙයි. මොන භාෂාවකටවත් අයිති වචන නෙමෙයි. එයා කියන්නේ ඒ භාෂාවට "පාරමී භාෂාව" කියලා. ඒ පාරමී භාෂාව දන්නේ එයා විතරයි කියලත් කියනවා. එයා මොන මොනවදෝ කියනව මිසක් තේරුමක් නෑ. සාදයියා ආවහම අපිත් ඉතින් කථාවට අල්ලා ගන්නවා. මොන ප්‍රශ්නයක් ඇහුවත් එකවරටම මොකක් හෝ පිළිතුරක් එයා දෙනවා. අපි ඉතින් ඔය ගාථාවක් එහෙම කියලා අහනවා සාදයියේ මේකේ තේරුම මොකක් ද කියලා. කිසිම ප්‍රමාදයක් නැතුව මොකක් හරි උත්තරයක් දෙනවා. ඒ වගේම එයා කියනවා. මං මේ කියන ඒවා බොරු නම් ටිකක් කල්පනා කරන්න වෙනවනේ. අහපු හැටියෙම මං කොහොම ද පිළිතුරු දෙන්නේ බොරුවක් නම් කියලා. දානේ වළඳන කොට හැමදාම එයා දන් සාලෙටත් එනවා. ඇවිත් සක්මන් කරමින් ඉන්නවා. ටිකක් දන් ශාලාවේ වැඩටත් උදව් කරනවා. එක දවසක් දානෙට කටුවල්ලන් මාළු ගෙනත් තිබුණා. මං ඇහුවා සාදයියට කතා කරලා "සාදයියේ මේ ලෝකේ මැව්වා කියලා කියන්නේ සාදයියනේ". (අපි එයාට පණ්ඩිත උන්නැහෙ කියලත් කියනවා) මං ඇහුවා පණ්ඩිත උන්නැහේ ඒ ලෝකේ මවන කාලේ මේ කටුවල්ලන්ට මෙච්චර කටු තිබ්බේ මොකද කියලා. මිනිහා එකවරටම කිව්වා. ඔය රසය ගන්න බැහැනේ ඔය විදිහට කටු තියලා මැව්වේ නැත්නම් කියලා.

සාදයියා ව්‍යාකරණ වලට හරි විරුද්ධයි. එයා කියන්නේ ඒක අභිකුණ්ඨික භාෂාව කියලා. අපි ඒ කාලේ පොඩි ඇත්තන්ට ඔය ව්‍යාකරණ වගේ දේවල් උගන්වනවා. ඒ වගේ වෙලාවල් වලදී සාදයියත් ඇවිදින් පැත්තකින් වාඩි වෙලා අහගෙන ඉන්නවා. ව්‍යාකරණ වගේ පාඩමක් උගන්වන කොට එයාට තේරුම් ගන්න පුළුවන් එකම දෙයක්වත් ඒකේ නැහැ. ඒ නිසාම එයා කියනවා ඒකට අභිකුණ්ඨික භාෂාව කියලා. සාදයියා කියන්නේ මේ ලෝකය හැදුවෙ

එයා කියලා. ඉස්සෙල්ලම මේකෙ තිබුණේ ගල් පර්වතයක් ලු ! ඔය ගල් පර්වතේ එයාට විතරක් ඉන්න පොඩි ගල් ගුහාවකුත් තිබුණලු ! එයා ඒ ගල් ගුහාවේ ඉඳගෙන මේක විශාල කරලා, මහත් කරලා, මේ සේරමත්, මේ මිනිසුන්වත් එයා මැව්වා කියලා කියනවා. ඒ මැව්ව මිනිස්සුන්ගේ ගණන දස ශත අසංඛ්‍යයක් කියලා කියනවා. එයින් පංච ශත අසංඛ්‍යයක් ගැහැණුලු. පංච ශත අසංඛ්‍යයක් පිරිමිලු. මේ පොළවේ මුල් අඩියේ තියෙනවලු නිර්වාණ ඇංජිම කියලා ඇංජිමක්. හැමෝම කල්පෙකට සැරයක් ඔතෙන්ට ගිහිල්ලා සංස්කාර පුරවා ගෙන එන්න ඕනෑ කියලත් කියනවා. ඒ පුරවා ගෙන එන සංස්කාර වලින් ලු මේ මිනිස්සු වැඩ කරන්නේ. ඉතින් ඔහොම අමුතු ලෝකයක් ගැන තමයි එයා කියන්නේ.

**තව මොනවද නායක හාමුදුරුවනේ ?**

එක දවසක් සාදයියා එන කොට මම කුමාරතුංග මහත්තයගේ ව්‍යාකරණ පොත බල බලා හිටියා. මම ඒ පොත බලාගෙන ක්‍රියාවක් වරනැගෙන හැටි ටිකක් හයියෙන් කිව්වා. බලා . . . බලති . . . බලහි . . . බලහු . . . බලමි . . . බලමු . . . ඔය විදිහට ටිකක් ඇදලා කිව්වා. කියලා, මං ඇහුවා සාදයියෙ මේකේ තේරුම මොකක්ද කියලා. එක වරටම කිව්වා ඕක තමයි අවීචි මහා නරකයේ තිරි සතුන් ගේ විලාපය කියලා. අවීචි මහ නරකයේ ඉන්න අය දවාලට ගොවිතැන් කරලා අනිත් අය වගේ ජීවත් වෙනවා. රාත්‍රියට ගෙට ආවාම ශරීරයේ වේදනා ඇති වෙනවා. ඒ වේදනා නැති කරගන්න උඩින් ලණු බැඳලා ඒවායේ එල්ලිලා ඕවා කිය කියා ඉන්නවා කියලා. සාදයියා තවත් කියන කථාවක් තමයි එයාට දිවැස් තියෙනවා කියලා. එයා කියනවා ගිහින් බලන්න පුළුවන් ඒවා එයාට පේන්නේ නෑ, ගිහින් බලන්න බැරි ඒවා තමයි එයාට පේන්නේ කියලා. බිත්තියෙන් එහා පැත්තේ තියෙන්නේ මොනවද ඇහැව්වොත් එයාගේ දිව්‍යඥානයට ඒක පේන්නේ නැහැ.

සාදයියා කියන තවත් කථාවක් තමයි, හොඳ බඩු වලට කියන්නේ රජගහ නුවර බඩු කියලා. රජගහ නුවර ගැන ලොකු විස්තරයකුත් සාදයියා කරනවා. ඒක වටේට ලෝකඩ බැම්මක් දාලා තියෙනවලු. තවත් කියන එකක් තමයි ටිකක් රතු පාට එක්කෙනෙක් ආවොත් එයා චීනෙන් ආව එක්කෙනෙක් කියලා. කළු පාට එක්කෙනෙක් ආවොත් කියන්නේ එයා නුත්තිකුඩියෙන් ආව එක්කෙනෙක් කියලා.

තවත් ඉතාම රසවත් සිද්ධියක් මං කියන්නම්. සාදයියා ගැන. දවසක් සාදයියට වඩා සැරට පිස්සුව තියෙන එක්කෙනෙක් මේ පන්සලට ආවා. ඇවිදිල්ලා මේ මිදුල මැද තිබුණ අඹ ගහක් යට වාඩි වෙලා එයා දිගටම දේශනා කරන්න පටන් ගත්තා. කවුරුවත් ගිහිල්ලා මොනවා කිව්වත්, මොනවා ඇහුවත්, කිසිම ගාණක් නැතුව එක දිගටම දේශනාව කරගෙන ගියා. අපි ඉතින් ඔය වගේ අමුතු කෙනෙක් ආවහම ප්‍රශ්න අහන්න යවන්නේ සාදයියව. "සාදයියේ, හොඳ පණ්ඩිත කෙනෙක් ඇවිදිල්ලා ඉන්නවා ගිහිල්ලා ප්‍රශ්නයක් දෙකක් අහන්න කියලා කිව්වා. සාදයියා ගිහිල්ලා එයාට කථා කළා. ගාණකටවත් ගත්තේ නෑ. එයාගේ දේශනාව දිගටම කරගෙන යනවා. සාදයියා ඇවිත් අපට කිව්වා, "බටුවන්තුඩාවේ පඬිතුමා" කියලා කියන්නේ එයයි. එයත් එක්ක නම් බැහැයි කියලා.

තවත් කාරණයක් තමයි, දවසක් මේ ධර්ම ශාලාවට සෙනග රැස් වෙලා ඉන්න වෙලාවේ සාදයියට මං කිව්වා ගිහිල්ලා ඒ අයට යන්න කියන්න කියලා. මිනිහා හරි බයයි. මිනිහ ගිහිල්ලා අර මිනිසුන්ගෙන් අහනවා උඹලා සම්මාදම් වෙලා තියෙනවා ද මේකට කියලා. ඒගොල්ලො කිව්වා ඔව් කියලා. ඒ එක්කම මිනිහා කෑ ගහන්න පටන් ගත්තා, අසාධාරණ කාරයගෙන් සම්මාදන් අරන් තියෙනව නම් අසාධාරණකාරයටත් ඉන්න දෙන්න ඕනෑ කියලා. ඔහොම තමයි ඉතින් සාදයියගේ හැටි.

## තවත් කවුද නායක හාමුදුරුවනේ ඒ වගේ අය ?

ඒ කාලේ හිටියා සංකු පණ්ඩිත කියලා එක්කෙනෙක්. එයා ඉස්සර දොන් කරෝලිස් එකේ රස්සාවක් කරමින් ඉඳලා තියෙනවා. ඉස්සර සිරිධම්ම හාමුදුරුවෝ ඉන්දැද්දි විශුද්ධාරාමේ, ඉරිදා හවසට බණක් කියනවා. බණ අහන්න සෙනග එනවා. සංකු පණ්ඩිතත් එනවා. පස්සේ සංකු පණ්ඩිත කියන එක්කෙනා ශ්‍රද්ධාවෙන් මහණ වුණා. මහණ වුනාට පස්සේ එයාට නම තිබ්බා සීලවංශ කියලා. ටික දවසකින් එයා විශුද්ධි මාර්ගය ශුද්ධ කරන්න පටන් ගත්තා. පරණ ඔය පුස් කොල පොත් වලත් මුද්‍රිත පොත් වලත් ඔය කුරුස ලකුණ වගේ ලකුණු තියෙනවා. එයා විශුද්ධි මාර්ගය ශුද්ධ කරනවා කියලා කළේ අර වගේ ලකුණු දැක්කහම කටු ගාලා කපලා දාන එකයි. මොකද, ක්‍රිස්තියානි බලය මේ පොත් වලටත් ඇවිල්ලා කියලයි

එයාගෙ කල්පනාව. ටිකක් කල් යන කොට ශීලයයි, ප්‍රඥාවයි දෙකම එකට තියෙනවා කියලා ශීලවංශ කියන නම වෙනස් කරලා ශීල පඤ්ඤ කියන නම එයාම දා ගත්තා. එක් එක්කෙනා මේ නම එක එක විදියට කියන්න පටන් ගත්තා. අන්තිමට මෙයා සිවුරුත් ඇරියා. ඊළඟට මෙයාට පාලන් සිඤ්ඤො කියන නම කියන්න පටන් ගත්තා. අන්තිමට පාලන් උන්නැහෙ කියලත් කිව්වා. එයා සිවුරු ඇරියත් පිළිගැන්නුවේ නැත්නම් මොනම දෙයක්වත් ගන්නෙ නෑ. කන්නෙත් නෑ. බොන්නෙත් නෑ. හැම දෙයක් ම එයාගෙ අතටම පිළිගන්වන්න ඕනෑ. කොළඹ ඉන්දැද්දී පයිප්පය ඇරලා වතුර ටිකක්වත් ගන්නේ නෑ. පයිප්පෙ ළඟට ගිහිල්ලා බලාගෙන ඉන්නවා කවුරු හරි ඇවිල්ලා පයිප්පය අරිනකම්. එතකොට මෙයත් කෝප්පෙ අල්ලලා වතුර ගන්නවා. එයා පයිප්පය ඇරලා වතුර ගන්නේ නෑ. සිවුරු ඇරලා ඊට පස්සේ එයාට තිබ්බිච්ච මූලිකම වැඩේ තමයි අනිත් අයට අවවාද කිරිමඃ ඉගැන්වීම. හැබැයි එයාගේ අවවාද හරි ගණන්. එයා ගණන් තියාගෙනත් ඉන්නවා. අසවලාගෙන් මෙච්චර එන්න තියෙනවා, අහවලාගෙන් මෙච්චර එන්න තියෙනවා කියලත් කියනවා. එයාගේ රස්සාව අවවාද විකිණීමයි. නමුත් කවුරුවත් අරගෙන සල්ලි දෙන කෙනෙක් නෑ.

තවත් එක්කෙනක් ගැන මං කියන්නම්. එයාගේ නම ගණ්ඨාරතිස්ස. එයා මට බැනලා දවසක් ලියුමක් එවලා තිබුණා. මං ඒකට ස්තුති කරලා එයාට ලියුමක් යැව්වා. ඊට පස්සේ මගෙත් එක්ක යාලු වුණා. එයා අන්තිම කාලේ හිටියේ බුදුරුවගල කැලේ. එයා කරන්නේ ධ්‍යාන ක්‍රීඩාව. එයා ඉතින් ඔය තිකම් පාරේ යන කොටත් හරි හයියෙන් "සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති" කිය කියා යනවා. ඒක තමයි එයාගේ ධ්‍යාන ක්‍රීඩාව. ඒ විතරක් නෙමෙයි මග දිගටම යන ගමන් බොහෝ ස්ථානවල දී මේ පාඨය නාසයෙනුත් හරිම හයියෙන් කියනවා. හුඟක් ඈතට ඇහෙනවා. ඒ නිසා දවසක් මං කිව්වා, ඔය ගිහි නම් වලට වඩා හොඳයි මෙන්න මේ ගණ්ඨාරතිස්ස කියන නම කියලා. ඊට පස්සේ එයා ගණ්ඨාරතිස්ස වුණා. ඉතින් එයා බුදුරුවගල කැලේ ඉන්දැද්දිත් ඔය ශබ්දය මහ හයියෙන් කරනවා. ඒ නිසා අවට ඉන්න මිනිස්සු බය වෙලා විරුද්ධත්වයක් ප්‍රකාශ කළා.

මෙහාට ආව සිහිමඳ ගතියෙන් යුක්ත තව එක්කෙනෙක් තමයි ධර්මපාල. දවසක් රාත්‍රියේ මේ ජනේලේ ළඟට ඇවිදිල්ලා මට කථා කරලා කිව්වා එහා පන්සලේ මෝල් ගහ මං මෙහාට අරගෙන ආවා කියලා. මේක මෙහේ තියලා මේ පන්සලේ මෝල් ගහ එහා පන්සලට ගිහින් තියන්න ද කියලා ඇහැව්වා. මං කිව්වා ඕකම ගිහිල්ලා ඒ පන්සලෙන් තියන්න කියලා.

**මහානායක හාමුදුරුවෝ ළඟට ඔය වගේ අය හුඟාක් ආවා නේද ?**

ඔව්. මං ඉතින් ඒ අයව හොඳින් පිළිගන්නවනේ. විනෝදෙට වගේ ඒ අයත් එක්ක මං හුඟක් කථා කර කර ඉන්නවා. තවත් එකක් තමයි බුදු වෙච්ච උපාසකම්මා කෙනෙක් මට ලියුමක් එවා තිබුණා. එයාගෙ නම සුමනා සර්වඥ. ඒ වගේ අයගෙනුත් හරියට මට ලියුම් එනවා.

කලකට පෙර මට අනුරාධපුරයේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයෙන් "**ප්‍රවචන විශාරද**" කියන ගෞරව නාමය පිරිනමන්ට සම්මත කරලා ලිපියක් එවා තිබුණා. මං ඉතින් ඒ ගැන හොඳ ලිපියක් ලියා යැව්වා ඒ ලිපිය අවසානයේ ජාතක පාළියේ නාම සිද්ධි ජාතකයේ එන ගාථාවකුත් ලියා යැව්වා, මතකයි. ඒ ජාතක කතාවේ තියෙන්නේ පාපක නම් මානවකයා තමන්ගේ නම හොඳ නැති බව කියා දිසාපාමොක් ආචාරීන්ගෙන් හොඳ නමක් ඉල්ලා සිටියා. දිසාපාමොක් ආචාර්යවරයා මේ ගෝලයාට ජනපදයේ ඇවිද හොඳ නමක් සොයා ගෙන එන ලෙස කීවා. එවිට ජීවක (ජීවත්වන තැනැත්තා) නම් ඇත්තා මැරී ඇති බවත් ධනපාලී (ධනය තියෙන තැනැත්තී) නම් ඇත්තී දුප්පත් වී ඇති බවත් පන්ථක (මාර්ගය දන්නා තැනැත්තා) නම් ඇත්තා මං මුලාවී ඇති බවත් දැන ආපසු ඇවිත් නමෙන් ඇති වැඩක් නෑ. තියෙන නමම හොඳයි කියා දිසාපාමොක් ආචාරීන්ට කීවා. දිසාපාමොක් ආචාරීන් ඔහුගේ ඒ සිදුවීම ගලපා මේ ගාථාව කීවා.

**ජීවකඤ්ච මතං දිසවා - ධනපාලිඤ්ච දුග්ගතිං**
**පන්ථකඤ්ච වනෙ මූළ්හං - පාපකො පුනරාගතොති**

ඔන්න ඔය ගාථාව ඒ ලියුමේ ලියලා යැව්වා. ඒ අය මොනව හිතුවද දන්නේ නෑ. නම් ගැන කියන කොට ඉස්සර පත්තරේකද

කොහෙද තිබුන විහිළු කථාවක් මතක් වෙනවා. පන්සලක ලොකු හාමුදුරුවෝ ලිඳේ වැටිලා තියෙනවා. මේ හාමුදුරුවන්ගේ නම හුඟක් දිග එකක්. පන්සලේ ඇබිත්තයා දුවගෙන දුවගෙන ගිහිල්ලා ගමේ දායකයන්ට මේක කියන්න සූදානම් වෙලා ලිඳේ වැටුණ හාමුදුරුවන්ගේ නම කියාගෙන යන කොට නම දිග නිසා අමතක වෙනවා. ආයිමත් මුල පටන් නම කියන්න පටන් ගන්නවා. ඉතිං අන්තිමට ඇබිත්තයාට හාමුදුරුවන්ගේ නම කියන්න බැරිව හාමුදුරුවෝ ලිඳෙන් ගොඩ ගන්න බැරිවෙලා තියෙනවා.

මීට අවුරුදු ගණනාවකට උඩදී මට පණ්ඩිත උපාධියක් දෙන්න සූදානම් කරලා ප්‍රාචීන භාෂෝපකාර සමිතියෙන් ආරාධනාවක් ලැබුණා. ඒක ගන්න එන්න කියා. මම මුදල් පරිහරණය කරන්නේ නැති නිසා එහෙ මෙහෙ එන්න යන්න කොලුවෙක් මෙහෙ හිටියා. මෙහෙ හිටිය කව්රු හරි කොලුවට කියල තියනවා ඕකට ගියාට මොකවත් හම්බ වෙන්නේ නෑ. කොළ කැල්ලක් විතරයි හම්බ වෙන්නෙ කියලා. ඉතිං කොලුව කිව්වලු කොළ කැල්ලක් හම්බ වුනොත් විසි කරල එනවා. වටිනා දෙයක් හම්බ උනොත් අරන් එනවා කියලා.

# ජීවත්ව සිටින එකම සොහොයුරියගෙන් . . .

# 9

**රේරුකානේ චන්ද විමල මහා නායක මාහිමියන් වහන්සේගේ ජීවත්ව සිටින එකම සොහොයුරිය ඩී.ඩී. සෙලෝහාමි උපාසිකා මාතාව කියන කථාව**



**ජීවත්ව සිටින එකම සොහොයුරිය ඩී.ඩී. සෙලෝහාමි උපාසිකාව (වයස අවු. 96 යි)**

මං උපන්නේ 1900 අප්‍රියෙල් 02 දා. නායක හාමුදුරුවන්ගේ පුංචි කාලය ගැන එච්චර දෙයක් මට මතක නැහැ. මොකද, අපි දෙන්නගේ වයසෙ වෙනස අවුරුදු 03 යි. මට මතකයි මහණ වෙන්න එක්කරන් ගිය පෙරහැර. ගෙදර ඉඳලා එක්කරන් ගියේ ලස්සන පෙරහැරකින්. අපේ නායක හාමුදුරුවෝ පුංචි කාලෙත් කිසිම කලබලයක් නැතුව හිටිය කෙනෙක්. නායක හාමුදුරුවන්ගේ ගිහි නමත් මං කියන්නම්. රුබෙල් සිඤ්ඤෝ. මහණ වුණේ අවුරුදු 09 දී. ඉස්කෝලේ ගියේ දෙවෙනි කැලෑසියට.

මහණ වෙනවට අපේ තාත්ත තමයි වැඩිය කැමති වුනේ. මොකද, බුරුම හාමුදුරු නමක් ඇවිදින් හිටියා, ඔය පොකුණුවිට ආසන්නයේ තියෙන කුළුපන කියන කන්දේ. අපේ තාත්තත් හැමදාම වගේ ගියා ඔතනට බණ අහන්න. ඒ හාමුදුරුවෝ මේ මහණ වීමේ වටිනාකම ගැන නිතර නිතර බණ කිව්වලු. තාත්තත් බොහොම පැහැදිලා දවසක් ගෙදර ඇවිත් අපේ අයියගෙන් ඇහුවා, "උඹටත් මහණ වුණොත් නරක ද කියලා." අපේ තාත්ත විතරක් නෙමෙයි මේ පළාතේ හුඟක් අම්මල තාත්තල මේ බුරුම හාමුදුරුවෝ ගැන පුදුම විදිහට පැහැදිලයි හිටියේ. ඒ නිසා තම තමන්ගේ දරුවන් මහණ කරන්නත් හරියට කැමති වුණා. අපේ අයියත් එක්ක තවත් 26 දෙනෙක් මහණ වුණා කියලයි මට මතක තියෙන්නේ. ඒ අයගෙන් පුංචිම එක්කෙනා තමයි අපේ අයියා.

ටික දවසක් යන කොට මේ බුරුම හාමුදුරුවෝ මේ පොඩි හාමුදුරුවරු ටිකත් එක්කර ගෙන බුරුමෙට ගියා. කවුරුවත් ඒකට විරුද්ධ වුණේ නෑ. මට මතකයි අපේ හාමුදුරුවෝ උපසම්පාදවත් ලැබුවට පස්සෙයි ලංකාවට ආවේ. ඒ අතරතුර ලියුම් එහෙම ගෙදරට එව්වා. දැන් ඉතින් අපේ හාමුදුරුවෝ ගැන මට සතුටුයි. අපේ හාමුදුරුවෝ හරි කරුණාවන්තයි. මාත් හාමුදුරුවන්ට හරි කරුණාවන්තයි. අපේ නායක හාමුදුරුවෝ හොඳට ධර්මය දන්නවා. ඒ වගේම හරි වටිනා ධර්මය පිළිබඳ පොත් පත් හුඟක් ලියලත් තියෙනවා. මාත් ඒ පොත් පත්වලින් වැඩි හරියක් කියවලා තියෙනවා.

දැන් ඉතින් මං ගැනත් කියන්නම් කෝ. මගේ ඇස් දෙක තවමත් හොඳට පේනවා. කන් දෙකත් හොඳට ඇහෙනවා. කණ්නාඩිය දාගත්තම කියවන්නත් පුළුවන්. ඉඳ හිට පපුවට මහන්සියක් දැනෙනවා. මට දැන් ඇවිදින්න බැහැ. මොකද දවසක් මම වැටුණා. ඒ වැටුනට පස්සේ අඩිය තියලා යන්න බැහැ. මේ ළඟදී අපේ නායක හාමුදුරුවන්ගේ උපන් දිනයට ගහපු කොළයක් කවුද මට ගෙනත් දුන්නා. මං හිතන්නේ ඒ නායක හාමුදුරුවන්ගේ 99 වැනි උපන් දිනය වෙන්න ඇති. ඒ කොළයත් මං කියවලා ඔන්න ඔය ලාච්චුවට දාලා තිබ්බා.

අපේ මහ ගෙදර මුලින්ම තිබ්බේ වරිච්චි බිත්ති. පොල් අතු සෙවිලි කරලා තිබුණා. බිමට ගොම මැටි ගාලා තිබුණා. දැන් නම් ඒ ගේ කපරාරු කරලා උළු සෙවිලි කරලා තියෙනවා. එක එක්කෙනාට

පුළුවන් වෙන කොට එහෙම කරනවනේ. අපේ මහගෙදර මහ විශාල එකක්. ඒ කියන්නේ අම්මාගේ අම්මා ආච්චි හිටිය ගෙදර. ඒ මහ ගෙදර අර අරියඥාන (උපැව්දිවි ආරියරත්න) කියන අයත් හිටියා. එහේ ඉඳලා අපේ තාත්තා අම්මවයි. අපේ අයියවයි එක්කර ගෙන එන්න කලබලේට වගේ ඔය දැන් තියෙන පුංචි ගේ හැදුවේ. දැන් ඉතින් ඒ ගෙටත් අවුරුදු 100 කට කිට්ටු ඇති. ඔය ඉඩමේ හරියට පොල් ගස් තිබුණා. පොල් ගස් 100 කටත් වැඩිය තිබුණ කියලයි මට මතක.

ඉතින් අපේ හාමුදුරුවෝ ගැන කියන කොට පුංචි කාලේ සිද්ධ වුණු ලස්සන සිද්ධියක් මං කියන්නම්. දවසක් අල්ලපු ගෙදර වරකා ගහකින් වරකා කැඩුවා. ඔය දවස්වල අපේ අයියගේ ඇඟේ පළු වගයක් පිට දාලා ටිකක් සනීප නැතුවයි හිටියේ. ඒ නිසා අයියට වරකා කන්න දුන්නේ නැහැ. ඉතින් මේකට හොඳටම කේන්ති වෙලා අනිත් අයටත් වරකා කන්න දෙන්නේ නෑ කියලා, ගහ ළඟට ගොහින් වටේටම පිට ඇතුල්ලුවා. එහෙම කළේ වරකා ගහටත් හොරි බෝ කරන්න කියලයි.

අපේ අම්ම තාත්තා දෙන්නම හොඳ උස මහත අය. අපේ හාමුදුරුවොත් හොඳට උසයි. එච්චර මහත නම් නැහැ. මාත් ඉතින් ඒ වගේ උස මහත කෙනෙක්. ඒ දවස්වල මට හැට්ටයක් මහන්න රෙදි යාරයක් ඕනෑ. ඒ තරුණ කාලේ ගෙදර ඉන්න දවස්වල මට හොඳට වැඩ කරන්නත් පුළුවන්. වී බුසල් දෙක ඔළුව උඩ තියාගෙන ගෙදරට ගේනවා. ඒ තරම් හයියක් මටත් තිබුණා. හැබැයි ඒ තරුණ කාලේ. මට ඒ කාලේ හොඳට කන්නත් පුළුවන්. ඒ කාලේ හොඳට කෑම බීමත් තිබුණා. වැඩත් ඒ වගේම කළා. ඉස්කෝලේ හයට පාස් වුණා විතරයි. ඊට පස්සේ අම්මා මාව ඉස්කෝලේ යැව්වේ නෑ. ළමයි බලා ගන්න තියෙනවා කියලා ගෙදර නතර කර ගත්තා. මල්ලිලා බලා ගන්න, ඒ අයගේ වැඩ කරන්න මට පැවරුණා. පහ පාස් වෙන කොට මාව ගෙදර නවත්තා ගත්තේ නැත්නම් මටත් හොඳට ඉගෙන ගන්න තිබුණා. මට හොඳට ඉගෙන ගන්න පුළුවන්. ඒ කාලේ ඔය හතර පහ එකට දාලා මනෝම ගණන් එහෙම අහනවනේ. මං ඒවා හොඳට කිව්වා. ඒ කාලේ එහෙම කිව්වා ම ඒ අය පන්තියේ මුලට දානවා. ඒ කාලේ ඕනෑම දෙයක් හොඳට මට මතක හිටිනවා.

මාත් එක්ක අපේ අයියා පුංචි පුංචි රණ්ඩුත් වුණා. ඉතින් පුංචි කාලේ රණ්ඩු ඉක්මණින් ඉවර වෙනවානේ. ළමයි වුණාම එහෙමනේ.

# ශිෂ්‍ය කල්‍යාණධම්ම හිමියන්ගෙන් . . .

# 10

**රේරුකානේ චන්දවිමල මහා නායක මා හිමියන් වහන්සේගේ ශිෂ්‍ය, කල්‍යාණධම්ම හිමියන් මහානායක හාමුරුවන් ගැන කියන කථාව**

නායක හාමුදුරුවන් ගේ මුල්ම උපස්ථායකයා වශයෙන් සිටියේ මං. පුංචි කාලයේ ඉඳලම අවශ්‍ය වත් පිළිවෙත් මං කළා. එදා ඉතින් අද වගේ කළයුතු වත්පිළිවෙත් උපස්ථාන කටයුතු රාශියක් තිබුනේ නැහැ. උදේට මූණ හෝදන්න උණු වතුර ටිකක් සකස් කොට තැබීම, දානය සකස් කොට පිළිගැන්වීම, ගිලන්පස ටික හදා පිළිගැන්වීම, වගේ සීමිත වැඩ කොටසක් තමයි තිබුණේ. ඒ කාලයේ ඉඳන් ම නායක හාමුදුරුවන්ගේ ජීවිතයේ දකින්නට ලැබුණු විශේෂම දෙයක් තමයි විකාල භෝජනයට අයත් කිසිවක් නො ගැනීම. දවල් දොළහෙන් පස්සේ කවදාවත් පිටි කිරි ටිකක්වත් අරගෙන නැහැ. ලස්සන සිද්ධියක් මට මතකයි. කලකට පෙර නායක හාමුදුරුවන්ට තද උණ රෝගයක් හැදිලා දවස් හයක් විතර කිසිම ආහාරයක් ගත්තේ නැහැ. ඒ නිසා හැම දෙනාම මට කිව්වා නායක හාමුදුරුවන්ට හෝර්ලික්ස් ටිකක් හදලා දෙන්න කියලා. මං හෝර්ලික්ස් ටිකක් හදාගෙන සවස හතරට විතර අරගෙන ගිහින් පිළිගැන්නුවා.

"ඒ බොල . . . . මං වෙනදත් මේවා මේ වෙලාවට වැළඳුව ද ? අරන් යන්න" කීවා.

ශික්ෂා පදය කැඩෙන ආකාරයේ මොනම දෙයක් වත් වෙලාවෙන් පසුව කවදාවත් ගත්තේ නැහැ. පුදුම විදිහට ඒ ශික්ෂා පදය රකිනවා. දැන් ඇස් දෙකම කොහෙත්ම පේන්නෙ නැහැ. ඒ

නිසාම ඔක්කෝටම නීති පතවල තියෙනවා. උදේ ඉඳලම නිදාගෙන ඉඳලා සවස අවදි වුණාම නායක හාමුදුරුවෝ හිතන්නේ දැන් උදේ කියලා. හා . . . දැන් සූදානම් කරල තියෙන දෙයක් ගන්න කියලා කියනවා. නායක හාමුදුරුවනේ දැන් වෙලාව සවස පහයි කීවාම නිහඬ වෙනවා. අවේලාවට කිසිවක් ඉල්ලුවත් කොහොමවත් දෙන්න එපා කියලා නීති පනවලා තියෙන්නේ. ඒක ඉතින් කවුරුත් ඒ විදිහට පිළිපදිනවා.

පොත්පත් ලිවීමත් විශේෂයි. මොකවත් බලාගෙන ලිවීමක් නායක හාමුදුරුවන්ගේ නැහැ. උදේම නැගිටලා කටයුතු අවසන් කරලා, දානේ වළඳලා, ඩිංග වෙලාවක් ඉන්නවා. ඊට පස්සේ සීමාව ළඟ ඉඳලා සංස්කාර කුලුණ දක්වා, කීප වරක් එහාට මෙහාට සක්මන් කරලා ඇවිත් ඉස්සරහ පුටුවේ වාඩි වෙලා ලෑලි කෑල්ල අරගෙන ලියන්න පටන් ගන්නවා. ඔය අතර කවුරු හරි ඇවිදින් කථා කළොත්



**අතිගරු මහා නා හිමියන් සමඟ දයාබර ශිෂ්‍ය කල්‍යාණධම්ම හිමි.**

වචනයකින් භාගයක් ලියලා තිබුණත් එතනින් නතර කරලා එයත් සමඟ කතා කරනවා. ආව එක්කෙනා ගියාම ආයිත් නතර කළ තැන සිට ටිකක් ලියනවා. කොහොම වුනත් දවසකට ලියන්නේ බොහොම ටිකයි. ලියන්නේ එක්කෝ උදේ, එක්කෝ දවල්. එක්කෝ සවස. සවස හයෙන් පස්සේ කිසිවක් ලියන්නේ නැහැ. කියවන්නෙත් නැහැ. මං මේ පන්සලට ආවට පස්සේ නම් කවදාවත් කිසිවක් රාත්‍රියට ලියලත් නැහැ. බලලත් නැහැ. රාත්‍රියට බොහෝ විට කළේ කවුරු හරි ඉන්නවා නම් කතා කර කර ඉඳීමයි.

නායක හාමුදුරුවන් ගේ ලිවීමේ තවත් එක විශේෂයක් තමයි ලියන දේ දෙවරක් නොලීම. ලියන එකමයි මුද්‍රණයට යවන්නේ. ලියූ දෙයක් වචනයක් හරි කපා වෙනසක් කොට තියෙන්නේ ඉතාම කළාතුරකින්. නායක හාමුදුරුවන් කළේ පොත් ලිවීම පමණයි. මුද්‍රණය කරවීම ආදී සියලුම කටයුතු කළේ අපි. පොතක් මුද්‍රණය කරලා ගෙනත් දුන්නම ඒ ගැන නායක හාමුදුරුවෝ සතුටු වෙනවා. ඒ පොත් කියවලා යම් යම් දෙනා ඇවිත් නායක හාමුදුරුවන්ට පින් දෙනවා. එතකොට උන්වහන්සේ වඩ වඩාත් සතුටු වෙනවා.

මගේ සිත ගත් වැදගත්ම කොටසක් තමයි නායක හාමුදුරුවන්ගේ ජන්ම දින පින්කම. 1947 අවුරුද්දේ ඉඳලා ඒ පින්කම් විශාල වශයෙන් කරන්නට පටන් ගත් බවයි මට මතක තියෙන්නේ. "චතුරාර්ය සත්‍යය" පොත ලීවත් මුද්‍රණය කරන්න මුදල් කීයක්වත් අප ළඟ තිබුණේ නැහැ. ඒ නිසා ඒ පොත මුද්‍රණය කිරීමට කීප දෙනෙකුගෙන් ණයට ගත්තා. අන්තිමට මේ පොතෙන් ලැබුණු මුදල් වලින් ණයත් ගෙවලා රුපියල් 500 ක් ඉතිරි වුණා. අන්න ඒ මුදලින් නායක හාමුදුරුවන්ගේ උපන් දින පින්කමක් කළා කැළණි රාජමහා විහාරස්ථානයේදී.

කැළණි චෛත්‍යය වටා දෙරියනෙන් දෙරියනට උඩ රටින් ගෙනා මල් දැමූ කලස් තියලා, මල්, පහන්, ගිලන් පස, බුද්ධ පූජාවක් පැවැත්තුවා. ඒවා නායක හාමුදුරුවන්ගේ අදහස්වලට අනුවයි පිළියෙළ කළේ.

එක් වර්ෂයක අනුරාධපුරයට ගිහිල්ලා රුවන්වැලි සෑය අබියස විදුලි ආලෝක පූජාවක්, මල්, පහන්, ගිලන්පස පූජාවක් ඉතාම උත්කර්ෂවත් අන්දමින් සිදු කළා.

එක් වර්ෂයකදී අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස දී මහා පූජාවක් සිදු කළා.

තව අවුරුද්දක තිස්සමහාරාමයට ගොස් මල්, පහන්, ගිලන්පස, පූජාවක් තැබුවා. ඊළඟ අවුරුද්දේ කතරගම කිරි වෙහෙර අබියස මහා පූජාවක් සිදු කළා.

කතරගම ගොස් තවත් අවුරුද්දක දිළින්දන් සඳහා ආහාර පාන වස්ත්‍රාදිය පරිත්‍යාග කරලා විශාල පින්කමක් කළා.

කළුතර බෝධීන් වහන්සේ ළඟට දිනක් උදේ වරුවේ ගිහිල්ලා එතනට දිළින්දන් රැස් කරගෙන ඒ අය බෝධි මූලයෙහි වාඩි කරවා ආහාර පාන හා වස්ත්‍ර ආදියෙන් සංග්‍රහ කළා.

තවත් වරෙක හොරණ සහ මත්තේගොඩ මහලු නිවාසවල සිටින අයට ආහාර පාන වලින් සංග්‍රහ කළා.

එක් වසරක කොළඹ මහ රෝහලේ භික්ෂු වාට්ටුවේ සිටින ගිලන් භික්ෂූන් වහන්සේලාට දාන මානාදියෙන් සංග්‍රහ කරලා රෝද පුටු සහ ලෙඩුන් ගෙන යන ඇඳන් කීපයක් ද පරිත්‍යාග කළා.
එක් අවස්ථාවක කොර වාට්ටුවට ගොස් ඒ අයට ආහාර පාන වලින් සංග්‍රහ කළා. මේ අතර දිළින්දන් සඳහා ගෙවල් සාදවා ගැනීමට ආධාර කළා.

තවත් අවස්ථා කීපයක දී තුලාභාර දාන කීපයක් දුන්නා. තමන් ගේ බර ප්‍රමාණයට සහල් ආදී ද්‍රව්‍ය කිරලා දිළින්දන්ට දුන්නා. තවත් වරක කුඩා ළමුන් සිටින අම්මලාට (කිරි අම්මලාට) කිරි, පිටි, සීනි, තේ කොළ, සබන් හා වස්ත්‍ර පරිත්‍යාග කළා.

දරුණු නියඟය පැවති කාලයක අනුරාධපුරයේ සහ මිහින්තලා ප්‍රදේශයේ ගර්භනී මාතාවන්ට අවශ්‍ය දේ විමසා බලා පරිත්‍යාග කළා.

තවත් වරෙක කලා වැව ප්‍රදේශයේ ගංවතුරින් අනාථ වූවන්ට අවශ්‍ය දේ සපයා දුන්නා. මේ අතර එක් එක් වසරවල පිරිවෙන් වලටත් නායක හාමුදුරුවෝ දාන කීපයක් ම දුන්නා. ඒ අතර හොරණ

විද්‍යාරත්න පිරිවෙණ, මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙණ, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙණ, විශේෂයෙන් සඳහන් කරන්න පුළුවන්.

ඇතැම් වර්ෂවල මේ විහාරස්ථානයට සංඝයා වඩමවාගෙන සඟ සතු දාන පිරිනැමුවා. එක අවස්ථාවක භික්ෂූන් කැඳවා පැමිණි භික්ෂූන්ට පමණක් අවශ්‍ය දේ සඟ සතු නොකොට පරිත්‍යාග කළා. එවැනි අවස්ථාවල දී නායක හාමුදුරුවන් වචන කීපයක් පමණක් කියා මුලින් හෝ අගින් හෝ කිසිම අනුශාසනාවක් නැතිව සියළු කටයුතු ද අවසන් කළා. වැඩිය සියලු දෙනා වහන්සේම වළඳා අවසන් වී ආපසු වැඩියා.

තමන් වහන්සේගේ වයසේ ප්‍රමාණයට දිළින්දන් කැඳවා වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීමක් සමහර වර්ෂවල කළා.

එක වර්ෂයක ඉංගිරියේ මඩකඩ ආරණ්‍යයේ වස් වසල හිටියා. ඒ කාලයේ එම ස්ථානයේ පුංචි විහාරයක් කෙරෙව්වා.

දැනටත් නායක හාමුරුවෝ වැඩ සිටින සීමා මාලකය තැනවීම නායක හාමුදුරුවන්ගේ එක පින්කමක්. මේ අතර ළිං පොකුණු කීපයක් ද බන්දවා සකස් කළා. භික්ෂූන් වහන්සේලා ගේ වාසය සඳහා අවශ්‍ය ගෙවල් කීපයක් මේ ස්ථානයෙත් සුදුවැල්ලේ විනයාලංකාරාරාමයේත් සැදෙව්වා. ඒ දඬු පාලම් දැමීමේ වටිනාකම නිසාම දෙපා පාලම් පුංචි කොන්ක්‍රීට් ලෑලි දමා සකස් කළා. ඒ ඒ ඇත්තන්ගේ අවශ්‍යතා අනුව සිවුරු, ඇඳන්, පාත්‍රා ආදිය පරිත්‍යාග කිරිමත් කළා.

තවත් අවස්ථාවක කන්‍යාවන් සඳහා දෙන ලද දානයක් ද මගේ මතකයෙහි තියෙනවා.

නායක හාමුදුරුවන්ගේ මේ ජන්ම දින පින්කම් විවිධ විචිත්‍ර ඒවා බවයි මට පෙනෙන්නේ. බොහෝ දෙනෙක් නොසිතන පින්කම්වල නායක හාමුදුරුවෝ වැඩි වැඩියෙන් යෙදුණා.

**නායක හාමුදුරුවන් ගැන තවත් මගේ අත්දැකීම් කිපයක් කියන්නම්.**

නායක හාමුදුරුවන් හැම විටම ධර්මානුකූල, සත්‍යමය කරුණු කියමින් පුද්ගලයෙක් හෝ සමූහයක් හෝ හොඳින් දැනුවත් කිරීමට උත්සාහ කරනවා. සමහර විට ඒ අය කළ කිරෙනවා. අමනාප වෙනවා. නමුත් ඒ ගැන තැකීමක් නායක හාමුදුරුවන්ගේ නැහැ. මේ ළඟම මීමන ගමේ ගෙදරක දානයක් සූදානම් කරලා මෙහාට ආරාධනාවකට ආවා. දානෙ සියක් නමකට බවත්, දානය වැළඳීම් මැටි පාත්තරවලම කළයුතු බවත්, ඒ දායක පිරිස කියා සිටියා. මැටි පාත්තර සීයක් ඒ අය සූදානම් කර ඇති බවත් කීවා. නායක හාමුදුරුවන් ඒ අයට පැහැදිලි කරලා දුන්නා මැටි පාත්තරේ හරි, යකඩ පාත්තරේ හරි, පිඟානක හරි වැළඳුවාට කිසිම වෙනසක් නැති බව. මැටි පාත්තරේම වළඳන්න කියනවා නම් දානය බාර ගත නො හැකි බවත් කියා සිටියා. ඒ දායකයෝ දොස් කිය කියා යන්න ගියා. ඉන් පස්සේ පන්සලට ආවෙත් නැහැ.

තරුණ කාලෙ ඉඳලම නායක හාමුදුරුවන් ගේ සිරිත කවුරු හෝ පහදවා ගැනීම සඳහා කිසිවක් නො කීමයි. කිසිවක් නො කිරීමයි. ඒ ස්වරූපයෙහි කිසිදු වෙනසක් මං දැකලා නැහැ.

දුප්පතුන් ගැන විශේෂ අවධානයක් නායක හාමුදුරුවන් ගේ තියෙනවා. එබඳු ගෙදරකට දානෙට වැඩියාම නායක හාමුදුරුවෝ වැඩියෙනුත් බණ කියනවා. දුප්පතුන් දෙන දානය වැඩි වැඩියෙන් අගේ කරනවා.

තවත් විශේෂ අවස්ථාවක් මට මතක් වෙනවා. දවසක් පන්සලේ ඉඳලා සැතපුම් එකහමාරක් විතර දුරින් පිහිටි දාන ගෙදරකට ආරාධනා කරන්න පිරිසක් ආවා. දානෙට පෙරහරින් වැඩමවාගෙන යන්න ඕනෑ බවත්, ඒ අය කියා සිටියා. දානෙ භාර ගත්තා. දානෙට වඩමවාගෙන යන්න ආවෙත් දවල් 11 ට විතර. කොහොම වුණත් අර දුර ප්‍රමාණය පයින්ම වඩමවාගෙන ගියා. ගෙදරට ළඟා වන විට එකළොහමාරත් පහු වෙලා. නායක හාමුදුරුවෝ පන්සිල් දීලා දාන සාංඝික කරලා වැළඳුවා. අවසානයේදී දානය ගැන හොඳ බණක් කීවා. දානය කියන්නේ මේ භික්ෂූන් වහන්සේලාට කරදර, හිරිහැර, පීඩා කිරීම නොවන බවත්, එසේ දෙන දානය නිසා නියම

ආනිසංසයක් නොලැබිය හැකි බවත් පහදලා දුන්නා. දානය අනුන්ට යහපතක් කිරීම බවත් එය කරුණාවෙන් ප්‍රඥාවෙන් යුක්තව කළයුතු බවත් පැහැදිළි කර බණ කීවා. දායකයා හොඳටම කළකිරුණා. ඊට පස්සේ පන්සලට ආවෙත් නැහැ. දානෙ දුන්නෙත් නැහැ. නායක හාමුදුරුවන් කළේ දානය පිළිබඳව කරුණු නියම විදියට ම පැහැදිළි කරදීම පමණයි.

පන්සලට ආව මුල් අවස්ථාවේ සිට නායක හාමුදුරුවන් තුළ මට දකින්නට ලැබුණු තවත් ලක්ෂණයක් තමයි තිගැස්සීම, කම්පනය, ඇඬීම ශෝකය වගේ දේවල් නැති බව.

දවසක් බොල්ගොඩ පන්සලේ ඇඳ උඩ ඇළවෙලා ඉන්න අතර, වහලේ ඇදී ගිය විශාල ගැරඬියෙක් නායක හාමුදුරුවන් ගේ පපුව උඩට වැටුණා. වැටිච්ච ආමාරුවට ඌ ටික වෙලාවක් පපුව උඩම හිටියා. නායක හාමුදුරුවෝ කිසිම කම්පාවක්, තිගැස්සීමක් නැතුව එකම ඉරියව්වක හිටියා. ටිකකට පස්සේ ගැරඬියා හෙමින් හෙමින් ඇදී ගියා.

නායක හාමුදුරුවන්ගේ ප්‍රධාන ශිෂ්‍යයකු වන **ගොඩිගමුවේ සෝරත හාමුදුරුවන්** පපුවේ අමාරුවක් නිසා අපවත් වුයේ වැසිකිළියේදී. දෙතුන් දෙනෙක් ගොහින් උන්වහන්සේව ඔසවා ගෙන ආවා. නායක හාමුදුරුවන් ඒ දිහා බලලා කීවේ වැඩේ කෙරිල වගෙයි කියල ? කිසිම අමුත්තක් උන්වහන්සේ තුළ ඇති වුණේ නැහැ. හදිසි මරණයක් නිසා එක එක්කෙනාගේ කීම් පිට පොලිසියෙනුත් ආවා. එක පොලිස් නිලධාරියෙක් නායක හාමුදුරුවන් ළඟට ඇවිදින් කීවා හදිසි මරණයක් නිසා මිනිය කපා පරීක්ෂා කරන්න ඕනෑ කියලා. නායක හාමුදුරුවෝ එකවරටම කීවා "කපන්න බැරිනම් කපල කෑවත් කමක් නැහැ. හැබැයි හෙට අවසන් කටයුතු කරන්න ඕනෑ" කියලා. අර පොලිස් නිලධාරියා හෙමින් හෙමින් මිදුලට බැහැලා යන්න ගියා. නායක හාමුදුරුවන් කවදාවත් ශෝක වූ බවක්, ඇඬූ බවක් මං දැකලත් නැහැ. දන්නෙත් නැහැ.

මේ පොකුණුවිට ගමේ අපේ පන්සලේ ප්‍රධාන දායක මහත්මයෙකු වන **ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි** ඇමතිතුමා ගැන අහලා තියෙනවා නේද ? එතුමා අපේ නායක හාමුදුරුවන්ට හරිම හිතවත්

කෙනෙක්. හොරණ ආසනයට එතුමා කීපවරක්ම තරඟ කළා. ඒ විතරක් නෙවෙයි නාම යෝජනා භාර දීලා ඉස්සර වෙලාම එන්නේ අපේ නායක හාමුදුරුවන්ගේ ආශිර්වාද ලබා ගන්නයි. එහෙම පැමිණි වාරයකදී මට මතක තියෙනවා ඇවිදිල්ලා බුලත් අතක් දීලා වැඳලා නායක හාමුදුරුවන්ට කියනවා. නායක හාමුදුරුවනේ ! මම ඡන්දයට ඉදිරිපත් වුණා. මං ආවේ නායක හාමුදුරුවන්ගේ ආශිර්වාද ලබා ගන්නයි කියලා. ඔහොම ආව එක වාරයකදී නායක හාමුදුරුවන් කිසිම අමුත්තක් නැතිව කීවේ "මහත්තයා ඉදිරිපත් වෙච්ච එක හොඳයි. නමුත් දිනන්න නම් බැහැ කියලා" නායක හාමුදුරුවන් ගේ ඒ කීම අහගෙන ඉන්න අපට හිතෙනවා එහෙම කියන එක හොඳ නෑ කියලා. නමුත් නායක හාමුදුරුවන් ගේ සිරිත ඒකයි. හෙට්ටි ආරච්චි මහත්තයත්, කිසිම අමුත්තක් නැතිව ආපසු යනවා. ඊළඟ වාරයේත් නාම යෝජනා භාර දීලා එතුමා නො වරදවාම එන බව මා දන්න නිසා කලින් ම මා නායක හාමුදුරුවන්ට කීවා හෙට්ටිආරච්චි මහත්මයා ආවාම එහෙම කියන්න එපා කියලා. එහෙම කීවාම හිත නරක් වෙනවා කියලත් මං කීවා. මොකුත් නො කියා ආශිර්වාද කරන්න කියලත් කීවා. ඒ වාරයේදී ඒ විදියට කළා. හැබැයි මේ විදියට කීවාට ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහත්මයා කවදාවත් නායක හාමුදුරුවන් එක්ක තරඟ වුණෙත් නැහැ. කළකිරුණෙත් නැහැ.

අවුරුදු කීපයකට විතර කලින් නායක හාමුදුරුවන් බලන්න ආව ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි ඇමතිතුමා, හුඟක් වෙලා කථා කර කර ඉඳලා ඉල්ලීමක් කළා. නායක හාමුදුරුවන්ට අවශ්‍ය ඕනෑම දෙයක් ගැන මට කියන්න කියලා. ඒ ගැන මොකවත් කථා නො කළ නායක හාමුදුරුවෝ හෙට්ටිආරච්චි මහත්තයට හොඳ බණක් කීවා. කෙනෙකුගෙන් යමක් ඉල්ලා ලබා ගැනීම භික්ෂුවකට කොහෙත්ම නුසුදුසු දෙයක් බවත් ඒ තුළින් දෙපක්ෂයේම හොඳ හිත පලුදු වන බවත් කියා කරුණු පැහැදිලි කරලා දුන්නා. ඔක්කොම අහගෙන ඉඳලා වැඳලා එතුමා ගෙදර ගියා. එදා ඉඳලා අද මේ වන තෙක් හැමදාම උදේට දානෙ ටිකක් හදලා නායක හාමුදුරුවන්ට එවනවා. අවුරුදු හතරක් තිස්සේම නොකඩවා ම එවනවා. නායක හාමුදුරුවන් ගේ තත්ත්වය ඔහොමයි.

දවසක් දායක මහත්තයෙක් ඇවිදින් පාංශුකූලයකට ආරාධනා කළා. ඒ සඳහා හාමුදුරුවරුන් දහ නමක් අවශ්‍ය බවත් කීවා. නායක

හාමුදුරුවන්ගේ සිරිත ඒ වගේ වෙලාවල දී කරුණු පැහැදිලි කර දීමයි. පාංශුකූලය කියන්නේ කුමක්ද ? ඒ සඳහා භික්ෂූන් වහන්සේලා අවශ්‍ය ප්‍රමාණය ආදී සියල්ලම හොඳට පැහැදිලි කළා. "දායක මහත්තයා, ඔය පාංශුකූලයට එක නමක් හිටියාමත් හොඳටම ප්‍රමාණවත් කියලා අන්තිමට කීවා" දායක මහත්මයා තරහ වෙලා ගියා. වෙන පන්සලකින් ඒක ඒ අය කර ගන්න ඇති. ආයිත් ඒ දායක මහත්තයා පන්සලට ආවෙත් නැහැ.

මා දන්නා කාලයේ ඉඳන්ම නායක හාමුදුරුවන්ගේ ඇති විශේෂ හැකියාවක් ගැනත් කියන්න පුළුවන්. හැම වැඩකට ම නායක හාමුදුරුවන් දක්ෂයි. මේසන් බාස් කෙනෙක්, වඩු බාස් කෙනෙක්, යම්කිසි වැඩකට මෙහාට ගෙන්නා ගත්තත් ඒ අයට වැඩ කරන්න වෙන්නෙ නායක හාමුදුරුවන් කියන විදියටයි. මොකද නායක හාමුදුරුවන් ඒ හැම දෙයක් ගැනම හොඳට දන්නවා. තමන්ගේ අතේ පලැන තියාගෙන ඒ අනුව කරන්න කියලා නායක හාමුදුරුවෝ කියනවා. හැම දෙයක් ම හදන්න ප්ලෑන දෙන්නේ උන්වහන්සේ. ඇස් දෙකම නො පෙණෙන උන්වහන්සේට නිතර නිතර කෙළ ගහන්න අවශ්‍ය වෙනවා. ඒ සඳහා අල්ලන්න අඬුවක් තියෙන භාජනයක් නිතර ළඟින් තියාගෙන ඉන්නවා. ඒ අඬුව සහිත පුංචි භාජනය සමහර විට අතක් වැදී පෙරළෙන්න පුළුවන් නිසා ඒක තියන්න පුංචි ස්ටෑන්ඩ් එකක් හදලා තියෙනවා. අඬුව තියෙන භාජනය මනා සේ පිහිටා සිටින ලෙසටයි එය නිර්මාණය වී තියෙන්නේ. එයත් ඇස් නොපෙනෙන අවදියේ උන්වහන්සේගේ කීම අනුව සාදන ලද්දලක්. වැඩ ඉන්න මේ සීමා මාලකය ඉදි කරලා තියෙන්නේ නායක හාමුදුරුවන්ගේම ප්ලෑනක් අනුවයි. හැම දෙයක් ගැනම හැම අංශයක් ගැනම නායක හාමුදුරුවන්ට තියෙන දක්ෂතාව මහා පුදුමයි.

# අග්‍ර උපස්ථායක හිමියන්ගෙන් . . 11

**වසර පහළොවකටත් වැඩි කලක් මහානායක හාමුදුරුවන්ගේ සෙවනැල්ල මෙන් සිටින අග්‍රඋපස්ථායක කිරිඔරුවේ ධම්මානන්ද හිමියන් කියන කථාව . . .**

මං පැවිදි වුණේ රේරුකානේ මහා නායක හාමුදුරුවන්ගේ දහම් පොත් කියවීම නිසා, ඒ ගැන ඇති වෙච්ච පැහැදීමෙන්. මුලින් මං පාසැල් ගුරුවරයෙක්. ඒ කාලෙදී මගේ යාළුවෙකුගේ මාර්ගයෙන් අභිධර්ම මාර්ගය කියන පොත මට ලැබුණා. මං ඒ පොත සම්පූර්ණයෙන් කියෙව්වා. ඒ පොත කියවීමෙන් මගේ හිතේ ලොකු පැහැදීමක් ඇති වුණා. එතන්දි මට හිතුණා මේ පොත් ටික ඔක්කෝම ගෙන්ව ගෙන කියවන්ට ඕනෑ කියලා. එහෙම හිතලා මේ බූරුම පන්සලෙන් ම ඔක්කෝම පොත් ටික ගෙන්ව ගෙන කියෙව්වා. අවසානයට මං කියෙව්වේ ශාසනාවතරණය කියන පොත. පැවිද්දේ තිබෙන වටිනාකම ඒ පොතේ හොඳට විස්තර කරලා තිබුණා. මට හිතුණා ගිහි ගේ අත් හැර දාලා පැවිදි වෙන්න. ශාසනාවතරණය දෙවන වතාවට කියවන කොට මට කොහෙත්ම ගිහි ගෙයි ඉඳීම එපා වුණා. කොහොම හරි පැවිදි වෙන්නම හිතුණා. පොත් දෙක තුනක් ඇරෙන්න අනෙක් පොත් ඔක්කෝම කියෙව්වේ ගිහි ජීවිතයේ ඉඳිද්දි. පාසැලේ ඉගැන්වීමේ කටයුතු කරන ගමන්මයි මං ඔය පොත් කියෙව්වේ. පොත් කියවීමෙන් පසුව මං බොහෝ විට කළේ ඒ පොත් වල තියෙන කාරණා ගැන නිතර නිතර කල්පනා කිරීමයි. ඔය අතර මගේ හිතට එනවා මගේ අම්මා ගැන, කොහොම ද මං බලන්නේ කියලා. අම්මව අත් හැර දාලා ගෙදරින් පිටත් වෙලා ගිහිල්ලා පැවිදිවීම නම් හරිම දුෂ්කරයි. නමුත් කෙහොම හරි මේක කර ගන්න ඕන නිසා මං ඉගැන්නුව ඉස්කෝලේ (යල්කුඹුර මහ විද්‍යාලය) ළඟ

ටැම්ගොඩ රජමහා විහාරස්ථානය තියෙනවා. එතනවත් පැවිදි වෙන්නට ඕනෑ කියලා කල්පනා කළා. මේ විහාරස්ථානය තියෙන්නේ ඉගැන් වූ ඉස්කෝලේ කිට්ටුවමයි. ඔය රජමහා විහාරස්ථානයේ අපි දහම් පාසැලක් ආම්භ කළා. ඒ දහම් පාසැලේ ඉගැන්නුවේ අපේ පාසැලේ ගුරු මණ්ඩලයේ අය. මාත් ඉතින් ඉතා ඕනෑ කමින් දහම් පාසැලේ ඉගැන්නුවා. ඒ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ (ලුණුගල සුනන්ද කියන හාමුදුරුවෝ) උන්වහන්සේ අප සමග මිත්‍ර වුණා. ඒ වගේම අප ගැන පැහැදුණා. මොකද මේ ධර්ම කාරණා හොඳට ළමයින්ට කියා දෙන නිසා. මා කලින් සිතාගෙන සිටියේ ආරණ්‍ය සේනාසනයට ගිහින් මහණ වෙන්න ඕන කියලා. නමුත් ඒ වෙලාවේ මට හිතුණා මේ පන්සලේ හරි දැන් මහණ වෙන්නම ඕනෑ කියලා. දවසක් මං ඒ ලොකු හාමුදුරුවන් ගෙන් මහණ වීමට කරුණු විමසුවා. එතන්දි උන් වහන්සේ මෙහි ඇති දුෂ්කර බව මට පැහැදිලි කරලා දුන්නා. මං රේරුකානේ මහානායක හාමුදුරුවන් ගේ පොත් පත් කියවලා හුඟක් ඒ ගැන පැහැදිලයි ඉන්නේ, ඒ නිසා මාව කොහොම නමුත් පැවිදි කරන්න කියලා, ඉල්ලීමකුත් කළා. උන්වහන්සේ කිවා ඒ පිළිබඳව කේන්දරෙත් ටිකක් බලන්න ඕනෑ, මව්පියන්ගේ අවසරය ගන්නත් ඕනෑ, තව ඉතින් සිරිත් විරිත් රාශියකුත් තියෙනවා කියලා. ඒ වෙන කොට මගේ වයස අවුරුදු 26 යි. කොහොම වුණත් බොහෝම අමාරුවෙන් තමයි පැවිදි වීමට අම්මගෙන් අවසර ලබා ගත්තේ. අපේ පවුලේ ඔක්කොම හය දෙනයි. පවුලේ බාලයා මං. පිරිමියෙකුට හිටියෙත් මං විතරයි. අනෙක් අය ඔක්කෝම ගැහැණු. ඒ නිසාත් පැවිදි වීමට අවසර ලබා ගැනීම හරිම දුෂ්කර වුණා.


කොහොම වුණත් මං 1977 ජුනි 23 වැනි දා පැවිදි බව ලබා ගත්තා. පැවිදි වෙලත් මං අවුරුදු තුනක් විතර දිගටම ඉස්කෝලේ වැඩ කළා. පන්සලේ ලොකු හාමුදුරුවෝ මගේ සියලුම කටයුතු වලට හැම ආකාරයකින්ම සහාය දුන්නා. මොනම දේකින් වත් මට කරදරයක් හිරිහැරයක් කළේ නැහැ. රේරුකානේ මහා නායක හාමුදුරුවන් ගේ පොත් පත්වල තියෙන හැටියට ගෝලයකු විසින් ගුරුවරයෙකුට කළ යුතු සියලු සැලකිලි උන්වහන්සේට මං කළා. ඔහොම ඉන්න කොටත් මං මට ධර්මය කියා දීපු ගුරුවරයා රේරුකානේ නායක හාමුදුරුවෝ සිහිපත් කරලා වැඳලා තමයි පන්සලේ ලොකු හාමුදුරුවන්ට වඳින්න යන්නෙ. ඒ කාරණය මං

මුලින්ම ලොකු හාමුදුරුවන්ටත් කීවා. ඔය අතර මගේ හිතට ආවා, මේ ධර්මය මට කියා දුන් ගුරුවරයාට ටික කාලයක් හරි ඇප උපස්ථාන කරන්න ඕනෑ කියලා. කෙළෙහි ගුණ සැලකීමක් වශයෙන් ඒක කරන්නට ඕනෑ කියන එකයි මගේ අදහස වුණේ. ඉගැන්වීමෙන් ලැබෙන වැටුප අම්මට දීමයි කළේ. ඒ නිසා මට දැන් තියෙන ලොකුම ප්‍රශ්නය අම්මට සලකන එක. අන්තිමට මං තීරණය කළා මටත් පුළුවන් හැම ආකාරයකින්ම අම්මව රැක බලා ගන්නව කියලා. තවත් දූවරුන් පස් දෙනෙක්ම ඉන්නවනේ. පන්සලේ ලොකු හාමුදුරුවන්ටත් මගේ උපස්ථාන සැලකිලි ඔය වෙන කොට ඉතාම අවශ්‍යව තිබුණා. ලොකු හාමුදුරුවන්ටත් තව ගෝලයන් ඉන්නවා. ඒ අය ලොකු හාමුදුරුවන් බලා ගනීවි. ඒ නිසා මං යන්න ඕනෑ කියන අදහස මට ඇති වුණා. එහෙම හිතලා සියලු දෙනාම අඩා වැළපෙද්දී මං මේ පොකුණු විටට එන්න පිටත් වුණා. ඒ වෙලාවේ ලොකු හාමුදුරුවන්ගේ දෑසිනුත් කඳුලු වැටුණා.

මං මීට කලින් රේරුකානේ මහා නායක හාමුදුරුවන්ව දැකලා තිබුණේ නැහැ. හමු වෙන්න, බලන්න ඕනෑ කියන අදහසත් මුල දී ඇති වුණෙත් නැහැ. හදිසියේම තමයි මට මේ අදහස ඇති වුනේ. මහා නායක හාමුදුරුවන් ගැන හෝ මේ ස්ථානය ගැන මොකවත් මං දැන සිටියෙත් නැහැ. පොත් පත් ටික ගෙන්න ගත්තේ ඒවායේ තිබුණු ලිපිනයට ලියලා. මෙහාට එන්න සූදානම් වෙන කොට ඔක්කෝම කියන්න පටන් ගත්තා හාමුදුරුවන් යන ඔය ගමනේ තේරුම මොකක්ද ? කියලා. ඕක මහා පිස්සු ගමනක් නේද කියලා ඇහුවා. කවදාවත් දැකලවත් කථා කරලවත් නැති කෙනෙක් ළඟට, මොකවත් නොදන්නා ස්ථානයකට මේ යන ගමන ගැන කවුරුවත් කිසිසේත් කැමතිවුනේ නැහැ. මගේ හිතවත්ම අය කීවේ එහෙනම් හාමුදුරුවනේ අපි කලින් ගිහිල්ලා බලල එමුද කියලා. මං ඒ අයට දුන්න උත්තරය තමයි මේ ගමන යන්න තියෙන්නේ මෙහෙමයි කියලා. "ඔබලා කියන කරුණු මටත් හොඳට වැටහෙනවා. ඒ වුණත් මේ ගමන යන්න තියෙන්නේ මේ විදිහටමයි කියලා මං නැවතත් කිව්වා. මෙහාට ඇවිත් බැලුවාමයි මට වැටහුනේ මේ ගමන මෙහෙමම ආව එක හොඳයි කියලා. ඒ මොකද නායක හාමුදුරුවන්ගෙන් අහලා එව්වොත් ඒකෙම අනිත් පැත්තේ ලියල එවයි එපා කියලා. 1980 අගෝස්තු මස 27 දා තමයි මං මෙහාට ආවේ. කිසිම දැන ඇඳුණුම් කමක් ඇතිව නෙමෙයි මං ආවේ. ඒ කාලේ එහෙ හිටියා වීදියගොඩ වෙද මහත්තයෙක්,

ජිනදාස කියලා. මං මෙහාට එන්න පාර අසා ගත්තෙ එයාගෙන්. එදා ඒ එන කොට මහදි මට හම්බ වුණා මේ පන්සලේ දායක මහත්මයෙක්. එයා පන්සලේ වැඩ ඉන්න හාමුදුරුවරුන් ගේ ශාරීරික ස්වරූපය මට පැහැදිලි කරලා දුන්නා. "රේරුකානේ මහානායක හාමුදුරුවන් කෙට්ටුයි. උසයි. හිටගෙන ඉන්නව නම් හැරමිටියක් අතින් අරගෙන ඇති. කෝවිද ලොකු හාමුදුරුවන් ගැනත් කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවන් ගැනත් හැඩ හුරුකම කියා දුන්නා. මං මෙහාට එන කොට මට මුලින්ම මුණ ගැහුනේ කල්‍යාණධම්ම හාමුදුරුවන්. ඔය වෙලාව රාත්‍රි අටට විතර ඇති. උන් වහන්සේට මං කීවා හාමුදුරුවනේ මං ආවේ රේරුකානේ මහා නායක හාමුදුරුවන් මුණ ගැහෙන්න කියලා. උන්වහන්සේ මුණ ගැහෙන්න පුළුවන්ද කියලත් ඇහුවා. මුණ ගැහෙන්න පුළුවන්, හැබැයි හයියෙන් කථාකරන්න ඕනෑ කියලා කල්‍යාණධම්ම හාමුදුරුවන් කිව්වා. ඈ . . : ඈ . . . කියනකම් ඉන්න එපා. හයියෙන් කථා කරන්න කිව්වා. එදා ඒ කියපු ටික මට අද වගේම මතකයි. මං මෙහාට එනකොට ගෙනාවේ මෙහෙන් ම ගෙන්වා ගත්ත පොත් ටිකයි, තුන් සිවුරයි, කුඩය යි විතරයි. පොත් පෙට්ටිය කල්‍යාණ ධම්ම හාමුදුරුවන් ගේ කුටියේ තියලා මං ගියා රේරුකානේ මහා නායක හාමුදුරුවන් වැඩ ඉන්න කුටියට. යන කොට මහානායක හාමුදුරුවන් දවාලට නිදා ගන්න පුංචි ඇඳේ ඒ රාත්‍රියෙත් නිදා ගෙන හිටියා. දැන් ඔය වෙන කොට වෙලාව 8.20 යි. ඒක අද වගේම මතකයි. මහා නායක හාමුදුරුවන් ළඟට ගිහින් වැඳලා නායක හාමුදුරුවනේ කියල කථා කළා. එතකොට ඇහුවා කවුද කියලා. මං බොහෝම ඈතක ඉඳල ආව කෙනෙක්. නායක හාමුදුරුවෝ බලන්නයි ආවේ කියලත් කිව්වා. ටික වෙලාවක් පොඩි විස්තර ටිකකුත් කථා කළා. ඔය වෙලාවේ නායක හාමුදුරුවන් කීවා දැන්නම් මට බොහොම අමාරුයි කියලා. මං උන්වහන්සේගේ අතින් අල්ලගෙන ඉස්තෝප්පුවට එක්කර ගෙන ආවා. මීට ඉස්සර වෙලා කවදාවත් දැකලා ඇඳිනීමක් නැති වුණාට මං ඒ දේ කළා. මට ධර්මය කියා දුන්න නායක හාමුදුරුවෝ නේද මේ කියලා මගේ හිතට හරිම සතුටක් ඇති වුණා. ඒක කියන්න බැරි තරම් සතුටක්. නායක හාමුදුරුවන් ඉස්සරහ ඉස්තෝප්පුවටත් වැඩලා පුටුවේ වැඩ හිටියා. ඊළඟට සීනුව නාද කළා. එතකොට එහා ගෙයි හිටිය සුධම්ම හාමුදුරුවන් මෙතනට ආවා. "මේ බොහෝම ඈතින් නමක් ඇවිදින් ඉන්නව. ගිලන්පස එකක් හදලා ගේන්න කියලා නායක හාමුදුරුවෝ කිව්වා". ගිලන් පස එකක් වළඳලා මං කල්‍යාණධම්ම ලොකු

හාමුදුරුවන් වැඩ ඉන්න කුටියට ගිහිල්ලා රාත්‍රී එකොළහ විතර වෙනකම් උන්වහන්සේ සමඟත් කථා කර කර හිටියා. ඒ වෙලාවේ උන්වහන්සේ කිව්වා මෙහාට ඔය වගේ ඇත්තන් එනවා. ඇවිදින් නතර වෙලා ඉඳගෙන වැරදි විදිහට කටයුතු කිරීම නිසා ඉක්මණින් ඒ ඇත්තන්ට ආපසු යන්න වුණා කියලා. මං ඒ කියන ඒවා ඔක්කෝම හොඳට අහගෙන හිටියා. උන්වහන්සේ කියන දේවල් ගැන ඒවායේ ස්වභාවය ගැන මගේ අනුමැතියත් ප්‍රකාශ කළා. ඊළඟට මං නිදා ගන්න ගියා.



**අග්‍ර උපස්ථායක කිරි ඔරුවේ ධම්මානන්ද භික්ෂු නම මහානායක මා හිමියන් සමඟ**

මං මෙහාට ආවේ මහා නායක හාමුදුරුවන්ට තුන්මාසයක් විතරවත් උපස්ථාන කරන්න හිතාගෙනයි. ඒ වුණත් මෙතන තියෙන තත්වය ගැන මට මොකවත් දැනුමක් තිබුනේ නැහැ. මං හිතාගෙන ආවේ මට මෙතන ඉන්න ඉඩකඩ නොතිබුණොත් ධර්ම ශාලාවේ ඉඳගෙන හරි මහා නායක හාමුදුරුවන් වහන්සේට ටික කාලයක් උපස්ථාන කරලා. මට සුදුසු විවේකස්ථානයකට යනවා කියලා. එදා රාත්‍රියේ මදුරුවන් ගෙන් හරිම කරදරයක් තමයි තිබුණේ. ඇත්ත

වශයෙන් ඒක දරා ගන්න බැරි තරම් පීඩාවක්. එළි වෙනකම්ම පොඩ්ඩක්වත් නින්ද ගියේ නැහැ. කරන්න දෙයකුත් නැහැ. මොකක් ද කරන්නේ කියලා මට හිතා ගන්නත් බැහැ. ඒ වුණත් මගේ හිත තරක් කර ගත්තේ නැහැ. උදේ 4.00 ට විතර නැගිටලා චෛත්‍යය ළඟට ගොහින් වැඳලා පිරිත් කියලා මං හිතා ගත්තා මොන ප්‍රශ්න උදා වුණත් ආපසු නැවත හිටපු තැනට යන්නේ නෑ කියලා. ඇත්ත වශයෙන් හිටපු තැනින් පිටත් වෙලා ආවෙත් නැවත නවතින්න නම් එතනට යන්නේ නෑ කියන අදහසින්. ඒකට හේතුව සියල්ලෝම එපා කියද්දී සියල්ල අතහැරලා ඇවිත් නැවතත් ගියාම මදිකමක් බව මට හිතෙනවා. ඉඩකඩක් ලැබුණාහම ගිහින් එන්න යනවා කියන අදහස විතරයි මා ළඟ තිබුණේ. පසුවදාට මේ පන්සලේ වැඩ ඉන්න කෝවිද ලොකු හාමුදුරුවන් ගේ උපන් දිනය යෙදිලා තිබුණා. එදා උදේට දාන පින්කමකුත් තිබුණා. ඒ දාන පින්කමේ දී පිරිකර වශයෙන් බැටරි කෑලි දෙකකුත් සහිතව පිරිකරකුත් මට ලැබුණා. මං ඒ ගැන වඩාත් සතුටු වුණා. මුල්ම දවසේ ආලෝක පූජාවකුත් මට ලැබුණා කියලා. එදා උදේ නායක හාමුදුරුවෝ මාත් සමඟ කතා කළා. "උන් වහන්සේ මගෙන් ඇහුවා මොකද ඔයා මෙහාට ආවේ කියලා. මං කිව්වා නායක හාමුදුරුවන්ගේ පොත් කියවලා එයින් ඇති වෙච්ච පැහැදීම නිසාය මං ආවේ කියලා. "මං පාසැල් ගුරුවරයෙක් බවත්, පැවිදි කළ ගුරු හාමුදුරුවන් ගෙන් සහ ඉගැන් වූ විදුහලේ විදුහල්පතිතුමාගෙන් සහතික ගෙනා බවත් කියලා ඒවා නායක හාමුදුරුවන්ට දුන්නා. ඒ වෙලාවේ නායක හාමුදුරුවෝ හොඳයි ඉතින් ඕවා බලමුකෝ කියලා, ලොකු හාමුදුරුවන්ගේ ඇඩ්‍රස් එක විතරක් ඉල්ල ගත්තා. ඉල්ලගෙන පසුව දාම ලිපියක් ලියලා තැපැල් කළා. දවස් කීපයක් යනකොට ඒ ලොකු හාමුදුරුවෝ නායක හාමුදුරුවන්ට ලිපියක් එවලා තිබුණා. "එයා මගේ ගෝල නමක්. එයාගේ කැමැත්තෙන්මයි මෙහෙන් පිටත් වෙලා ආවේ. කරුණාකරලා ඒ නම ඉක්මණින් මෙහාට එවන්න කියලා." ඊළඟට නායක හාමුදුරුවෝ ලිපියක් යැව්වා. "මගේ නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. කරුණාකර ඉක්මණින් ගෙන්න ගන්න කියලා. ඔය ටික මට අද වගේ මතකයි. අර ලොකු හාමුදුරුවොයි නායක හාමුදුරුවොයි අතර ඔය විදිහට ලිපි ගණුදෙනු වුණා. ඒ ලියුම් ඔක්කෝම මට පෙන්නුවා. ඒ ලොකු හාමුදුරුවෝ ලියා එවා තිබුණා මට මතකයි "ඔය ගෝලයා මට හරිම හිතවත් කෙනෙක්. ඒ ගැන මතක් වෙන විට මගේ ඇස් දෙකෙන් කඳුළු වැටෙනවා කියලා. ඔය අතර නායක හාමුදුරුවන් ඉඳහිට මගෙන් ප්‍රශ්නත් අහනවා. නායක

හාමුදුරුවන්ගේ පොත් කියවලා තියෙන බව මා කී නිසා ඒවායිනුත් ප්‍රශ්න මගෙන් අහනවා. දවසක් ඇහුවා ශෝකය කියන්නේ මොකක්ද කියලා. ඒ වෙලාවේ මට තේරෙන හැටියට පොත්වල තියෙන හැටියට මං උත්තර දුන්නා. පොත් හොඳට කියවලා වගෙයි තියෙන්නේ කියලා නායක හාමුදුරුවන් සෑහීමකට පත් වුණා. මං ඉතින් ආවදාට පහුවදා ඉඳලම නායක හාමුදුරුවන්ට කළ යුතු උපස්ථාන කරන්න පටන් ගත්තා. තවත් පොඩි හාමුදුරුනමක් හිටියා. නමුත් මට පුළුවන් හැම දෙයක් ම මා කළා. දැන් මං ඇවිත් අවුරුදු පහළොවක් විතර වෙනවා. ඔය කාලය තුළ නායක හාමුදුරුවන් ගේ හිස බෑම වුණත් දෙවතාවකට වඩා වෙන කාටවත් පැවරුවෙ නැහැ. සියල්ලම මං කළා.

**ඔය තම මෙහාට ඇවිදින් මෙහෙම කටයුතු කරන්න පටන් ගත්තාම මෙහේ සිටින ඇත්තන්ගෙන් මොකක් හරි අවහිරයක් බාධාවක් ආවේ නැද්ද ?**

අනේ නෑ ! කාගෙන්වත් අවහිරයක් උනේ නැහැ. විශේෂයෙන් බාධාවක් වෙනව නම් වෙන්න තියෙන්නේ කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවන්ගෙන්. නමුත් උන් වහන්සේ එහෙම කෙනෙක් නෙමෙයිනේ. මුල්ම දවසේ මාත් සමඟ කථා කළේ යම්සේ ද, අදත් ඒ වගේමයි කල්‍යාණ ධම්ම හාමුදුරුවෝ. එදා වගේම අදත් හිතවත්කම එක වගේම තියෙනවා. ඒ වගේම නායක හාමුදුරුවන් පළමුවෙන් ම දුටු දවසේ යම් සතුටක් මගේ සිතේ ඇති වුණා ද අදත් ඒ සතුට එසේම තියෙනවා. කවදාවත් මට උන්වහන්සේ අප්‍රිය වුණේ නැහැ. ඒක ඉතාම විශේෂ දෙයක්. කොටින්ම කියනවා නම් අපට එහෙම කළකිරෙන්න තරමට උන්වහන්සේගේ සුළු හෝ අගුණක් මා දුටුවේ නැහැ. ඉතින් ඔය තත්ත්වය තමයි මූලාරම්භය. ඔහොම ඉඳලා දවසක් මං කීවා නායක හාමුදුරුවනේ මට මේ නිකායටම එන්න ඕනෑ කියලා. එකදාස්නමසිය අසූවේ දහවෙනි මාසේ පස්වෙනි දා මේ ස්ථානයට භික්ෂූන් වහන්සේලා රැස් වුණාම දළ්හී කර්මයක් කරලා මාව මේ නිකායට නායක හාමුදුරුවන් ගේ ගෝලයෙක් වශයෙන් ඇතුළත් කර ගත්තා. ඉතින් මේ වසර පහළොව මුළුල්ලේ මගේ ශක්ති ප්‍රමාණයෙන් නායක හාමුදුරුවන්ට ඇප උපස්ථාන කළා.

**වසර පහළොවක් පමණ කාලයක් නායක හාමුදුරුවන්ට උපස්ථාන කිරීම පිළිබඳව කෙටියෙන් යමක් සඳහන් කරන්න පුළුවන්ද ?**

මං මෙහාට ආව දෙවැනි දවසේ ඉඳලා නායක හාමුදුරුවන්ට උපස්ථාන කරන්න පටන් ගත්තා කියලා කලිනුත් කිව්වා. කාගෙන්වත් විමසීමක් නොකර මට කරන්න පුළුවන් වැඩ කොටස කළා. අතු පතු ගෑම, නායක හාමුදුරුවන් පිරිසිදු කිරීම ආදී කටයුතු වල මං යෙදුණා. ඒ වෙන කොට තවත් පුංචි හාමුදුරු නමක් මෙහි සිටියා. මට ඒ පොඩි හාමුදුරුවන්ගෙනුත් කරදරයක් වුණේ නැහැ. එයා ඉගෙන ගන්න පිරිවෙන් යනවා. මං ඒ පොඩි හාමුදුරුවන්ට කීවා ඔයා කරන කටයුතු ටික ඔයා කරන්න. මෙන්න මේ කටයුතු ටික මං කරන්නම් කියලා. මෙතන්දි මං හුහාක් ප්‍රවේශම් වුණා. මේ වන විට උපසම්පදාවෙන් එක වසක් සම්පූර්ණ වෙනවා. නායක හාමුදුරුවෝ හරිම ප්‍රතිපත්ති ගරුකයි. අනුපසම්පන්නයකු විසින් කළයුතු දේවල් මං කරනවාට උන්වහන්සේ කොහෙත්ම කැමති වුණේ නැහැ. පිළිගැන්වීම් වගේ දේවල් අනුපසම්පන්නයකු විසින් ම කළයුතු වෙනවනේ. උපසම්පදා ශීලය කියන පොත මං හොඳට කියවා තිබුණු නිසා හුහාක් ප්‍රවේශම් වුණා, උන්වහන්සේගේ ප්‍රතිපත්තිවලට හානියක් නොවන සේ ක්‍රියා කරන්නට. දවසක් නායක හාමුදුරුවන් මට කීවා ඔයා මේ වැඩ කරනවාට මගේ නම් කැමැත්තක් නැහැ කියලා. මං ඒ කියපු දේ තේරුම් ගත්තා. කවුරු හෝ යමක් කියන කොට ඒ වචන විලාශය අනුව කියන දේ තේරුම් ගන්නට මං හැම විටම උත්සාහ ගන්නවා. උන්වහන්සේ ඒ වචන කීවාට උන් වහන්සේගේ අදහස ඒක නොවන බව මා දන්නවා. උන්වහන්සේ කැමති නැහැ මං වගේ කෙනෙකුගෙන් උපස්ථාන ලබා ගන්නට. මොකද උන්වහන්සෙත් මට තියෙන සැලකිල්ල සහ ගෞරවය නිසා. පඩික්කම් සේදීම වගේ දේවල් මං කරන එක ගැන උන්වහන්සේ කැමති වුණේම නැහැ.

**වසර පහළොවකට කලින් නායක හාමුදුරුවන් මේ තරම් දුර්වල නැහැනේ. ඒ කාලයේ කොහොමද මහා නායක හාමුදුරුවන්ට උපස්ථාන කළේ ? ඒ ගැනත් ටිකක් කියන්න.**

ඒ දවස්වල නායක හාමුදුරුවන්ගේ වයස අවුරුදු 83 ක් විතර ඇති. ඒ දවස්වල වුණත් තමන්ගේ වැඩ තමන්ම කර ගැනීමට තමයි උන්වහන්සේ උපරිම වශයෙන් උත්සාහ ගත්තේ. උන්වහන්සේගේ

කැමැත්ත වුණෙත් ඒකයි. තමන්ට බැරි දෙයක් විතරක් කාට හරි කියලා කරව ගන්නවා. දැන් වුණත් ඇස් දෙක සම්පූර්ණයෙන්ම නොපෙනෙන මේ අවස්ථාවෙත් තමන්ගේ වැඩ තමන්ම කර ගන්නට ගන්නා උත්සාහය මට නිතර දකින්නට ලැබෙනවා. මං මෙහාට එන විට නායක හාමුදුරුවන් නාන්නේ උණු වතුර. මං කොහොම නමුත් නියමිත වෙලාවට උණු වතුර ටිකක් සකස් කරලා දෙනවා. සමහර අවස්ථාවල වැසිකිළි කැසිකිලි යාමට පවා අපහසු වුණා. නමුත් කාටවත් නොකියාම වඩිනවා. වතුර ටික පවා රැගෙන වඩිනවා. මගේ සිරිතක් තියෙනවා, මට මොන තරම් වැඩ තිබුණත් නායක හාමුදුරුවන් ගැන අවධානයෙන් සිටීම. දවසක් හොඳ වැඩක් වුණා. "නායක හාමුදුරුවන් වැසිකිළියට වඩිනවා දැකලා මං ඇහුවා මාත් එන්න ද කියලා. එපා ඔයා එන්න එපා කිව්වා. ටික වෙලාවක් යන කොට ධම්මානන්ද, ධම්මානන්ද කියලා හයියෙන් කථා කළා. මං ඉක්මනට ගියා. වැසිකිළියේ අල්ලා ගන්න තිබුණ ලණුව කැඩිලා. නායක හාමුදුරුවන් ගේ කකුල් දෙක වැසිකිලි වලට වැටිලා අඹරිලා තිබුණා. ඒ වෙලාවේ මං කීවා නායක හාමුදුරුවෝ මට කිව්වනේ ඔයා නාවට කමක් නෑ කියලා. "දැන් කමක් තියෙනවා නේද" කියලා. සිනා වෙමින් ඇහුවා. නායක හාමුදුරුවන්ටත් හොඳටම සිනා ගියා. උන්වහන්සේට කරන්න පුළුවන් හැම වැඩක්ම කර ගන්නට පුළුවන් තාක් කල් උත්සාහ ගත්තා. ඒක උන්වහන්සේගේ ජීවිතයේ එක විශේෂ ලක්ෂණයක්. ඒ වගේම උන්වහන්සේගේ දින චරියාවත් මං හොඳින් තේරුම් අරගෙනයි හිටියේ. මං මෙහාට ඇවිත් මාස නමයක් විතර කාලයක් රාත්‍රිය ගත කළේ මේ කුටියේ නොවෙයි. එහා ගෙයි. උන් වහන්සේ උදේ දානේ වළඳලා ටික වෙලාවක් ඉඳලා පත්තර කාරිය බලනවා. උදේ 8.30 පමණ වෙන කොට අර දවල් නිදන ඇඳට ගිහින් වාඩි වෙලා භාවනාවක යෙදෙනවා. කීප වරක් එහාට මෙහාට සක්මන් කරලා ඇවිත් ටිකක් ලියනවා. ඉන්පසුව මං ඇවිත් අහනවා ගිලන්පසට අව්‍යශ්‍ය දෙයක් ගැන. 9.30 පමණ වන විටයි ගිලන්පස ටිකක් වළඳන්නේ. මං ආව දවස් වල උන්වහන්සේ පිට දාන වලටත් වඩිනවා. නැතිනම් දන් ශාලාවට වැඩලා වළඳලා එනවා. උන්වහන්සේ වළඳන්නේ ඉතාම ස්වල්පයයි. සමහරවිට මට පුදුම හිතුනා. මෙච්චර පොඩ්ඩක් වළඳලා කොහොමද ඉන්නේ කියලා. දොළහට කලින් දානේ වළඳලා ඇවිත් තේ එකක් නොවරදවාම වළඳනවා. මාත් කොහොම හරි ඒක හදලා කාට හරි කියලා පිළිගන්වනවා. ඒ දවස්වල වැඩිපුරම කාලය ගත කළේ භාවනානුයෝගීව ඉඳිමින්. ඔය අතර

කවුරු හෝ ආවොත් ඒ අය සමහන් බොහෝ සතුටින් කතා කරනවා ඔහොම ඉතින් මාස නමයක් විතර ගත වූ බව මතකයි.

මට හිතුනා මං දැන් මේ ආරම්භ කරලා තියෙන වැඩ පිළිවෙල දිගටම මට පවත්වා ගෙන යන්න බැහැ කියලා. මොකද නායක හාමුදුරුවන් ගේ පොත පත කිය වූ දවස්වල ඉඳලා මට උවමනා කරලා තිබුණේ බණ භාවනා කරලා ඒ පැත්ත දියුණු කර ගැනීමටයි. මෙහි දී වැඩි වැඩියෙන් ආගමික කටයුතු වලටත් යන්න සිදු වුණා. මං හිටිය ආවාස ගෙයි, පිරිසත් වැඩි වගෙයි කියල මට හිතුනා. ඒ වගේම මට විවේක මදි බවකුත් වැටහුණා. නායක හාමුදුරුවන්ටත් මා මුලින් කීවේ නැහැ. දිගටම මං මෙහේ ඉන්න ඕනෑ කියලා. මා මෙහි පැමිණි මුල් කාලයේ දවසක් උන්වහන්සේ කීවා "දැන් පිරිසත් මෙහෙ වැඩියි දාන මාන එහෙමත් ආමාරුයි, ඔයා සුදුසු විවේකස්ථානයක් සොයා ගෙන ගියොත් හොඳයි කියලා". මං කීවා ඒක හොඳයි නායක හාමුදුරුවනේ කියලා. ඒ සමහම මං කීවා දානෙ නම් මට ප්‍රශ්නයක් නැහැ. පිණ්ඩපාත ගිහිල්ලා හරි ඒක මට සොයා ගන්න පුළුවන් කියලා. දැනුත් ඕක මං කියන කොට නායක හාමුදුරුවෝ හිනාවෙනවා. දානේ නැහැ කියලා එදා මට යන්න කීව නේද කියලා. මාස නමයක් විතර ගත වෙන කොට මං හිතුවා නායක හාමුදුරුවන්ට කළගුණ සැලකීමක් වශයෙන් මේ කාලය තුළ උපස්ථාන කළා, දැන් ඉතින් විවේකස්ථානයකට යන්න ඕනෑ කියලා.

**ඇයි එහෙම අදහසක් ඇතිවුණේ ?**

කාගෙන්වත් මට මෙතන කරදයක් වුණේ නැහැ. වචනයකින් වත් මට එහෙම දෙයක් නම් වුණේ නැහැ. මගේ භාවනා පිළිබඳ දැනුම මදි, ඒක තව ටිකක් දියුණු කර ගත්තොත් හොඳයි කියලා හිතුණා. ඔය අතර මෙතන හිටිය පොඩි හාමුදුරුවොත් මෙහෙන් අස්වෙලා ගියා. දැන් ඉතින් නායක හාමුදුරුවන්ට උපස්ථාන කරන්න කෙනෙක් නැහැ. මේක බරපතල ප්‍රශ්නයක් වුණා. මට ඒ සියල්ල කළ හැකියි. නමුත් දිගටම උපස්ථානය සඳහා තබා ගෙන හිටියේ අනුපසම්පන්නයෙක්. උපසම්පදා භික්ෂුවක් වන මගෙන් මේ කටයුතු කරවා ගන්න නායක හාමුදුරුවන් කැමති වුණේ නැහැ. මෙතන දී මං ප්‍රවේශම් වුණා අනුපසම්පන්නයකු විසින් කළයුතු කටයුතු ඒ අයුරින්ම කරවා දෙන්නට. කොහොම නමුත් නායක හාමුදුරුවන්ගේ කුටියට මට

එන්නට සිදු වුණා. එදා සිට අද වෙනකම්ම රෑ දාවල් දෙකේම නායක හාමුදුරුවන් ළඟමයි මං ඉන්නේ. වසර පහළොවක් රෑ දවල් දෙකේම නායක හාමුදුරුවන් ළඟින්ම ඉන්න නිසා උන්වහන්සේගේ ජීවිතය පිළිබඳව සෑහෙන අවබෝධයක් මට තියෙනවා. අපේ කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවෝ තමයි දිගු කලක් ම නායක හාමුදුරුවන්ට උපස්ථාන කරලා තියෙන්නේ. ඒ වගේම නායක හාමුදුරුවන් ගැන හුඟක් දේවල් උන්වහන්සේ දන්නවා. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ නමකගේ ගුණ හොඳින් දේශනාකර තියෙනවා. ඒ ගුණ නායක හාමුදුරුවන් තුළ පිරී ඉතිරී තියෙන බව ප්‍රත්‍යක්ෂ වශයෙන් මා දන්නවා.

නායක හාමුදුරුවන්ගේ පොත පත කියවීම නිසා ඒවා පිළිබඳ තරමක දැනුමක් මට ලැබී තිබුණා. ඒ අනුව නායක හාමුදුරුවන් පිළිබඳ විශේෂ පරීක්ෂණයකුත් මං කළා. අභිධර්මයේ මූලික කරුණු අභිධර්ම මාර්ගය වැනි පොතක් කියවන විට මට වැටහුණා, නායක හාමුදුරුවන් හොඳ බුද්ධිමතෙක් කියලා. එකින් එක පොත් කියවා ගෙන යාමේදී මට පැහැදිලිව වැටහුණා උන්වහන්සේ මේ අනුන්ට බණ ලියනවා, කියනවා විතරක් නෙමෙයි තමන් ළඟත් ධර්මය තියාගෙන ඉන්න කෙනෙක් කියලා. විදර්ශනා භාවනාව, චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව වගේ පොත් කියනව විට මට වැටහුණා නායක හාමුදුරුවන්ගේ ධර්මඥානය දියුණු වී ඇති බව. භාවනාවත් දියුණු වී ඇති බව. කලින් උන් වහන්සේ ගේ පොතපත කියවීමෙන් මා ලබා ගෙන සිටිය නිගමන වඩා හොඳින් මට පැහැදිලි වුණා, මෙහාට පැමිණීමෙන් හා උන්වහන්සේ ළඟ නැවතී සිටීම නිසා. අවුරුදු පහළොහක් වගේ කාලයක් එක දිගට නායක හාමුරුවන්ට උපස්ථාන කිරීමෙන් කවදාවත් ඒ පිළිබඳ එපාවීමක් අප්‍රිය වීමක් ඇති වුණේම නැහැ. ඒ වගේම එක රාත්‍රියක් හරි මා නායක හාමුදුරුවන් ළඟින් ඈත් වෙන්නේ මගේ මෑණියන් බැලීමට යාම සඳහා පමණයි. මගේ මෑණියන්ගෙ වයස දැන් අවුරුදු අසූ පහක් විතර වෙනවා. කොහේ හිටියත් මං අම්ම බලන්න මාස තුන හතරකට සැරයක් නම් යනවා. මේ ගමන වුණත් මං ආවේ අම්මට ඒ පොරොන්දුව වෙලා. ඒක මං මේ දක්වා කැඩුවේ නැහැ. නායක හාමුදුරුවන් මේ තරම්ම දුර්වල නොවූ අවස්ථාවල දී මං ගමේ ගිහිල්ලා අම්මත් බලල, කලින් මගේ ලොකු හාමුදුරුවොත් දැකලා බලලා දින තුනක්වත් ගත කරලයි ආපසු එන්නේ. නමුත් දැන් ඒක එක දවසකට සීමා කරගෙන

තියෙනවා. නායක හාමුදුරුවන්ගේ අද පවත්නා දුර්වල තත්ත්වය නිසා මගේ අම්ම බලන්න ගොහින් ඒ දවසේම ආපසු එන විදිහට දැන් වැඩ පිළිවෙල සකස් කර ගෙන තියෙනවා. නායක හාමුදුරුවන් වැඩිපුරම කාලය දැන් යොදා ගන්නේ භාවනාව සඳහා. ඇස්දෙකම නොපෙනී ගිහිල්ලා දැන් අවුරුදු අටකට කිට්ටු වෙනවා.

නායක හාමුදුරුවන්ගේ ජීවිතයේ මා දුටු විශේෂ ලක්ෂණ කිහිපයක් දැන් කියන්නම්. උන්වහන්සේ කෙනෙකුගෙන් යමක් ඉල්ලීම අතිශයින්ම පිළිකුල් කරන කෙනෙක්. ඉල්ලනව නම් ඉල්ලන්නෙ කාටවත් වැඩක් නැති ඔය කැලෑ කොල වගේ දෙයක් තමයි. වෙන කිසිම දෙයක් උන්වහන්සේ කෙනෙකුගෙන් ඉල්ලලත් නැහැ. ඉල්ලන්නෙත් නැහැ. ඒවුණාට උන් වහන්සේ දීමට අතිශයින්ම ප්‍රිය කෙනෙක්.

තවත් විශේෂ ලක්ෂණයක් තමයි අසරණයන්ට පිහිට වීමේ උතුම් ගුණය. දැන් නම් ඇස් දෙකම නොපෙනෙන නිසා ඒ කටයුතු අමාරුයි. ඉස්සර අසරණ අයට පිහිට වීම, සැළකිලි දැක්වීම, ඉතාමත් ම ඉහළින් තිබුණා. තිරිසන් සතුන්ට පවා පුදුම විදිහට පිහිට වුණා. ඔය බල්ලෙක් බළලෙක් හරි පන්සලට ගෙනත් දාලා ඉන්නවා දැක්කාම උන්වහන්සේ හරි අමාරුවෙන් හැරමිටි ගහ ගහ ගිහිල්ලා ඒ සතුන්ගේ තොරතුරු බලලා කොහොම හරි කෑම ටිකක් සපයලා දෙනවා. ඒ සතුන්ගේ සැප දුක් සොයා බලනවා. අසරණයෙක්, දුගියෙක් ඇවිත් ඉන්නවා නම් ඔහු ළඟට ගිහින් ඔහුගේ අවශ්‍යතා සොයා බලලා සම්පූර්ණ කරනවා. සමහර අවස්ථාවල නායක හාමුදුරුවෝ හැරමිටි ගහ ගහ ඒ අය ළඟට ගිහින් ඒ අයගේ අවශ්‍යතාවය හැමිටියක් නම් තමන්ගේ හැරමිටිය ඒ අයට දීලා ලී කෑල්ලක් අරගෙන නායක හාමුදුරුවෝ ආපසු එනවා. නායක හාමුදුරුවෝ ළඟ සත්ව කරුණාව පුදුම විදිහට තියෙනවා.

උන්වහන්සේ තුළ පවතින තවත් වැදගත් ලක්ෂණයක් නම් හැම දෙනාම එක සේ පිළිගැනීම. උගත්, නූගත්, දුප්පත්, පෝසත්, කුලවත්, කුලහීන මොන තරාතිරමේ කෙනෙකු වුණත් නායක හාමුදුරුවන් පිළිගන්නේ එක සමානව. නායක හාමුදුරුවන් දකින්න බලන්න කවුරු ආවත් ඒ හැම දෙනාම එක සමාන තත්ත්වයකින් සමානාත්ම තාවයකින් යුතුවයි පිළිගන්නේ. කාටවත් කිසිම වෙනසක් නැහැ. ජනපති ආවත් අගමැති ආවත් මැති ඇමතිවරු ආවත් නායක

හාමුදුරුවන්ට නම් ඒ කවුරුත් එක සමානයි. ඒ ඒ පුද්ගලයාගේ තත්ත්වයට අනුව කථා බහ කරනවා විනා වෙන කිසිදු වෙනසක් පෙන්නුම් කරන්නෙ නැහැ.

බොහෝ විට නායක හාමුදුරුවන් කියන දෙයක් තමයි ධම්මානන්ද, මා රැස් කළ ලොකුම ධනය තමයි පිරිසිදු මහණකම කියලා. මගේ එකම ධනයත් එච්චරයි. මුල දී කොහොම වුණත් දැන් නම් උන්වහන්සේ මුදල් කියන ඒවා අඳුනන්නේවත් නැහැ. හොඳට ඇස් පේන කාලෙදි වුණත් උන්වහන්සේ මුදල් පරිහරණය කළේ නැහැ. ශීලය ගැන නායක හාමුදුරුවෝ දක්වන්නේ පුදුම සැළකිල්ලක්.

විකාලභෝජන ශික්ෂාපදය අකුරටම ආරක්ෂා කරගෙන ඉන්න කෙනෙක් නායක හාමුදුරුවෝ. ගිහි පැවිදි වෙනස ඉතාම පැහැදිළිව දක්නට ලැබෙන කාරණය වශයෙන් උන්වහන්සේ නිතර කියන්නේ මේ විකාලභෝජනය යි. දානෙ වළඳලා අවසන් වෙලා බීමට දෙයක් ඉල්ලන කොටත්, තැඹිලි වගේ දෙයක් දුන්නොත් ඒ එක්කම අහනවා දැන් වෙලාව කිය ද කියලා. දැන් වෙලාව දොළහ පහුවෙලා කීවොත් එහෙම නම් ඕනෑ නෑ කියනවා. ඒ වචනය කියනවා මිසක් ඊට වඩා කතා කරන්න යන්නේ නැහැ. අද වුණත් මොන තරම් බඩගින්න තිබුණත් දොළහෙන් පස්සේ පිටි කිරි ටිකක් හරි, තැඹිලි වතුර ටිකක් හරි කවදාවත් ම බොන්නේ නැහැ.

**දැන් නායක හාමුදුරුවන්ගේ ඇස් පේන්නේ නැහැ. ඒ නිසා නායක හාමුදුරුවන්ට දවල් දොළහ පහු වුණත් කෑමක් බීමක් දෙන්න පුළුවන් නේද?**

දෙන්න නම් පුළුවන්. නමුත් මං ඒක කවදාවත් කරන්නෙ නැහැ. එහෙම කළොත් මං ලොකු වැරදි කාරයෙක් වෙනවා. දවල් නිදාගෙන ඉඳලා ඇහැරුණාම නායක හාමුදුරුවන්ගේ කල්පනාව දැන් එළිවෙලා, උදේ කාලය කියලා. රෑ දවල් දෙක වෙන් වෙන්ව අඳුනන්නෙත් නැහැනේ. එ නිසා ඕනෑ දෙයක් දෙන්න පුළුවන්. නමුත් මං නම් ඒක කොහොමවත් කරන්නේ නැහැ. එහෙම කළොත් මං හිතනවා ඒක නායක හාමුදුරුවන්ට කරන මහා ද්‍රෝහිකමක් කියලා. ඇස් නො පෙනෙන නිසා උදේ, දවල්. රෑ කියලා වෙනසක් නැති නිසා යමක් ඉල්ලන්න පුළුවන්. ඒ වුණත් දොළහෙන් පස්සේ විකාල

භෝජනයට ඇතුළත් වන කෑමක්, බීමක් කිසිවක් මං දීලත් නැහැ. දෙන්නෙත් නැහැ.

**ඔය තම මෙහාට එන කොට නායක හාමුදුරුවන්ට හොඳට ඇස් පේනවා. කන් ඇහෙනවා යන්න එන්න පුළුවන්. පොතුත් ලියනවා. නමුත් දැන් අවුරුදු අටක විතර ඉඳලා ඒ එකක්වත් බෑ. එදා ඇස් පේන කන් ඇහෙන කාලෙයි. අදයි අතර නායක හාමුදුරුවන්ගේ ප්‍රතිපත්තිවල යම්කිසි වෙනසක් ඔයා දුටුවද ?**

ඇත්තෙන් ම නැහැ. අපට විනාඩියක් උන් වහන්සේට පැයක් වගේ දැනෙනවා ඇති. නමුත් එදා වගේම අදත් ප්‍රතිපත්තිවල නම් වෙනසක් නැහැ. කථා බහේ වෙනසක් නැහැ. මේ තත්ත්වය නම් මහා පුදුමයි. **මේ පංචස්කන්ධයෙන් මේ සංසාර දුකින් මේ ජීවිතයේ දීම මිදෙන්න ඕනෑ කියන අදහසින් උන්වහන්සේ මේ මොහොතෙත් ක්‍රියාත්මක වෙනවා.** සමහරවිට මහා රාත්‍රියේ පවා උන්වහන්සේ තමන් වහන්සේට අවබෝධ වෙච්ච ධර්මය ගැන කථා කරලා මට කියනවා. සාමාන්‍යයෙන් උන් වහන්ස්ට නින්ද යාම අඩුයි. නමුත් නායක හාමුදුරුවෝ කියනවා "මට නින්ද නො ගියාට මං මේ ඉන්නේ කාම විතර්ක වලින් නෙමෙයි. මේ ඉන්නේ ධර්ම සංඥාවකින් කියලා. දවසක් රාත්‍රියේ මට කතා කරලා නායක හාමුදුරුවෝ කීවා ධම්මානන්ද, අද රාත්‍රියේ දුඃඛ සත්‍යය පිළිබඳ වැටහුණු කාරණා පොතක් වශයෙන් ලිව්වොත් පිටු පන්දාහක් විතර වෙයි. එහෙම ලිව්වොත් මං කලින් ලියා තිබෙන චතුරාර්ය සත්‍ය කියන පොත මොකක් ද කියලා ඔය ඇත්තන්ට හිතෙන්න පුළුවන්." මේ තත්ත්වයෙන් ඉඳගෙනත් මේ ධර්මය ගැඹුරින් සිහිපත් කරන එකයි උන්වහන්සේ කරන්නේ. වතුර ටිකක් ඉල්ලනවා. ඒ එක්කම පඩික්කමක් ඉල්ලනවා. ඒ එක්කම තුවායක් ඉල්ලනවා. ඇස් නොපෙනීම නිසා අපි කරන වැඩ නො පෙනෙන නිසයි මේ ඉක්මනට එහෙම ඉල්ලන්නෙ වයසට යාමත් සමඟ මතකය නම් අඩු වන බවක් පේනවා. නමුත් ගුණ ධර්මවල ප්‍රතිපත්තිවල නම් කිසිම වෙනසක් මේ දක්වාම දකින්නට නැහැ.

**නායක හාමුදුරුවන්ට තියෙනවා ලැබීමේ මහා වාසනාවක්. අවශ්‍ය දෙය ලැබීමේ පිනක් තියෙනවා.** සමහර කාරණා මට කියන්න තරමට මතක නෑ. දවසක් නායක හාමුදුරුවන්ගේ දකුණු අතේ ඇඟිල්ලක් දවල් 10.30 ට පමණ පිහියට කැපුනා. බෙහෙත් දාලා ඇඟිල්ල බැඳ

ගත්තා. දැන් ඉතින් නායක හාමුදුරුවන් කල්පනා කරනවා. මේ ඇහිල්ලත් බැඳගෙන දානේ වළඳන්නේ කොහොමද කියලා. අද බත් නොවළඳා පාන් කෑල්ලක් වැළඳුවොත් හොඳයි කියලා හිතා ගෙන තියෙනවා. ටික වෙලාවක් යන විට කවදාවත් නොදුටු නොහඳුනන මනුස්සයෙක් ඇවිදින් නායක හාමුදුරුවන්ට පාන් ගෙඩියක් පිළිගන්නලා ගියාලු. ඒක පුදුම සහගත දෙයක්. දවසක් නායක හාමුදුරුවෝ කල්පනා කළා අද මට අමු ගස්ලබු ටිකක් තම්බා ගෙන වැළඳුවොත් හොඳයි කියලා. ඒක මට කථා කරලා කීවා. මං වට පිට බැලුවා. අමු ගස්ලබු තියෙනවද කියලා. නමුත් ඒ දිනවල පන්සලේ ගස්වල ගස්ලබු තිබුණේ නෑ. ඔන්න ටිකක් වෙලා යන කොට දසසිල් මෑණි කෙනෙක් අමු ගස්ලබු ගෙඩි තුනක්ම අරගෙන එනවා. ගෙනත් නායක හාමුදුරුවන්ට පිළිගැන්නුවා. ඉදෙන්න ලකුණුක්වත් නැති අමු ගස්ලබු ගෙඩි තුනක් ඒ අය ගෙනාවේ. පුදුමයි ඒ සිද්ධිය. ඔය වගේ ම දවසක් කවුරු හෝ වෙද මහත්මයෙක් කියලා, මට අද කංකුං ව්‍යඤ්ජනයක් වැළඳුවොත් හොඳයි කියලා., හිතන් ඉන්න කොට එදා දානෙට හොඳට කංකුං ව්‍යඤ්ජනයක් ලැබුණා.

නායක හාමුදුරුවන්ට අවුරුදු අනූව සම්පූර්ණ වන දවසේ උන්වහන්සේත් සමඟ කථා බහ කරලා තීරණයක් කර ගත්තා තිස් නමකට දානයක් දෙන්න. දානෙට පිරිකර වශයෙන් සිවුරු පූජා කරන්නත් තීරණය කර ගත්තා. ඔය වෙන කොට නායක හාමුදුරුවන්ට හම්බ වෙච්ච සිවුරු කීපයකුත් තිබුණා. ඔය දවස්වල නායක හාමුදුරුවන් බලන්න විශේෂ කවුරු හරි එනව නම් ගෙනාවේ සිවුරු. ඔය දිනවල **බෞද්ධ කොමසාරිස් අබය වීරකෝන් මහත්තයා** ආවා නායක හාමුදුරුවන් බලන්න. මීට කලින් කවදාවත් ඇවිත් තිබුනේ නැහැ. ඒ වෙන කොට අපි තීරණය කරලා තිබුණා කපු රෙදි වලින් මැසූ එක වගේ සිවුරු ටිකක් පූජා කරමු කියලා. ඒ මහත්තයත් නායක හාමුදුරුවන් බලන්න ආවේ ඒ වගේ සිවුරක් අරගෙන. ඒ වගේම සිංහල අවුරුදු කාලෙට නායක හාමුදුරුවන්ට වඩා වැඩි මහල් හාමුදුරුවරු බැලීමට යාමේ සිරිතක් තිබුණා. අපවත් වූ ගෝනපොල පන්සලේ නායක හාමුදුරුවෝ, ඔලකොටුවේ ධම්මානන්ද ලොකු හාමුදුරුවෝ දිනක් උන්වහන්සේ බැලීමට යෑමට සූදානම් වෙලා ලොකු මාමයිට් එකකුයි, ක්‍රීම් ක්‍රැකර් බිස්කට් එකකුයි, එක පාර්සලයකට ගත්තා. මේ වගේම එකක් ඍතික් නායක හාමුදුරුවන්ටත් තිබුණොත් හොඳයි කීවා. ඉතිං ටික වෙලාවකින් අවුරුද්දට නායක හාමුදුරුවෝ බැලීමට

ආපු හාමුදුරු කෙනෙක් ගෙනාවේ එවැනිම පාර්සලයක්. නායක හාමුදුරුවන්ට තියෙනවා අවශ්‍ය දේ ලැබීමේ මහා වාසනාවක්.

තවත් විශේෂම කරුණක් තමයි නායක හාමුදුරුවන් ගේ තිබෙන ප්‍රාර්ථනාව. බොහෝ දෙනෙක් හිතන්නේ නායක හාමුදුරුවෝ ලොවිතුරා බුදුබව ප්‍රාර්ථනා කරන කෙනෙක් කියලයි. නමුත් නායක හාමුදුරුවන්ගේ ප්‍රාර්ථනාව, අරමුණ වී තිබෙන්නේ කොහොම නමුත් මේ ජීවිතයේදීම මේ පංචස්කන්ධය අවසන් කර දැමීමටයි. උන්වහන්සේ උත්සාහ ගන්නේ ඒ සඳහායි. ඒ සඳහා තමයි මගේ මේ උත්සාහය කියලා නිතරම උන්වහන්සේ කියනවා. උන්වහන්සේ නිතරම ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමෙන්, වැඩිම කාලයක් ගත කරන්නේ ඒ වෙනුවෙන්.

**තවත් නායක හාමුදුරුවන්ගේ විශේෂ දෙයක් තමයි කෙනෙකුගේ තිබෙන අගුණවලට වඩා තියෙන එකම ගුණය හෝ සිහිපත් කිරීම හා සෙවීම**. අගුණ දහසක් තිබුණත් ඒ සියල්ල අයින් කරලා එකම ගුණයට සළකන්න උන්වහන්සේ උත්සාහ ගන්නවා. ඒ දවස්වල නායක හාමුදුරුවෝ පිට දාන වලටත් වඩින බව මා කලිනුත් කීවා. ඒ වැඩියාම නායක හාමුදුරුවෝ බණ කියන අවස්ථාවලදී නිතර කියන එකක් තමයි මේ ගිහි ගෙයින් වෙන් වෙලා මහණ වෙනවා කියන එකම මහා දුෂ්කර වැඩක් බව. ලෝකයේ වැඩි දෙනෙකුට ඒක කරන්න බෑ කියලත් උන්වහන්සේ කියනවා. ඒ නිසාම එයා ලෝකයාගේ පුද සත්කාර ලැබීමට සුදුස්සෙක් වෙනව කියලත් කියනවා. එහෙම කියන්නේ මේ සංඝයාගේ ගුණ පැහැදිළි කරල දෙන්නයි. ඒ වගේ අවස්ථාවල උන් වහන්සේ කියනවා තමන්ගේ වටිනා ලස්සන කෙස් ටික ගාලා ඉදීමත් පැවිද්දකුගේ විශේෂ ගුණයක් වශයෙන්. ගිහියෙකුට වඩා පැවිද්දකුගේ තියෙන ගුණ මේ වගේ සුළු කාරණා පවා අරගෙන විස්තර කොට කියනවා. ඔය භික්ෂූන්ට දුශ්ශීල කථා කියන අයටත් හොඳට තේරුම් යන විදිහට කරුණු කියලා දෙනවා. වෙන අය වගේ වෙනත් පැත්තකට බණ කියලා මිනිසුන් නොමඟ යැවීමක් නායක හාමුදුරුවන් කරන්නේ නැහැ. අගුණ කොච්චර තිබුණත් නායක හාමුදුරුවන් නිතර කරන්නේ තියෙන එකම ගුණය ඉස්මතු කොට කථා කිරීමයි. ඒක මහා සත් පුරුෂකමක්. නායක හාමුදුරුවන් ඒ ඒ අවස්ථාවල කියූ සමහර වැදගත් කාරණා ටිකක් දින වකවානු අනුවම මම ලියා ගෙන තියෙනවා.

**1985.02.03 දා**

"මට තවමත් පොත් ලියන්න පුළුවන්. කරගෙන යන භාවනා ආදියට බාධාවක් වන නිසා ඒකට ලෑස්ති වෙන්නේ නැහැ. මට වයස 88 ක් විතර වෙනවා."

**1986.04.13 දා**

"වෙන අයට වගේ මට මරණය ගැන ශෝකයක් බියක් ඇත්තේ නැහැ. මං එය සතුටින් පිළිගන්න ලෑස්ති වී ඉන්නේ.

**1988.05.03 දා**

"මගේ පොත් ලිවීමත්, භාවනාවත් දෙකම එකයි. පොත් ලීවෙත් මේ සියලු වැඩ කරන ගමන්. භාවනාවත් එහෙමයි. ඉඩ ලැබෙන හැම විටම භාවනාවත් කරනවා"

**1992.07.09 දා උදේ**

"ඊයේ රාත්‍රියේ මට දුක්ඛාය්‍යී සත්‍යය ගැන අවබෝධ වෙච්ච කාරණා පොතක් වශයෙන් ලීවොත් ඒක පිටු පන්දාහක් විතර වේවි".

**1993**

"මගේ ඇස් දෙක පේනව නම් මෙහෙම නිදා ගෙන වුණත් අනුන්ට පොත් කියා දීමෙන්, ධර්මය පැහැදිලි කර දීමෙන්, සේවයක් කරන්න පුළුවන්."


මෙතන දී මම විශේෂ දෙයක් කියන්නම්. නායක හාමුදුරුවන්ගේ ඇස් දෙක පෙනෙනවා නම් උන්වහන්සේගේ ශරීර සෞඛ්‍යය මීට වඩා හුඟක් වෙනස් වෙනවා. තවමත් උන්වහන්සේගේ අදහස තියෙන්නේ අනුන්ට සේවයක් කිරීමටයි. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වන ලක්ෂණ බොහොමයකින් සම්පූර්ණ වී ඇති ජීවිතයක් වශයෙන් මට මහා නායක හාමුදුරුවන් හඳුන්වා දෙන්න පුළුවන්. සංසාරය ගැන කළකිරිලා සසරින් එතර වීමට, දුකින් මිදීමට උත්සාහ දැරූ අතීත මහ යතිවරයන්ගේ උදාර චරිත සිහිපත් වෙනවා, මහා නායක හාමුදුරුවන් ගේ චරිතය දෙස බැලුවහම.

**මහා නායක හාමුදුරුවන්ගේ පොත පත කියවීමෙනුත්, වසර පහළොවක් වැනි දිගු කලක් අග්‍ර උපස්ථායකයා වශයෙන් දිවා රෑ දෙකේම ළඟම සිටීමෙනුත්, ඔය ඇත්තට කියන්න පුළුවන්ද රේරුකානේ චන්ද විමල මහා නායක හාමුදුරුවන් ආධ්‍යාත්මික වශයෙන් යම් විශේෂ තත්ත්වයකට පත්වෙලා සිටින උතුමෙකු කියලා.**

එහෙම සම්පූර්ණයෙන් ම කියන්න බැරි වුණත් නායක හාමුදුරුවෝ සාමාන්‍ය පුද්ගලයකු නොවන බව නම් මට විශ්වාසයි. මට ඒක එහෙම කියන්නත් පුළුවන්. උන්වහන්සේ ඉතාම දුර්වල වෙලා, ලෙඩ වෙලා ඉන්න අවස්ථාවල දී උන්වහන්සේගේ සිත විමසා බැලීමට මාත් සෑම උත්සාහයක්ම ගත්තා. ගන්නවා. ඇහැ ඔපරේෂන් කරලා ඉන් පසුව ආහාර ගන්නත් බැරුව නායක හාමුදුරුවෝ බරපතල අපහසුතාවයකට පත් වුණා. මට මතකයි ඒ හේතුවෙන් වෙන වෙන රෝගත් හැදුණා. හුඟක් අමාරු වුණා. මං ඒ වගේ අවස්ථා වලදී නායක හාමුදුරුවන්ගෙන් විමසුවා කොහොම ද නායක හාමුදුරුවනේ කියලා. උන්වහන්සේ ප්‍රකාශ කළේ ධම්මානන්ද මං එබඳු බොහෝ අවස්ථාවල දී නිවනට සිත යොමු කර ගන්නවා කියලයි.

**උප්පාදෝ භයං - අනුප්පාදෝ ඛේමං**
**උප්පාදෝ දුක්ඛං - අනුප්පාදෝ සුඛං**

ඔය වචන තමයි උන්වහන්සේ ඒ වෙලාවට කියන්නේ. ඉපදීම බයක්. නූපදීම තමයි ශාන්තිය. භය නැති බව. එබඳු දුර්වල අවස්ථා වලත් අන්න ඒ වගේ සිතුවිලි තමයි උන්වහන්සේගේ සිතට එන්නේ. ඉතින් එබඳු අවස්ථාවලදීත් නිරෝධයට නිවනට සිත යොමු කර ගැනීම විශේෂ පුද්ගලයකුගේ ලක්ෂණයක් නේද ? නායක හාමුදුරුවෝ නිතර කියනවා මං මේ පින් දහම් කරන්නේ අනාගත ඵලයක් බලාපාරොත්තුවෙන් නොවන බව. මට එහෙම මුකුත් ප්‍රාර්ථනාවක් නැහැ කියලා. ඒ කියන එකේ තේරුම පින් පව්වල විපාක පිළිබඳව නොවෙයි, උන්වහන්සේගේ එකම බලාපොරොත්තුව මේ භවයේදීම සංසාරය කෙළවර කර ගැනීමයි. ඒ වගේ කෙනෙකුට යම් විශේෂ තත්ත්වයක් නෑ කියලා කියන එකත් අමාරුයි. පැහැදිළිව මට කියලත් නෑ. එහෙම කියන්නෙත් නැතේ. නමුත් මට එහෙම හිතෙනවා. දැන් අවුරුදු හතක් අටක් විතර මේ දුර්වලතාවයෙන්මයි නායක හාමුදුරුවන් ඉන්නේ. ඒ නිසා සිතිවිලිවල විශාල වෙනසක් ඇති



**සියවස අබියස . . .**

වෙන්න ඕනෑ නේද ? නමුත් එහෙම බවක් පෙනෙන්නට නැහැ. අවුරුදු දෙකකට විතර කලින් දවසක් අංශබාග රෝගයට එන්න වගේ තිබුණා. දවසක් උදේ නමයට විතර කට පැත්තට ඇදවෙලා කථා කර ගන්න බැරිව වගේ අපහසුතාවක් ඇති වුණා. නායක හාමුදුරුවෝ මට කියා තිබෙනවා ඒ වගේ තත්ත්වයක් ඇති වුණොත් කලබල වෙන්නත් එපා, එකවරම බෙහෙත් කරන්න සූදානම් වෙන්නත් එපා කියලා. ඒ දේ වෙන්න ඉඩ දෙන්න කියලයි මට කියලා තියෙන්නේ. ඒ නිසා එදා මං අමුතු බෙහෙතක් නොදී කලබල නොවී උණු වතුර

ටිකක් අරගෙන, ඉඟුරු ටිකක් අරගෙන සුළු දෙයක් විතරක් කළා අන්න එදා ඉඳලා යමක් ඉක්මනට ඕන ගතිය නැතිනම් ඉක්මනට අමතක වන ස්වභාවය වගේ දෙයක් තියෙනවා. නමුත් ප්‍රකටව පෙනෙන වෙනසක් නම් නැහැ.

නායක හාමුදුරුවන්ගේ පොත් වලින් මේ රටට සිදු වූ සේවය අති විශාලයි. ඒ පොත් නිසා සිදු වූ සේවය ගැන මට ලැබුණු අත්දැකීම් කිහිපයක් මං මෙතන දී කියන්නම්. මේ පොත් නිසා විශාල පිරිසක් ධර්මාලෝකය ලබා ගෙන තිබෙනවා. එන යන අයගෙනුත්, එක එක්කෙනා එවන ලියුම් වලිනුත් මේ කාරණය හොඳට පැහැදිලි වෙනවා. නොමඟට ගිය සෑහෙන පිරිසක් සුමඟට හැරිලා තියෙනවා. මගේ අත් දැකීමෙන් මට එය කියන්න පුළුවන්. දවසක් මාතර පැත්තේ මහත්මයෙක් ඇවිදින් නායක හාමුදුරුවන් මුණ ගැහිලා වැන්දා. නායක හාමුදුරුවෝ ඇහුවා කවුද කියලා. ඒකට එයා උත්තරයක් දුන්නේ නැහැ. උත්තර නොදී එයා කිව්වා, නායක හාමුදුරුවනේ, මං ඉස්සර සවුත්තු මිනිහෙක්. ඔබ වහන්සේ නිසා, ඔබ වහන්සේගේ පොත් නිසා මං මිනිහෙක් වුණා. මං එයාගේ නම කියන්නේ නැහැ. ඒක මගේ එක අත්දැකීමක්. තවත් එකක් කියන්නම්. එයා අද කොළඹ ලොකු මුදලාලි කෙනෙක්. කලකට පෙර එයා භයානක දෙයක් කරන්න අර අදිමින් ඉඳලා එයාගේම මාමණ්ඩිගේ පොත් සාප්පුවට ගිහින් තියෙනවා. ඩ්‍රයිවර්ට කාර් එක අරන් එන්න කියලා එහාට මෙහාට ඇවිදින අතරෙයි මේ පොත් සාප්පුවට ගොඩ වුණේ. පොත් සාප්පුවේ තියෙන පොතක් අරගෙන ඒක පෙරළලා බලන විට එයාට පෙනුණ මේකේ මේ ලියලා තියෙන්නේ තමන් කරන්නට යන භයානක අපරාධය ගැනයි කියලා. එක පාරටම ඔහුගේ සිත වෙනස් වුණා. වෙනස් වෙලා ඒ පොතත් අරගෙන ගියා කාමරයට. ගිහින් දොරත් වහගෙන පොත සම්පූර්ණයෙන් ම කියවා අවසන් කළා. පොත කියවා අවසන් වෙන කොට අර කලින් තිබුණු ඔක්කෝම අදහස් වෙනස් වෙලා. ඒ වෙන කොට කලිසම් කමිස ඇන්ද ඔහු ජාතික ඇඳුම අඳින්න පටන් ගත්තා. ඔහු කිව්වා රේරුකානේ නායක හාමුදුරුවෝ නැතිනම් අද මා ජීවතුන් අතර නැහැ කියලා. එතකොට නොමඟට යන්න ගිය කෙනෙක් නායක හාමුදුරුවන්ගේ චතුරාර්ය සත්‍යය පොත නිසා සුමඟට හැරුණා.

මං එක දවසක් අම්මා බලන්න ගමට යන කොට මං ගිය බස් එකේ ඉස්සරහ සීට් එකේ පොඩි හාමුදුරුවරු දෙනමක් වාඩි වෙලා හිටියා. ඒනිසා මං දෙවන සීට් එකට ගියා. බස් නැවතුම් පලක නතර කළාම අර එක හාමුදුරු නමක් එක්ක මං කථා කළා. කොහේද වැඩ ඉන්නේ කියලත් මං ඇහුවා. එතකොට කීවා ලුණුගල කියන ගමේ පන්සලේ කියලා. මගෙන් ඇහුවා මං කොහේ ද ඉන්නේ කියලා. මං ඇහුවා ඔයා දන්නව ද රේරුකානේ නායක හාමුදුරුවන් ගැන ? මං මොකද දන්නේ නැත්තේ. රේරුකානේ නායක හාමුදුරුවෝ නිසයි මං අද ජීවත් වෙන්නේ කියලා ඒ ඇත්තා කීවා. මං ඇහුවා ඒ මොකද කියලා. "මං මගේ ගුරු හාමුදුරුවොත් එක්ක තරහ වෙලා මැරෙන්නම කියලා හිතාගෙන උපවාසයක් කළා. එහෙම කරන ගමන් මට හිතුණා නායක හාමුදුරුවන්ගේ චතුරාර්ය සත්‍යය කියන පොත බලන්න ඕනෑ කියලා බැලුවා. උපවාසය මං නතර කළා. මගේ අදහස් වෙනස් වුණා. අදත් මං මගේ ගුරු හාමුදුරුවන් සමඟ සමගියෙන් සතුටෙන් ඉන්නව කියලා, ඒ ඇත්තා කිව්වා. නොමඟට යන්නට සූදානම් වූ කෙනෙකු සුමඟට හැර වීමේ පුදුම ශක්තියක් මේ පොත් වල තියෙනවා.

කිරුළපනේ ඉන්නවා හොඳ නාවික ඉංජිනේරු මහත්මයෙක්. ලෝකයේ ම ගිහිල්ලා නාවික ඉංජිනේරු විද්‍යාව හොඳට ඉගෙන ගත්තු කෙනෙක්. ඒ වගේම ලෝකයේ කරන්න පුළුවන් බොහෝ දේවල් කරලා, කාලා, බීලා, නටලා සතුටු වෙච්ච කෙනෙක්. පසුව නායක හාමුදුරුන්ගේ පොත් පත් කියවන්න පටන් ගත්තා. දවසක් මෙහාට ඇවිදින් කීවා මට මගේ ජීවිතය මොකක් ද කියලා තේරුම් ගන්න බැරිවයි හිටියේ. රේරුකානේ නායක හාමුදුරුවන් ගේ පොත් කියවීමෙන් ජීවිතය කියන්නේ මොකක්ද කියලා තේරුම් ගත්ත බව ඔහු කීවා. ඒ මහත්මයා මේ ළඟදි හමු වෙලා මට විශේෂ කාරණයක් කිව්වා. "හාමුදුරුවනේ, මං ඉන්න පැත්තෙ ඉන්නවා මිනී මැරුම් කිහිපයකට සහභාගි වෙලා තුන් හතර සැරයක් හිරේ ගිහිල්ලා ආපු මනුස්සයෙක්. මිනිහා දිහා බැලුවහමත් බය හිතෙනවා. දවසක් මං සූවිසි මහ ගුණය කියන පොත කියව කියව ඉන්න කොට මේ මිනිහා මා ළඟට ඇවිදින් ඇහුවා "මහත්තයෝ මොකක් ද ඔය කියවන පොත කියලා. මේ බුද්ධාගමේ පොතක් කියවනවා කියලා මං කිව්වා. මටත් දෙන්න බැරිද මහත්තයෝ ඔය පොතක්. කතා කරන කොටත් බය හිතෙනවා. මේක ඉතින් දෙන්නත් අමාරුයි. කමක් නෑ ඉතින් දෙන්නම් කියල කීවා. මිනිහ පොත අරන් ගියා. මං ටිකක් හොයලත් බැලුවා

මේ පොත අරන් ගිහින් මිනිහ මොනව කරනවද කියලා. දවස් කිහිපයක් යන කොට මේ මිනිහ මේ පොත හය වරක් කියවලා අවසන් කරලා. දවසක් පොතත් අරගෙන ඇවිත් මිනිහ කියනවා මහත්තයෝ මෙව්වා දන්නවා නම් අපි මෙහෙම විනාශ වෙනවද ? මේ වගේ අමනුස්සකම් කරනවද කියලා. ඒ විතරක් නෙමෙයි ඒ මනුස්සයා ඉන් පස්සේ ඒ මහත්තයටත් උපදෙස් දෙන්න පටන් ගත්ත කියලා එයා මට කීවා. ඕක විශේෂම කාරණයක්. නොමඟට හැරිච්ච බොහෝ දෙනා මේ පොත් කියවීමෙන් සුමඟට හැරිච්ච අවස්ථා තවත් බොහෝ තියෙනවා.

තවත් එක් කාරණයක් තමයි මේ පොත් කියවීම නිසා ශ්‍රද්ධාව නැති අයගේ ශ්‍රද්ධාව වැඩි දියුණු වීම. ඒ වගේ අය හරියට ලියුම් එවා තිබෙනවා. සමහර දෙනා තමන්ගේ ශ්‍රද්ධාව වැඩි දියුණු වීම නිසා ගිහි ජීවිතය අත් හැරලා පැවිදි වෙච්ච අවස්ථාත් තියෙනවා. **පාතදුරේ අරියධම්ම හිමියන්ගේ** පැවිද්දටත් නායක හාමුදුරුවන්ගේ මේ පොත් විශාල වශයෙන් හේතු වුණා.

ඒ විතරක් නෙමෙයි මේ රටේ අද වැඩ ඉන්න ධර්ම කථිකයන් වහන්සේලාත් නායක හාමුදුරුවන්ගේ පොත් වලින් ලැබුණු මහත් ප්‍රයෝජනය ගැන මෙහාට පැමිණිලාම ප්‍රකාශ කරන අවස්ථා තියෙනවා. **කොටුගොඩ ධම්මාවාස අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, මාදුළුවාවේ සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ,ආචාර්ය හොරණ වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** වැනි දැන උගත් දේශකයන් වහන්සේලා බොහෝ අවස්ථාවල නායක හාමුදුරුවන්ගේ පොත් ගැන වර්ණනා කරනවා.

අවුරුදු දහයකට විතර කලින් දවසක් **ජයන්ත කැලේගම** කියන මහාචාර්යතුමා මෙහාට ආවා. එයා ඇවිත් කීවා "මං ස්විට්සර්ලන්තයට යන්න සූදානම් වෙලා එහේ ගිහිල්ලා දහම් පොත් පත් ටිකක් කියෙව්වොත් හොඳයි කියලා හිතාගෙන කියවන්න සුදුසු දහම් පොත් පත් මොනවා ද කියලා විමසීමට **යක්කඩුවේ නායක හාමුදුරුවන්** ළඟට ගියා කියලා. "ගිහිල්ලා ඇහුවා හාමුදුරුවනේ අපටත් දැන් බුද්ධාගම ගැන ඉගෙන ගත්තොත් හොඳයි. ඒ සඳහා කාගේ පොත් පත් කියෙව්වොත් හොඳ ද කියලා. "මහත්තයෝ පොත් නම් තියෙනවා.

නමුත් කියන්න බයයි. එක තැනක් තියෙනවා එතන කියන්න බය නැහැ. එතන තමයි පොකුණුවිට. රේරුකානේ මහා නායක හාමුදුරුවන්ගේ පොත් කියවන්න කියලා කිව්වා. ඉතින් ඒකත් අහගෙන එන ගමන් ඒ මහත්තයා **මහාචාර්ය වල්පොල රාහුල** හාමුදුරුවන් ළඟටත් ගිහින් තියෙනවා. උන් වහන්සේ ගෙනුත් විමසුවාම උන්වහන්සේත් ඒ වගේම ප්‍රකාශ කළ බව ඒ මහත්මයා කිව්වා. ඊට පස්සේ **අකුරුටියේ අමරවංශ නායක** හාමුදුරුවන් ළඟටත් ගිහින් විමසූ බව කීවා. ඒ නායක හාමුදුරුවොත් කීවේ කලින් හාමුදුරුවරු කියපු දේමයි. මෙච්චර මහා පඬිවරු වර්ණනා කරන මේ හාමුදුරුවන් දකින්න යන්නම ඕනෑ කියලා තීරණය කරලා මෙහාට ආ බව **කැලේගම මහත්මයා** කීවා. ඇවිත් කථා බහ කරලා පොත් ටිකක් අරගෙන ගියා. මං මේ කියන්නේ මේ රටේ මහා පඬිවරු නායක හාමුදුරුවන්ගේ මේ පොත් ගැන වර්ණනා කරන හැටි. මං දවසක් ගියා මාවිත්තර පන්සලේ බණකට. එදා මට මුණ ගැසුණා **වේඩරුවේ අනෝමදස්සි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ**. උන්වහන්සේ ඇහුවා මං කොහේද ඉන්නේ කියලා. මං ඉන්නේ පොකුණුවිට රේරුකානේ චන්දවිමල නායක හාමුදුරුවන් ලඟ බව කීවා. එතන්දී උන්වහන්සේ මට කීවා මං මේ දවස්වල රේරුකානේ චන්දවිමල නායක හාමුදුරුවන්ගේ විදර්ශනා භාවනා ක්‍රමය කියන පොත කියවමින් තමයි ඉන්නේ කියලා. ඒක හරි වටිනා පොතක් බව උන්වහන්සේ කීවා. මං මෙච්චර දුරට කීවේ නායක හාමුදුරුවන්ගේ පොත් වලින් කෙරුණු සේවය පිළිබඳව මගේ අත්දැකීම් ටිකක්. නායක හාමුදුරුවන්ගේ පොත්වලින් මේ රටේ භික්ෂූන් වහන්සේලාටත් ගිහි බෞද්ධ ජනතාවටත් සිදු වූ සේවය වචන වලින් විස්තර කරන්න පුළුවන් එකක් නෙමේ.

නායක හාමුදුරුවන් බලන්න නොයෙක් දෙනා එනවා. ඒ එන අය නොයෙක් දේවල් මගෙන් විමසනව. නායක හාමුදුරුවන්ට අවශ්‍ය දේත් නිතර නිතර විමසනවා. ඇත්තෙන්ම නායක හාමුදුරුවන්ට අවශ්‍ය දෙයක් නැහැ. කියන්න දේකුත් නැහැ. ඔය තියන ආවාස ගේ දාන ශාලාව අළුත්වැඩියා කළේ නායක හාමුදුරුවන් බලන්න එන යන අයගේ ආධාර උපකාර වලින්. නායක හාමුදුරුවන්ට මොනවද ඕනෑ කරන්නේ කියලා අහන අයට උන්වහන්සේට විශේෂ දෙයක් අවශ්‍ය නැත. කැමති නම් මේ පිංකමට සහභාගි වන ලෙස කියනවා. එහෙම තමයි ආවාස ගේත්, දාන ශාලාවත් ලක්ෂ දෙකහමාරක පමණ වියදමකින් මාස 5 ක් ඇතුළත ප්‍රතිසංස්කරණය වුණේ. මේ දුර්වල

තත්වයෙන් වැඩ ඉන්න මහා නායක හාමුදුරුවන්ගෙන් මං ඇහුවා මේ දිරාපත්ව ඇති අවාස ගෙයත්, දාන ශාලාවත් හදන්න ද කියලා. එතෙන්දි නායක හාමුදුරුවන් කීවේ කෝ ඉතින් ඕව හදන්න අපට සල්ලි කියලා. වැඩ අවසන් වූ බව කීවාම උන්වහන්සේත් සතුටු වුණා.

දැන් මේ අළුතින් හදන ධර්ම ශාලාව ගැන බලමු. දැනට මේ ගොඩනැගිල්ලට රුපියල් විසිපත් ලක්ෂයක් විතර වියදම් වෙලා තියෙනවා. මේ වගේ වැඩක් මේ ගමේ දායක දායිකාවන්ට පමණක් කරන්න අමාරුයි. මහානායක හාමුදුරුවන් බලන්න එන අයගෙනුත් හුඟාක් ආධාර ලැබෙනවා. මේ අළුත් ධර්ම ශාලාව හැදීමට මුලින්ම අදහසක් ඉදිරිපත් කළේ **හේන්ගොඩ කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවෝ**. ඒකටත් විශේෂ කාරණයක් යෙදුණා. වසර කිපයකට පෙර මේ පන්සලේ දහම් පාසැලේ තෑගි බෙදා දීමේ උත්සවයක් තිබුණා. ඒ උත්සවය තිබුණේ පර පරණ ධර්ම ශලාවේ. එදා ආව සෙනඟට ඒ ශාලාව කොහෙත්ම ඉඩකඩ ප්‍රමාණවත් වුණේ නැහැ. එතෙන්දි තමයි කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවන් අදහසක් ඉදිරිපත් කළේ, ඒ පරණ ශාලාවම ටිකක් ලොකු කරමු කියලා. නමුත් ගෘහ නිර්මාණ ශිල්පීන් උපදෙස් දුන්නා ඒ වැඩේ එච්චර සාර්ථක වැඩක් නෙමෙයි කියලා. අන්තිමට තීරණය වුණා අළුත් ධර්ම ශාලාවක් හදමු කියලා. මේ අළුත් ධර්ම ශාලාවට ප්ලෑන සකස් කළේ මහා නායක හාමුදුරුවන්ට ඉතාම හිතවත් බත්තරමුල්ලේ උපසේන කියන ඉංජිනේරු මහත්තයයි. එයාම තමයි මේ අළුත් ධර්ම ශාලාව **ශ්‍රී චන්දවිමල සද්ධර්ම සාගර ශාලාව**". කියල නම් කළේ. උපසේන මහත්මයා හරිම ශ්‍රද්ධාවන්ත කෙනෙක්. ඒ මිසක් මේ අළුත් ශාලාව මහානායක හාමුදුරුවන්ගේ අදහසක් අනුව කෙරෙන එකක් නෙවෙයි. නමුත් උන්වහන්සේත් මේ ගැන සතුටු වන බව මා දන්නවා. මේ ධර්මශාලාවේ වැඩ ඉක්මණින් අවසන් වෙනවා දකින්නත් උන්වහන්සේට ඕනෑකම තියෙනවා.

**මහානායක හාමුදුරුවන් ලෙඩ රෝග වලට ප්‍රතිකාර ගැනීමේ යම්කිසි විශේෂත්වයක් තියෙනවාද ?**

කොහොම වුණත් නායක හාමුදුරුවන් බෙහෙත් හේත් ගැනීම අඩුයි. සාමාන්‍ය සුළු අසනීපයකට උන්වහන්සේම දන්නා බෙහෙත් තමයි බොහෝ විට ගන්නේ. වෙද පොත් කියවීම නිසා ඒ ගැන හොඳ දැනුමකුත් උන්වහන්සේට තියෙනවා. ජ්‍යොතිර් විද්‍යාවත් දන්නවා.

නායක හාමුදුරුවන්ගේ ධාරණ ශක්තිය පුදුම එලවන සුළුයි. උන්වහන්සේට අමුතුවෙන් පාඩම් කිරීමක් අවශ්‍ය වන්නේ ම නැහැ. පොත් කියවගෙන යන විට ඒක උන්වහන්සේට කට පාඩම් හිටිනව. ඒ නිසා පොත්පත් කියවීමෙන් උන්වහන්සේට බෙහෙත් හේත් ගැනත් හොඳට මතක තියෙනවා. ටිකක් අමාරු ලෙඩක් හැදුනොත් විතරයි වෛද්‍යවරයකු සොයා ගෙන ගිහින් බෙහෙත් ගත්තේ. මුල් කාලයේ බෙහෙත් ගන්න තරමට ලෙඩක් දුකක් උන්වහන්සේට හට ගත්තේම නැහැ. දැන් තමයි ඉතින් ඔය එක එක බෙහෙත් පාවිච්චි කරන්නේ. ඒකටත් හේතුවක් තියෙනවා. මහා නායක හාමුදුරුවන්ගේ පොත් පත් කියවූ වෛද්‍යවරු බොහෝ විට උන්වහන්සේ බලන්නත් එනවා. ඇවිත් උන්වහන්සේව දැකලා බලලා ඊළඟට ශාරීරික තත්ත්වයත් පරීක්ෂා කරලා බලනවා. ඒ අනුව යම් යම් බේත් නියම කරනවා. නියම කරනවා විතරක් නෙමෙයි ඒ බේත් ඒ අයම ගෙනත් දෙනවා. මොරටුවේ ඉන්නවා **නානායක්කාර** කියලා දොස්තර මහත්තයෙක්. මාසයකට හතර පස් වතාවක් නායක හාමුදුරුවන් බලන්න එනවා. නායක හාමුදුරුවන් පරීක්ෂා කරලා බලලා අවශ්‍ය බේත් සියල්ල ගෙනත් දෙනවා. මට තියෙන්නේ ඒවා නියම වෙලාවට නියම ආකාරයට දෙන එක විතරයි. මං හිතන්නේ මේකත් නායක හාමුදුරුවන්ගේ පොත් වලින් වෙච්ච විශාල සේවයක් කියලා.

**මේ තරමට දුර්වල වෙන්න ඉස්සර වෙලා මහා නායක හාමුදුරුවන් නිතර නිතර කතා කරන්නේ මොන වගේ දේවල් ගැනද ?**

ඒ ගැනත් විශේෂ දෙයක් කියන්න පුළුවන්. මහා නායක හාමුදුරුවන් බලන්න එන සමහර දෙනා සමඟ හුඟාක් වෙලා කතා කර කර ඉන්න අවස්ථා තියෙනවා. සමහර අය එක්ක ඉක්මනින් කථා කරලා අවසන් කරනවා. තවත් සමහර අය සමඟ කතා කරන්නේ වචනයක් දෙකක් විතරයි. කිසිම ධර්ම කාරණයක් ගැන කතා කරන්නේ නැහැ. ධර්මය ගැන ආශාවෙන් ධර්මය දැන ගැනීම සඳහා ම කෙනෙක් ආවොත් ඕනෑ තරම් වෙලාවක් කතා කරමින් ඉන්නවා. සමහරු නිකන් ඇවිදින් බලෙන් වගේ ධර්මය ගැන කතා කරන්න සූදානම් වෙනවා. නමුත් එබඳු අවස්ථා වලදී නායක හාමුදුරුවන් ධර්මය ගැන වචනයක්වත් කතා කරන්නේ නැහැ. ධර්මය වුවත් හැම විටකම හැම දෙනා සමඟම කතා කරන්න උන්වහන්සේ එච්චර කැමැත්තක් දක්වන්නෙ නැහැ. රාත්‍රියේ බුදුන් වැඳලා, වත පිරිත

කියලා අවසන් වෙලා මෙහේ ඉන්න හාමුදුරුවරු කවුරුත් වගේ මහා නායක හාමුදුරුවන් හමු වීමට ගොස් වදිනවා. ඒ වෙලාවේ දී සිනා මුසු මුහුණින් බොහොම සුහදව වචන කීපයක් කතා කරනවා. එන යන කා සමඟ වුවත් ඉතාම සුහදව සිනා මුසු මුහුණින් වචන කීපයක් හෝ කතා කිරීම නායක හාමුදුරුවන්ගේ සිරිතක්. මහා නායක හාමුදුරුවන්ට හැම විටම තියෙන්නේ සිනා මුසු මුහුණක්. අසනීපයකින් පෙළෙන අවස්ථාවක දී පවා මේ සිනා මුසු මුහුණ වෙනස් වන්නේ නැහැ. හැම විටකම එසේ සිනා මුසු මුහුණින් කතා කිරීමට පුළුවන් වන්නේ අභ්‍යන්තරය ඉතාම පිරිසිදුව හොඳින් පවතින නිසා බවයි මගේ හැඟීම. හොඳින් ඇස් පෙනෙන කාලයේදීත්, මහා නායක හාමුදුරුවන් බලන්න එන හැම දෙනාම වගේ කියන දෙයක් තමයි මහා නායක හාමුදුරුවන් දිහා බලාගෙන ඉන්න ආශා හිතෙනවා කියලා. මොකද ඒ තරමට ලස්සන සිනා මුසු මුහුණක් ප්‍රියංකර මුහුණක් උන්වහන්සේට තියෙන්නේ. මේ ප්‍රදේශයේ වැඩ සිටින සියළුම භික්ෂූන් වහන්සේලා මහා නායක හාමුදුරුවන්ට දක්වන්නේ පුදුම විදියේ ගෞරවයක්, ආදරයක්. කවදාවත් කාගේවත් හිත රිදෙන විදිහේ කතාවක් බහක් හැසිරීමක් මහා නායක හාමුදුරුවන්ගේ නැහැ.

**ගෝල බාලයන් ගැන, දායක දායිකාවන් ගැන, හෝ වෙනත් අය ගැන විශේෂ වශයෙන් කතා බහා කිරීමක් නායක හාමුදුරුවන් තුළ තියෙනවද ?**

කවුරු ආවත් ගියත් විශේෂ ඇල්මකින් කතා බහ කරන බවකුත් පේන්න නැහැ. දැන් ඔය හේනේගම කල්‍යාණසිරි ලොකු හාමුදුරුවන් වගේ කෙනෙක් ඇවිත් දැකලා බලලා කතා කරලා ගියාම සමහර විට අහනවා කොහොමද ඒ ඇත්තට. සනීපයෙන් ඉන්නවද ? විශේෂ අවශ්‍යතාවක් සඳහා ද ආවේ කියලා.

මගේ මෙහාට පැමිණීම ගැන කලින් මං කීවානේ. කලින් මං ලිපියක් මෙහාට එවලා ඇහුවා නම් එන්න ද කියලා, ඒ ලිපියේම අනිත් පැත්තේ ලියා එවනවා එන්න එපා කියලා. කලින් මෙහාට ඇවිත් බැලුව නම් බලාපොරොත්තු වන තත්ත්වයකින් මෙහේ ඉන්න බැහැ කියලත් මට හිතෙනවා. මං මහණ වූ පන්සල මෙහාට වඩා හුඟක් නිහඬයි. විවේකයි. මෙහාට කොච්චරවත් සෙනඟ එනවා. විවේකයක් ඇත්තේම නැහැ. නමුත් වෙන්න තියෙන ක්‍රමය තමයි මේ. "කවදාවත්

දැකලා කතා කරලා කිසිම දැන ඇඳුනුමක් නැති තැනකටයි මේ යන්නේ. නමුත් මං ඒ අයට කිව්වේ මේ ගමන යන්න තියෙන ගමනක්, මේක යන්නේ මේ විදියටයි කියලා". මේ විදිහට ආවේ නැත්නම් අද මට මෙහෙම ඉන්න වෙන්නෙත් නැහැ. ඒ අනුව මං හිතන්නේ මේක සංසාර පුරුද්දක් වෙන්න ඇතියි කියලා. මං වගේම මහා නායක හාමුදුරුවන්ගේ පොත් පත කියවපු විශාල පිරිසක් ඉන්නවා. ඇත්තම කියනව නම් අද මේ තියෙන තත්ත්වය අනුව එක දිගට පැය දෙකක් නිදා ගන්න මට කවදාවත් ලැබෙන්නේ නැහැ. මා කලින් සිටියේ අල්ලපු කාමරයේ. නමුත් මහා නායක හාමුදුරුවන්ගේ ඇස් දෙකම පේන්නේ නැතුව ගියාට පස්සේ මං මහා නායක හාමුදුරුවන්ගේ ඇඳ ළඟම පුංචි ඇඳක් තියාගෙන ඒ ළඟයි නිදා ගන්නේ. දැන් ඉතින් ඒ විදියටත් අවුරුදු හතක් විතර වෙනවා. නායක හාමුදුරුවන් වෙනුවෙන් මේ දවල් කරන වැඩ ටික ඔය විදියටම රාත්‍රියටත් කරන්න වෙනවා. ආහාර පාන ගැනීම හැර දවල් දවසට කරන වැඩ ටික එකක් වත් අඩු නැතුව රාත්‍රියටත් කරනවා. මූත්‍රා කරන්න ඕනෑ වෙනවා. වතුර ටිකක් ඕනෑ වෙනව. ඇහැ පිහන, කට පිහන රෙදි කෑල්ල නැතිවෙන වාරයක් පාසා රාත්‍රියේ මට කථා කරනවා. කවුරු හරි මහ රෑ ඇවිදින් අහගෙන හිටියොත් තේරුම් ගන්න පුළුවන් අප දෙන්නා කතා කර කර ඉන්න හැටි. එහෙම බැලුවාම මේක කෙනෙකුට එපා වෙන වැඩක් මහා ප්‍රශ්නයක්. නමුත් මට එපා වීමකුත් නැහැ. ප්‍රශ්නයකුත් නැහැ. සමහර විට මට හිත රිදෙන අවස්ථාවලුත් තියෙනවා. ඒ වගේ අවස්ථාවල දී මං කියනවා නායක හාමුදුරුවනේ දැන් මහා රෑ, මට නිදි මතයි කියලා. සමහර විට අපි දෙන්නා රණ්ඩු වෙන අවස්ථාවලුත් තියෙනවා. හැබැයි ඒවා තරහ නැති රණ්ඩු. ඇත්තෙන්ම මේක මගේ සංසාර පුරුද්දක් කියලයි මං හිතන්නේ. කොහොම වුණත් මට කියන්න තියෙන්නේ මේ වසර පහළොහක් පමණ කාලය තුළ නායක හාමුදුරුවන්ට උපස්ථාන කිරීම නිසා කවදාවත් මගේ හිතේ කළකිරීමට හේතුවන කිසිම දෙයක් සිදු නොවූ බවයි. කාටවත් මොන ලෙසකින්වත් හිත කළකිරවා ගැනීමට හේතු වන දෙයක් උන්වහන්ස් ගේ ජීවිතය තුළ නෑ කියන එකයි.

නායක හාමුදුරුවෝ යන්න එන්න බැරිව ඇස් නොපෙනී දුර්වලව එක තැනක සිටියත් කළ හැකි කළයුතු හැම දෙයක්ම අවසාන මොහොත දක්වා කිරීමට උත්සාහ ගැනීම කැපී පෙනෙන ලක්ෂණයක්. 'මං දැන් බොහොම දුර්වලයි. ඕව මට දැන් ඕනෑ නැති

වැඩ' කියා මන්දෝත්සාහී ගතියක් උන්වහන්සේ තුළ නැහැ. යමක් දැන ගන්න ඕනෑ වුණොත් දැනුත් පොත් පත් කියවා ගන්නවා. දැනුත් කවුරු හරි ඉගෙන ගන්න කැමති නම් ඉගැන්වීමත් කරනවා. මේ දිනවල කුකුල්පනේ සුදස්සි හිමියන්ට ත්‍රිපිටකය ඉගැන්වීම කරනවා. ඇහෙන්න පොත් කීවාම පැහැදිලි කරලා දෙනවා. විහාරස්ථානයේ සිටින අයගේ සුව දුක් සොයා බැලීම අවශ්‍ය වූ විට උපකාර කිරීම අදත් උන්වහන්සේ කරනවා.

මහානායක හාමුදුරුවන්ගේ අනෙක් පැවිදි ශිෂ්‍ය පිරිස ගැනත් මම මේ වේලාවේ ම සඳහන් කළොත් හොඳයි කියලා මට හිතෙනවා.

මරදානේ සුදු වැල්ලේ විනයාලංකාරාරාමාධිපති හේනේගම කල්‍යාණසිරි ලොකු හාමුදුරුවෝ, බොල්ගොඩ බෝධිරුක්ඛාරාමාධිපති කල්ඵළියේ සුමංගල ලොකු හාමුදුරුවෝ, පොකුණුවිට විනයාලංකාරාරාමවාසී ගැලණිගම කෝවිද ලොකු හාමුදුරුවෝ, ඒවගේම අපේ හේන්ගොඩ කල්‍යාණධම්ම ලොකු හාමුදුරුවෝ*. කලකට පෙර අපවත් වූ ගොඩිගමුවේ සෝරත හාමුදුරුවොත් මහා නායක හාමුදුරුවන්ගේ ශිෂ්‍යයෙක්.

* මීට තෙමසකට පෙර අපවත්විය.

# අවසන් කටයුතු . . .

12

**මහානායක හාමුදුරුවන් අපවත්වීමෙන් පසුව මෘත ශරීරය පිළිබඳ අවසාන කටයුතු සිදු කළ යුතු ආකාරය ගැන මුලින්ම ලියා ඇති බවක් මට දැන ගන්නට ලැබුණා.**

**ඒක ඇත්තද මහා නායක හාමුදුරුවනේ ?**

සම්පූර්ණ ඇත්ත තමයි. අන්න අප දැන් ආවේ ඉතාම හොඳ තැනකටයි. (ළඟම හිටිය "අග්‍ර උපස්ථායක ධම්මානන්ද ආයුෂ්මතුනට මහා නායක හාමුදුරුවන්ගෙන් අණක් ලැබුණි)

"ධම්මානන්ද, අර මං ලියා අත්සන් කොට ඇති ලිපිය ගේන්න. (ධම්මානන්ද ආයුෂ්මතුන් ඒ කුඩා ලිපිය ගෙනත් මා අත තැබීය.)

1981 ජනවාරි මස 10 වන දින අතිගරු මහා නායක මා හිමියන් වහන්සේගේ අත්සන් යොදා සීල් තබා ඇති ඒ කුඩා ලිපිය එක පිටුවකට සීමා වී ඇත. ලිපිය ආරම්භ කොට ඇත්තේ "**මරණං නියතං**" යන ප්‍රසිද්ධ දේශනා පාඨයෙනි.

ශිෂ්‍ය - දායක මිත්‍ර යන හැම දෙනාටම මේ ලිපියෙන් ආමන්ත්‍රණය කොට තිබේ. හැම දෙනාටම මෙහි ඇති කාරණා නිවේදනය කොට තිබේ. 84 වන වියේ දී ලියා අත්සන් කොට ඇති ඒ ලිපියෙන් තව ජීවත් වීමට ඇත්තේ මඳ කලක් බවත්, මරණයෙන් පසුව තමන් වහන්සේගේ කය පිළිබඳ ක්‍රියා කළ යුතු ආකාරයත් එහි සඳහන් කොට තිබේ.

"මරණ දැන්වීම් එපා.

මරණය ප්‍රසිද්ධ කරන්න එපා.

කොඩියක්වත් දාන්න එපා.

කිසිම සැරසිල්ලක් එපා.

මිනිය දැනට දහවල් කාලයේ ගත කරන කුඩා ඇඳ මත තබන්න.

මිනිය සමීපයෙහි පහන් කීපයක් දල්වන්න.


පන්සල් වත්තේ අයිනක දර සෑයක් තනන්න.

දර සෑය හදා අවසන් වූ විගස උදේ හෝ දවල් හෝ රෑ හෝ මිනිය එහි තබා පුච්චන්න.

මිනිය සෑයේ තැබීමට ගෙන යා යුත්තේ ලෑලි තට්ටුවක තබා ගෙනයි.

සෑය හදා අවසන් කළ වෙලාව පුච්චන වෙලාවයි.

ආදාහනය අවසන් වීමෙන් පසුව එය නියම කර තිබූ පරිදි කළ බව කියා පුවත් පත් වලින් ප්‍රසිද්ධ කරන්න.



**ඇයි මහා නායක හාමුදුරුවනේ, අවසන් කටයුතු කිරීම ගැන මේ විදියට කලින්ම ලියා තැබුවේ. උපහාර පූජාවක් වශයෙන් ආදාහන කටයුතු කිරීම නුසුදුසුද ?**

ආදාහන පූජාවක් වශයෙන් කරනව නම් පිදිය යුත්තෙකුට එය කළ යුතුයි. බුදු හාමුදුරුවන් පිදිය යුතු උතුමෙක්. ඒ නිසා බුද්ධ ශරීරයට එවැනි පූජාවක් කළ යුතුයි. පසේ බුදුවරු පිදිය යුත්තෝ. ඒ නිසා ඒ උතුමන්ට කරන පූජාවන් ඉතාම හොඳයි. රහතන් වහන්සේලාත් පිදිය යුත්තෝ. උන්වහන්සේලාට කරන පූජාවන් සුදුසුයි. නමුත් මගේ ශරීරයට ඒ වගේ පූජාවක් කිරීමට තරම් මං මොන සුදුස්සෙක්ද ? ජීවත්ව සිටින තාක් සැළකීම හොඳයි. නමුත් මළාම මේ ශරීරයට මේ විදියට පුද පූජා පැවැත් විය යුතුද ? මට නම් හිතෙන්නේ මේක නුසුදුසුයි කියලා.

කවුරු නමුත් මළාම මළ මිනිය ගෙවල් වලින් ඉවත් කරන්නේ ගේ සුද්ද කර ගන්න නේද ? ගෙයි කුණු ගොඩක් තබාගෙන ඉඳීම හොඳ නෑ කියලයි ඒක කරන්නේ. කුණු ගොඩ අයින් කරලා ගේ සුද්ද කර ගන්නයි හැම දෙනාම හිතන්නේ. නැත්නම් ජීවත්ව ඉන්න අයට කරදරයක් වෙනවනේ. "**ගෙදර තියෙන කුණු ගොඩ සුද්ද කරන්න, ගෙදරින් ඉවත් කරන්න අමුතු උත්සවයක් අවශ්‍ය ද ?**